## 2021/04/06 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2021/04/06 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඬේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 27. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |

**01. ආගම සිහි කිරීම**

2021.04.06 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සියලු දෙනාගෙන්ම අවසරයි. සියලු දෙනාටම සුබ දවසක් සුබ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරමින්, අද දින සභා වාරය පවත්වන්න. මේ මොහොතේ පැමිණ සිටින මන්ත්‍රීවරුන් පිළිගැනීම යුතුකමක්. ඒ අනුව මේ අවස්ථාවේ පැමිණ සිටින. ගරු උපසභාපති ගාමිණී සුසන්ත මැතිතුමා ඇතුලු සියලු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා පිළිගන්නවා. මේ වන විට රටේ පවතින කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් දුරස්ථ භාවය රැකගෙන අපි මෙතෙක් කල් සභාව පැවැත්වුවා. මීට වසරකට කලින් මේ වසංගත තත්වය හමුවේ අපේ සභාවාරයන් තියන්නත් නොහැකි වුනා. මොකද නීත්‍යානුකූලව සෞඛ්‍ය හේතූන් මත අපහසුතා ගොඩක් මැද තමයි අපි සභාවාරය පැවැත්වුවෙ. නමුත් අපි තීරණය කළා. මේ සභා වාරය මෙම ශාලාවෙ පෙරසේම තියන්න. මේ වන විට මේ ප්‍රදේශයේ කොවිඩ් වසංගත තත්වය යම්තාක් දුරට මර්ධනය කරලා, යහපත් අයුරින් ක්‍රියාත්මක වෙන නිසා අපි කල්පනා කළා. සභා වාරය මේ ආකාරයට තියන්න. ඒ අනුව අද මෙම ස්ථානයේ පෙර පරිදිම සභා වාරය පවත්වන්න, යම් අපහසුතා ඇති වුවත් ඒක දරාගන්න කියල මම ඉල්ලා සිටිනවා. උදේ දුරකතනෙන් මට ධර්මසිරි මන්ත්‍රීතුමා, පියල් මන්ත්‍රීතුමා, සහ පතිනායක මන්ත්‍රීතුමා ප්‍රමාද වී පැමිනෙන බව දැනුම් දුන්නා. ඒ අනුව මේ අවස්ථාවෙ පැමිණ සිටින ගරු උප සභාපතිතුමා මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා මම ගෞරවයෙන් පිළිගන්නවා. විශේෂයෙන්ම කියන්න ඕන. උදාවෙන අලුත් අවුරුද්ද නිසා නියමිත දිනට දින හතකට කලින් තමයි අපි සභාව පවත්වන්න යෝජනා කළේ. එහෙමනම් ඔබ සියලු දෙනාම ගෞරවයෙන් පිළිගන්නවා.

**(අ)01. 2021.03.09 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත

2021.03.09 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. 222 සී ඌරල පහල ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත් අක්කර 2 මාර්ගය පස් දමා ගොඩකර ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ඉල්ලා ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් 2021.04.05 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

02. අත්පන්දු ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සම්බන්ධව ගා/උනන්විටිය රේවත මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් 2021.02.23 දිනැති යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

03. හෝමදොළ ගම්මානයේ වැඩ නිමවී ඇති පෙර පාසල නාගොඩ ප්‍රාදේශීය සභාවට පවරා දීමට වටවල වැව්ලි සමාගම කැමැත්ත පළ කර ඇති බැවින් එම පෙර පාසල සභාවට පවරා ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින්යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

04. ත්‍රීරෝද රථ නැවතුමක් ලබා ගැනීම සඳහා ලේකම්, උඩුගම හොමදොළ හංදිය ත්‍රීරෝද රථ සංගමය විසින් 2021.03.21 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

**ත්‍රීවිල් රථ සංගමය කැඳවා සාකච්ඡා කොට පිළිතුරක් ලබාදීමට තීරණය විය.**

05. කාන්තා මහජන නියෝජිතවරියන් සඳහා වූ දෙදින දැනුවත් කිරීමේ වැඩසටහන සම්බන්ධව පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය 2021.04.01 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

06. 2021 අප්‍රේල් 09/10 දෙදින තුල අවුරුදු පොළ පැවැත්වීම සඳහා අවසර ලබා ගැනීම සම්බන්ධව කළමනාකරු, සමෘද්ධි බැංකුව, උඩුගම විසින් 2021.04.06 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**අදාළ දිනවල උඩුගම සති පොළ පවත්වන්නේ නැත්නම් පමණක් අවසර ලබාදීමට තීරණය විය.**

07. පොදු කටයුත්තක් වෙනුවෙන් ප්‍රාදේශීය සභාවෙන් අවශ්‍ය සහයෝගය ලබා ගැනීම සම්බන්ධව සභාපති, ව්‍යාපාරික සහයෝගීතා සංගමය, උඩුගම විසින් 2021.04.05 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

**මෙම ඉල්ලීම ඉදිරියේදී පවත්වන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට තීරණය විය.**

08. තාවකාලිකව අටවාගත් මඩු සම්බන්ධව ලේකම්, එක්සත් වෙළඳ සේවා සංගමය, උඩුගම විසින් 2021.04.05 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභා ගත කරන ලදී.

09. පළාත් පාලන සභිකයන් සඳහානායකත්ව සංවර්ධන සහතිකපත්‍ර පාඨමාලාව සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව , දකුණු පළාත විසින් 2021.03.26 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

01.2020 වර්ෂයේ කොවිඩ් - 19 පාලනය හේතුවෙන් සති පොළවල් නොපැවැත්වීම මත පොළ බදු මුදල් කපා හැරීමට අදාලව ආදායම් පරීක්ෂකගේ වාර්තාව මත තල්ගස්වල බදාදා සති පොළෙහි සහ උඩුගම සඳුදා සති පොළෙහි අයවිය යුතු පොළ බදු මුදල් කපා හැර (තැන්පතු නිදහස් කිරීම) සුදුසුයැයි ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව සභා සම්මත නොවුනි.**

02.2021 වර්ෂයේ කොවිඩ් - 19 පාලනය හේතුවෙන් සති පොළවල් නොපැවැත්වීම මත පොළ බදු මුදල් කපා හැරීමට අදාලව ආදායම් පරීක්ෂකගේ වාර්තාව මත තල්ගස්වල බදාදා සති පොළෙහි සහ උඩුගම සඳුදා සති පොළෙහි අයවිය යුතු පොළ බදු මුදල් කපා හැරීම සුදුසුයැයි ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව සභා සම්මත නොවුනි.**

**09.** **ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 31 දක්වා ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.**

**<u>2021.04.06 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>**

**01.ලංකා විදුලිබල මණ්ඩලය**

**2021 මාර්තු මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු 8671.65 |
| 2813189405 | -තල්ගස්වල පෙර පාසල | - රු. 276.60 |
| 4507357802 | - සමනල පෙර පාසල | - රු. 276.60 |
| 8617046104 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය | - රු.1411.20 |

**2021 පෙබරවාරි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 898.80 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 331.50 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු.2088.30 |
| 8616373802 | - උඩුගම පොළ | - රු. 240.00 |
| 4599064300 | - ගෝනදෙනිය පෙර පාසල | - රු. 294.90 |

**2021 ජනවාරි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 8617046104 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය | - රු.1356.30 |

**හිඟ විදුලි බිල්පත් ගෙවීම**

| | | |
|---|---|---|
| 4501090200 | - මාපලගම වෙළඳ සංකීර්ණ කොරිඩෝව | |
| | 2020 අගෝස්තු | - රු. 386.40 |
| | 2020 ඔක්තෝම්බර් | - රු. 276.60 |
| | 2020 නොවැම්බර් | - රු. 423.00 |
| | 2020 දෙසැම්බර් | - රු. 240.00 |

**2020 දෙසැම්බර් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 240.00 |
| 4507357802 | - සමනල පෙර පාසල | - රු. 240.00 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු. 240.00 |
| 8616373802 | -උඩුගම පොළ | - රු. 240.00 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 240.00 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |

| | | |
|---|---|---|
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | |
| | 2020 අගෝස්තු | - රු. 862.20 |
| | 2020 දෙසැම්බර් | - රු. 240.00 |

| | | |
|---|---|---|
| 2813038709 | - කැකුළු පෙර පාසල | |
| | 2020 නොවැම්බර් | - රු. 240.00 |

2020 දෙසැම්බර් - රු. 240.00

2813189405 -තල්ගස්වල පෙර පාසල
2020 ඔක්තෝම්බර් - රු.331.50
2020 දෙසැම්බර් - රු. 240.00

4599064300 - ගෝණදෙනිය පෙර පාසල
2020 ඔක්තෝම්බර් - රු. 258.30
2020 දෙසැම්බර් - රු. 240.00

8619142704 - රන්කැකුළු පෙර පාසල
2020 අගෝස්තු - රු. 240.00

459082800 - උදාර පෙර පාසල
2020 ඔක්තෝම්බර් - රු. 258.30
2020 නොවැම්බර් - රු. 240.00

4509082908 - උක්ඕවිට පෙර පාසල
2020 දෙසැම්බර් - රු. 240.00
2021 ජනවාරි - රු. 258.30
2020 අගෝස්තු - රු. 258.30

2810236100 - මාපලගම ක.ක්‍රීඩාංගනය
2020 අගෝස්තු - රු. 240.00

**02. 2021 පෙබරවාරි මස දුරකථන බිල්පත්**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

| | | | |
|---|---|---|---|
| i. | 0912231201 | - සභාපතිතුමාගේ නිවස | - රු. 3683.06 |
| ii. | 0912296577 | - මාපලගම උප කාර්යාලය | - රු. 422.98 |
| iii. | 0912296537 | - සභාපතිතුමාගේ නිල කාමරය | - රු. 3465.13 |
| iv. | 0912296433 | - ප්‍රධාන කාර්යාලය | - රු. 4431.68 |

**03.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**
33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2021.02.20 – 2021.03.23) -රු. 2618.28
33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2021.02.20- 2021.03.23) -රු. 5576.40

**04 .2021මාර්තු මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සදහා)**

| | | |
|---|---|---|
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.එල්.එන්.ප්‍රමෝද මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| අනුෂා සමරවික්‍රම මෙය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 3000.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 5270.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**05 .2021පෙබරවාරි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සදහා)**

අනුෂා සමරවික්‍රම මෙය - තාක්ෂණ සේවා නිලධාරී - රු. 3000.00

**06.2021 අප්‍රේල් මස ගමන් වියදම්**

**පුහුණු වැඩසටහන් සඳහා සහභාගීවීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 920.00 |
| යූ.වී.මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 896.00 |

**2021 මාර්තු මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියැලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - සභාපති | - රු. 5000.00 |
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1500.00 |
| ඩබ්.ඒ. ශාන්ත මයා | - සංවර්ධන නිලධාරී | - රු. 544.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 7320.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1425.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 1480.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 7700.00 |

**පුහුණු වැඩසටහන් සඳහා සහභාගීවීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 1972.00 |
| කේ.එල්.එන්. ප්‍රමෝද මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 1100.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 1100.00 |
| ඩබ්.ආර්.අනුෂි වසන්තිකා මිය | - පුස්තකාල සහායක | - රු. 4640.00 |
| එච්.ඩබ්.සන්ධ්‍යා මල්කාන්ති මිය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1832.00 |

**07. අතිකාල දීමනා ගෙවීම්**

**2021 මාර්තු මස**

| | | |
|---|---|---|
| මසීදා අන්වර් මිය | - කළමනාකරණ සහකාර | - රු. 964.66 |
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9046.04 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 8583.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 6066.40 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 5557.20 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 5232.60 |
| පී.කේ.චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2638.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 8166.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 7237.12 |
| කේ.එච්.එම්.නිශාන්ත ඉඳුනිල් මයා | - අනියම් රියදුරු | - රු. 8273.65 |
| හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 5206.00 |
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - විදුලි කාර්මික | - රු. 3150.00 |
| ඩබ්.එස්.සී.මධුෂානි මිය | - කාර්යාල කාර්ය සහායක | - රු. 866.66 |
| චතුරානි පතිනායක මිය | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 909.66 |
| අයි.කේ.ඉන්දික මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1040.00 |

**අතිකාල දීමනා ගෙවීම්**

**2021 පෙබරවාරි මස**

| | | |
|---|---|---|
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 3304.80 |

**08.** **සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

| | | |
|---|---|---|
| i. | 2021 මාර්තු මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත | - රු.81000.00 |
| ii. | ආයතනයේ රාජකාරි සඳහා අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම | - රු. 1750.00 |
| iii. | 2021.03.09 දින පවත්වන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා සහභාගී වූ නිලධාරීන් සඳහා දීමනා ගෙවීම | - රු. 3000.00 |

**09.** **ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2021 පෙබරවාරි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 547ක් | - රු. 56888.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 150 ක් | - රු. 15600.00 |
| LL 7650 ක෴ කැබ් රථය ඩීසල් ලීටර් 120 ක් | - රු. 12480.00 |
| LL 7366 ට්‍රක් බවුසර් රථය ඩීසල් ලීටර් 400 ක් | - රු. 41600.00 |
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 120 ක් | - රු. 12480.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 35 ක් | - රු. 3640.00 |
| DS 40 Oil 1L | - රු. 750.00 |
| ජලභීතිකා රෝගය මර්ධනය කිරීම වෙනුවෙන් පෙට්‍රල් ලීටර් 6 | - රු. 822.00 |
| ගබඩාව පෙට්‍රල් ලීටර් 50 | - රු. 6850.00 |
| 2T Oil ලීටර් 2 | - රු. 1200.00 |
| මාසික සභා වාර්තා බෙදීම වෙනුවෙන් (පෙට්‍රල් ලීටර් 5) | - රු. 685.00 |
| **එකතුව** | **- රු.152995.00** |

**10.** **ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2021 මාර්තු මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 599ක් | - රු. 62296.00 |
| LO 3592 ලොරි බවුසරය ඩීසල් ලීටර් 60 | - රු. 6240.00 |
| LL 7650 ක෴ කැබ් රථය ඩීසල් ලීටර් 250 ක් | - රු. 26000.00 |
| LL 7366 ට්‍රක් බවුසර් රථය ඩීසල් ලීටර් 300 ක් | - රු. 31200.00 |
| DS 40 ඔයිල් ලීටර් 01 | - රු. 750.00 |
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 200 ක් | - රු. 20800.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 42 ක් | - රු. 4368.00 |
| DS 40 ඔයිල් ලීටර් 01 | - රු. 750.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 150 | - රු. 15600.00 |
| DS 40 ඔයිල් ලීටර් 01 | - රු. 750.00 |
| හයිඩ්‍රොලික් ඔයිල් ලීටර් 10 | - රු. 6450.00 |
| ගබඩාව පෙට්‍රල් ලීටර් 25 | - රු. 3425.00 |
| 2T Oil ලීටර් 1 | - රු. 600.00 |
| මාසික සභා වාර්තා බෙදීම වෙනුවෙන් (පෙට්‍රල් ලීටර් 5) | - රු. 685.00 |
| **එකතුව** | **-රු.179,914.00** |

**11.** **එච්.එල්.කේ.ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2021 මාර්තු - රු. 5560.00

**12. ඒ.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත**
නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2021 මාර්තු - රු. 6880.00

**13. ඩබ්.ජේ.ඒ. ශානක මයා, ආදායම් පරීක්ෂක, නාගොඩ ප්‍රාදේශීය සභාව**
උඩුගම සති පොළෙහි කඩ කාමර අංක කිරීමේදී අවස්ථානුකූලව මිළදී ගැනීමට සිදු වූ ද්‍රව්‍යය සඳහා මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 1010.00

**14. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා අප්‍රේල් මස මාසික කුලීය ගෙවීම - රු. 5000.00

**15. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**
i. සංවර්ධන අංශයේ සිවිලිම විදුලි පංකාවේ අළුත්වැඩියාවට අවශ්‍ය උපාංග මිළදී ගැනීමේ බිල්පත - රු. 550.00
ii. තණකොල කපන යන්ත්‍රය සඳහා කේබල් ලබාගැනීමේ බිල්පත - රු. 650.00

**16. එම්.ජේ. ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**
i. ප්‍රාදේශීය සභාවේ 2021.03.09 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 6565.00

**17. විගණකාධිපති, විගණන කාර්යාලය**
i. හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**18. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
(2021 මාර්තු) - රු.13000.00

**19. සඳරු ග්‍රොසරි ඇන්ඩ් ග්‍රයින්ඩින් මිල්ස්, නාගොඩ**
i. ප්‍රාදේශීය සභාවේ 2021.03.09 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත - රු. 4521.00

**20.කේ.එච්.සී.පී. කුමාර මයා, නාගොඩ**
උඩුගම මහජන පුස්තකාලය සඳහා පත්තර රාක්ක 2 ක් සාදා නිමකර දීමේ බිල්පත - රු.13000.00

**21.ප්‍රියන්ත ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්, ගාල්ල**
වීථි රේඛා සහතික නිකුත් කිරීමේ ඉල්ලුම්පත් 500 ක් මුද්‍රණය කිරීමේ බිල්පත - රු. 1375.00

**22. එක්සලන්ට් ඇඩ්ස් ඇන්ඩ් කාර් කෙයා, තල්ගස්වල**
උඩුගම ගමගොඩ අබලන් පාලම දෙපස අනතුරුදායක බව දන්වා බැනර් ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය ඩිජිටල් මුද්‍රණය කිරීමේ ගාස්තුව - රු. 800.00

**23. කේ.ටී.ආර්.ජී. උමාල් කිරිඇල්ල මයා, ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ**
LL 7650 කෘ කැබ් රථයේ බ්‍රේක් පද්ධතිය අලුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 14650.00
PF 7360 කැබ් රථය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 43171.00

**24.නීතිඥ හේමන්ත පී.ඩබ්.විතාරණ මයා, ගාල්ල**

i. 2021.03.17 දින කැඳවූ එල් 13814 දරණ නඩුවට අදාළව වෙනුවෙන් නීතිඥ හා පෙනී සිටීමේ, ගාස්තු - රු. 3000.00

**25. ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2021 මාර්තු මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු28500.00

ii. 2021 මාර්තු මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 3885.00

**26. යුනිට් ට්‍රේඩ් සෙන්ටර්, නාගොඩ**

ගරු ආරියතිලක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් පාංසකූලය ලබා දීමට සුදු රෙදි මිලදී ගැනීමේ ගාස්තු ගෙවීම. - රු. 1320.00

**27. සේසිරි සිටෝර්ස්,මාපලගම**

ගරු ආරියතිලක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් පැමිණි පිරිසට සංග්‍රහ කිරීමේ බිල්පත පියවීම - රු. 6130.00

**පොදු අරමුදල්**

**28. එම්.වී.නාමල් ලක්රුවන් මයා, ගෝණදෙනිය**

i. නාගොඩ බල ප්‍රදේශයේ කොතලාවල මාර්ග 03 ක් ජේ.සී.බී.යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 92500.00

ii. නාගොඩ බල ප්‍රදේශයේ සදරුස්ගම. බටහේන්ගොඩ, උඩුගම කුරුන්ද මාර්ග ජේ.සී.බී.යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු.200000.00

**iii.** උඩුගම බල ප්‍රදේශයේ මාර්ග 04 ක් ජේ.සී.බී.යන්ත්‍ර යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු.108750.00

**29. කේ.එච්.එම්. කසුන් ගීතාංජන මයා, කුරුපනාව**

අලවත්තවිල හරහා කුරුපනාව දක්වා මාර්ගය සකස් කිරීමට කියුබ් 1 ක ටිපර් රථයක් සඳහා ගෙවීම් බිල්පත - රු. 7500.00

**රජයේ ආධාර**

**මන්ත්‍රී ප්‍රතිපාදන ( පාර්ලිමේන්තු මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ මැතිතුමා)**

**30.සී/ස බද්දේගම ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතිය, බද්දේගම**

i. 2019 ඩී අලුත්වත්ත ග්‍රානි වසමට අයත් 18 කණුව වීන ගම්මානය අසල මාර්ගය සඳහා සිළිංඩර් යෙදීම වෙනුවෙන් ගෙවීම - රු. 26062.50

ii. හියුම් පයිප්ප මිළදී ගැනීමේ බිල්පත - රු. 97500.00

iii. හියුම් පයිප්ප මිළදී ගැනීමේ බිල්පත - රු. 15637.50

**පළාත් නිශ්චිත**

**31. කුරුපනාව එකමුතු වැඩිහිටි සංවිදානය, කුරුපනාව**

මාපලගම ආයුර්වේද මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම කර්මාන්තයේ රැඳවුම් මුදල් ගෙවීම - රු. 20413.95

ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. මාපලගම ගොවිජන මධ්‍යස්ථානයට පොහොර ගබඩාවක් ලබා දී ගොවිජනයාගේ පහසුව සඳහා ගබඩාව පුළුල් කර දෙන මෙන් යෝජනා කරමි.

ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී කේ.එච්.එම්.නදීකා දර්ශනී මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

02. අප බල ප්‍රදේශයේ ජනයාගේ මනෝ මූලිකත්වය සඳහා දැණුම රැස්කරන පුස්තකාල ජංගම රථය නැවත ස්ථාපිත කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී කේ.එච්.එම්.නදීකා දර්ශනී මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

අප බල ප්‍රදේශයේ ප්‍රධාන මාර්ගයේවංගු සහිත ස්ථානයක ඉතා අවධානම් පාලමක් ඇත. එම ස්ථානයේ අනතුරු වැළැක්වීම සඳහා වීථි ලාම්පු 2ක් ලබා දෙන මෙන් යෝජනා කරමි.

ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී කේ.එච්.එම්.නදීකා දර්ශනී මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. උඩුගම නැගෙනහිර ගුණානන්ද මාවත ගුලනකන්ද මාර්ගය බැකෝ යන්ත්‍රයක් මගින් සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

02. උඩුගම දකුණ දක්වා දැනට ක්‍රියාත්මක අපද්‍රව්‍ය රැගෙන එන ට්‍රැක්ටර් රථය උඩුගම දකුණ දක්ෂිනාරාමය අසළින් පඤ්ඤාලෝක මාවත හරහා සමගිගම ගම්මානය සාමිමලේ මංසන්ධිය දක්වා ගමන් කිරීම සැළැස්වීමට කටයුතු කිරීමට යෝජනා කරමි.

ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. උඩුගම මහජන පුස්තකාලයේ අංශ වෙන්කර සංවර්ධනය කිරීම - රු. 210000.00
02. යෝජිත වළකුඹුර මාර්ගයේ පිවිසුම් මාර්ගය හා භූමිය සකස් කිරීම - රු. 500000.00
03. තල්ගස්වල සතිපොළ සංවර්ධනය කිරීම - ප්‍රාග්ධන වැඩසටහන 2021 -රු.1300000.00
04. තල්ගස්වල නගරය සඳහා වෙළඳ සංකීර්ණය අදියර 1 -රු.10000000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. 214 ඩී මාරකන්ද නව ගම්මාන මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම - රු. 37500.00
04. 214 ඒ මලාමුර වෙදගෙදර මාවත ජේ.සී.බී. යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම - රු. 20000.00
05. 215 සී කළුකොත මානම්පිට පාර බෝක්කු යොදා සංවර්ධනය කිරීම - රු. 15637.50
06. 215 ඒ රණවිරුගම කොස්ගහබංගලාව පාර බෝක්කු යොදා සංවර්ධනය කිරීම - රු. 15637.50
07. ඉහළ කටඹුරාව වතු නිවාස සංකීර්ණයට ගමන් ගන්නා මාර්ගය සඳහා සිළිංඩර් යොදා සංවර්ධනය කිරීම - රු. 22000.00
08. කොතේගොඩකන්ද මාර්ගයේ කේ.කේ.කමලාවතී මහත්මියගේ නිවස ඉදිරියෙන් ඇති කොන්ක්‍රීට් මාර්ගය හරහා සිළිංඩර් යොදා සංවර්ධනය කිරීම - රු.150000.00
09. රඹුක්පොත මාර්ගය සඳහා සිළිංඩර් යෙදීම - රු. 16000.00
10. ගුලනවිල රදාදෙණිය මාර්ගය සඳහා සිළිංඩර් යෙදීම - රු. 7050.00
11. කුරුඳුකැටිය මාර්ගය සඳහා සිළිංඩර් යෙදීම - රු. 7050.00
12. ගෝනලගොඩ ගඟ අද්දර බෙම්මුල්ලවත්ත මාර්ගය සඳහා සිළිංඩර් යෙදීම - රු. 14100.00
13. අශෝකාරාම විහාරස්ථානය අසළ කාණුව සඳහා සිළිංඩර් යෙදීම - රු. 51000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

15. උඩුගම දකුණ ක්‍රීඩාංගනයෙහි නව දිවා රාත්‍රී අත්පන්ද ක්‍රීඩාපිටිය ඉදිකිරීම -රු.1500000.00
16. උනන්විටිය ක්‍රීඩාංගනයෙහි නව දිවා රාත්‍රී අත්පන්ද ක්‍රීඩාපිටිය ඉදිකිරීම -රු.1500000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ උඩුගම ශ්‍රවනාගාරයේ වේදිකා තිරය සකස් කිරීම වෙනුවෙන් ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | ධනුෂ්ක කර්ටන්, හොරණ | නිව් මොඩර්න් කර්ටන්, බණ්ඩාරගම | රෝයල් කර්ටන්, මහරගම |
|---|---|---|---|
| උඩුගම ශ්‍රවනාගාරයේ වේදිකා තිරය සකස් කිරීම | රු. **202400.00** | රු. **176500.00** | රු. **195450.00** |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ උඩුගම ශ්‍රවනාගාරයේ වේදිකා තිරය සකස් කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල නිව් මොඩර්න් කර්ටන්, බණ්ඩාරගම මගින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ උඩුගම ශ්‍රවනාගාරයේ වේදිකා තිරය සකස් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ මාපලගම වෙලඳ සංකීර්ණයේ උඩුමහල අංක 06 කඩ කාමරයේ දොර සකස් කිරීම වෙනුවෙන් ලැබී ඇති මිළ ගණන් (දොරවල් 2කට )**

| විස්තරය | නිව් අයන් වර්ක්ස්, ඇතුමලේ | මහින්ද අයන් වර්ක්ස්, නාගොඩ | ලාල් මෝටර්ස්, නාගොඩ | අනුර අයන් වර්ක්ස්, ගෝණදෙනිය |
|---|---|---|---|---|
| මාපලගම වෙලඳ සංකීර්ණයේ උඩුමහල අංක 06 කඩ කාමරයේ දොර සකස් කිරීම | රු. **41500.00** | රු. **43000.00** | රු. **45000.00** | රු. **28000.00** |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ මාපලගම වෙලඳ සංකීර්ණයේ උඩුමහල අංක 06 කඩ කාමරයේ දොර සකස් කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල අනුර අයන් වර්ක්ස්, ගෝණදෙනිය මගින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ මාපලගම වෙලඳ සංකීර්ණයේ උඩුමහල අංක 06 කඩ කාමරයේ දොර සකස් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ කම්කරුවන් වෙනුවෙන් අවශ්‍ය වැහි කබා වෙනුවෙන් ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | ජනු කුෂන් වර්ක්ස්, යටලමත්ත | ඕෂාලි ෆැෂන් | ඉරේෂා ගාමන්ට්, යටලමත්ත |
|---|---|---|---|
| සම්පූර්ණ කබාය කලිසම හා කමිසය ඒකක මිළ | රු. 1675.00 | රු. 1650.00 | රු. 1400.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ කම්කරුවන් වෙනුවෙන් අවශ්‍ය වැහි කබා වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල ඉරේෂා ගාමන්ට්, යටලමත්ත මගින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ කම්කරුවන් වෙනුවෙන් අවශ්‍ය වැහි කබා මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ ලේඛනාගාරය සඳහා අවශ්‍ය රාක්ක හා ලිපිකරු මේසවලට අවශ්‍ය ග්ලාස් පෑඩ් වෙනුවෙන් ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | ටී.ජී.හාඩ්වෙයාර්, නාගොඩ | තිසහ සිවිලිම ප්‍රදර්ශනාගාරය, නාගොඩ | නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ |
|---|---|---|---|
| ඇලුමිනියම් රාක්ක තට්ටු 5 | රු. 85850.00 | රු. 84500.00 | රු. 86250.00 |
| 2x4 ලිපිකරු මේස් | රු.1400.00 | රු. 1160.00 | රු. 1200.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ ලේඛනාගාරය සඳහා අවශ්‍ය රාක්ක හා ලිපිකරු මේසවලට අවශ්‍ය ග්ලාස් පෑඩ් වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල තිසහ සිවිලිම ප්‍රදර්ශනාගාරය, නාගොඩ මගින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ ලේඛනාගාරය සඳහා අවශ්‍ය රාක්ක හා ලිපිකරු මේසවලට අවශ්‍ය ග්ලාස් පෑඩ් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනි සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ අනතුරුදායක ගස් ඉවත් කිරීම වෙනුවෙන් ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | රවී ලී මෝල, යටලමත්ත | එච්.එන්.පී.ප්‍රේමදාස , මත්තක | සරත් ගමගේ , උඩලමත්ත |
|---|---|---|---|
| නැදුන් ගස් 2 ක අතු ඉවත් කර අඩි 15 ක් උසින් කපා දැමීම | රු. 13500.00 | රු. 14500.00 | රු. 13000.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ අනතුරුදායක ගස් ඉවත් කිරීම වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල සරත් ගමගේ , උඩලමත්ත මගින් අනතුරුදායක ගස් ඉවත් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂය සඳහා වාහන අමතර කොටස් මිලදී ගැනීම වෙනුවෙන් ලැබී ඇති මිළ ගණන්

| විස්තරය | මුතුහෙට්ටිගම සර්විස් ස්ටේෂන් - උඩුගම | ආසිරි ටයර් ට්‍රේඩර්ස් - ඇතුමලේ | නිව් විජය මොටර්ස් - ගාල්ල |
|---|---|---|---|
| 650 × 16 ටයර් | ceat16250.00 | Ceat 16200.00 | Ceat 16050.00 |
| 650 × 16 ටියුබ් | Ceat 1900.00 | Ceat 1800.00 | Ceat 1650.00 |
| 650 × 16 රිම් ටේප් | Ceat 850.00 | Ceat 750.00 | Ceat 750.00 |
| 600 × 12 ටයර් | Ceat 9375.00 | Ceat 9450.00 | Ceat 9200.00 |
| 600 × 12 ටියුබ් | Ceat 1175.00 | Ceat 1200.00 | Ceat 1100.00 |
| 600 × 12 රිම් ටේප් | | | |
| 750 × 16 ටයර් | Ceat 22975.00 | Ceat 23100.00 | Ceat 22800.00 |
| 750 × 16 ටියුබ් | Ceat 2250.00 | Ceat 2300.00 | Ceat 2100.00 |
| 750 × 16 රිම් ටේප් | Ceat 750.00 | Ceat 750.00 | Ceat 750.00 |
| 600 × 16 ටයර් | Ceat 13500.00 | Ceat 13400.00 | Ceat 13200.00 |
| 600 × 16 ටියුබ් | Ceat 1775.00 | Ceat 1700.00 | Ceat 1500.00 |
| 600 × 16 රිම් ටේප් | Ceat 750.00 | Ceat 750.00 | Ceat 750.00 |
| 12.4 × 28 ටයර් | Ceat 51200.00 | Ceat 50500.00 | Ceat 49400.00 |
| 12.4 × 28 ටියුබ් | Ceat 5700.00 | Ceat 5800.00 | Ceat 5500.00 |
| 12.4 × 28 රිම් ටේප් | | | |
| 900 × 20 ටයර් | Ceat 41900.00 | Ceat 41800.00 | Ceat 41300.00 |
| 900 × 20 ටියුබ් | Ceat 3950.00 | Ceat 4000.00 | Ceat 3800.00 |
| 900 × 20 රිම් ටේප් | Ceat 750.00 | Ceat 750.00 | Ceat 750.00 |
| 825 × 20 ටයර් | Ceat 33700.00 | Ceat 33900.00 | Ceat 33500.00 |
| 825 × 20 ටියුබ් | Ceat 3100.00 | Ceat 3400.00 | Ceat 3100.00 |
| 825 × 20 රිම් ටේප් | Ceat 750.00 | Ceat 750.00 | Ceat 750.00 |
| 265 × 70 × 16 ටයර් | Maxxis 39900.00 | Maxxis 39200.00 | Maxxis 38800.00 |
| 205 × 70 × 16 ටයර් | Maxxis 29500.00 | Maxxis 29500.00 | Maxxis 29000.00 |
| ටියුබ්ලස් වැල් කරවල් | | 200.00 | |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂය සඳහා වාහන අමතර කොටස් මිලදී ගැනීම වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල නිව් විජය මොටර්ස් - ගාල්ල මගින් 2021 වර්ෂය සඳහා වාහන අමතර කොටස් මිලදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ ප්‍රාදේශීය සභාව සතු වාහන සේවා කිරීම සඳහා ලැබී ඇති මිළ ගණන්**

නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ ප්‍රාදේශීය සභාව සතු වාහන සේවා කිරීම වෙනුවෙන් එක් එක් වාහන සඳහා අවම මිළ ගණන් දැක්වීම සේවා අවශ්‍යතාවය ඒ සඳහා ඇති වගකීම් සහගතභාවය සැළකිල්ලට ගෙන ඩබල් කැබ් රථය හා කෘ කැබ් රථය ගාල්ල අබේනායක ඔටෝ සර්විස් වෙතින්ද ටිපර් රථ ට්‍රක් බ්‍රවුසර් ලීටර් 600 ට්‍රක් බවුසර් ලීටර් 8000 මාපලගම වරුණ සර්විස් සෙන්ටර් වෙතින්ද ට්‍රෙලරය සහිත ට්‍රැක්ටර් ඇතුමලේ ආසිරි ටයර් ට්‍රේඩර්ස් වෙතින්ද සේවා කිරීමට තීරණය කරන ලදී. එම තීරණයට අනුව වාහන සර්විස් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා**

01. 2021.03.26 වන දින නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීම

02. 2021.03.26 දින නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ පැවති අපහරණ හා වෙන්දේසි කමිටු වාර්තාව සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීම

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2021 මාර්තු මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව 2021 අප්‍රේල් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2021 මාර්තු මාසයට අදාළ මාසික ඒකාබද්ධ වැය සාරාංශය 2021 අප්‍රේල් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමා ඇතුලු සියලු දෙනාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මම ඉස්සෙල්ලම ප්‍රශ්නය යොමු කරන්නෙ. පුස්තකාල උපදේශන කමිටුවට. මේ මෑතකදි ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ අපේ දියනියක් මට කතා කරල කිව්වා. මාමේ මට යක්කලමුල්ලෙ පුස්තකාලයෙන් අවශ්‍ය තොරතුරු ටිකක් තියෙනවා ලබා ගන්න. ඒ සඳහා අවස්ථාවක් අරන් දෙන්න කියලා. මම

ඇහුවා ඇයි පුතේ උඩුගම පුස්තකාලයක් තියෙනවා. නාගොඩ සභාවෙ, මාපලගම පුස්තකාලයක් තියෙනවා. ඔයාට අවශ්‍ය කරන තොරතුරු ටික ගන්න මේ පුස්තකාලයෙන් තොරතුරු ගන්න පුලුවන් නේද? ඒක මදිද කියලා. එතකොට එයා අපට අවශ්‍ය කරන කිසිම දෙයක් මේ පුස්තකාල දෙකේම නැහැ කිව්වා. එතකොට මම යක්කලමුල්ල සභාපතිතුමාට කතා කරලා. ඒ පුස්තකාලයේ තියෙන දත්ත තොරතුරු ටික ගන්න. මම ඒ ඉගෙන ගන්න දරුවට අවස්ථාවක් ලබා දුන්නා. සභාපතිතුමනි අපි පොඩි කාලෙ ඉඳලම උඩුගමත්, මාපලගමත් පුස්තකාල තිබුනා. මේ පාඨකයාට අවශ්‍ය කරන දත්ත ටික තොරතුරු ටික මේ පුස්තකාලයෙන් ලබා දෙන්න අපි බැඳී සිටිනවා. මේ පුස්තකාලය කියන වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම තියෙන්නෙ දත්ත ගබඩාවක්. තොරතුරු ගබඩාවක්. එතකොට අපි ඉගෙන ගන්න ළමයින්ට නවල් කියවන්න පුස්තකාලයක් තියෙනවට වඩා, අධ්‍යාපන ක්‍රමයත් එක්ක යන අධ්‍යාපනයට සම්බන්ධ අවශ්‍ය කරන පොත්පත් පරිශීලනය කරන්න පුලුවන් අවස්ථාවක් අපි පාඨකයාට ලබා දිය යුතුයි. ඒක තමයි අපෙන් විය යුත්තේ. විශ්ව විද්‍යාලයේ ඉන්න ළමයින්ට මාක්ස් වාදය පිළිබඳ තොරතුරු හොයන කොට, මාක්ස් වාදය පිළිබඳ තොරතුරු ටික හොයා ගන්න පුස්තකාලය තුල ඉඩ ප්‍රස්ථාව නැත්නම් ඒ ළමයා කොහාටද යන්නෙ. සමාජ විද්‍යාව පිළිබඳව තොරතුරු ටික හොයා ගන්න නැත්නම් ඒ ළමයා කොහේට ගිහිල්ලද තොරතුරු ටික හොයා ගන්නෙ. චරිතා ප්‍රදානය පිළිබඳව ලංකාවෙ තොරතුරු ටික හොයා ගන්න පුස්තකාලයෙන් බැරිනම් අපි කොහාටද යන්නෙ. ස්වභාවික ආපදා, ස්ත්‍රී පුරුෂ සමාජානු යෝජනය, ස්ත්‍රී පුරුෂ ශ්‍රම විබජනය, කර්මාන්ත ශාලා ආශ්‍රිත පරීක්ෂණ ව්‍යාකරණ, මාධ්‍ය කරණය ඒ වගේම ජේ.බී. දිසානායක සඳගෝමී කෝප්පර හේවා වැනි විශිෂ්ඨ ගණයේ සාහිත්‍ය ධරයන්ගේ කෘති, මේ පිළිබඳව අධ්‍යනයකින් කටයුතු කරන්න කියල මම පුස්තකාල උදේශන කමිටුවට යෝජනාවක් ඉදිරිපත් කරනවා. පාඨකයාගේ අවශ්‍යතාවය තේරුම් අරගෙන පාඨකයාට අවශ්‍ය කරන සියලුම දේ ලබා දෙන්න කියලා. සභාපතිතුමනි මේ පුස්තකාල සංවර්ධනයට, පුස්තකාලයට අවශ්‍ය කරන පහසුකම් ලබා දෙන්න යෝජනාවක් ගෙනාවොත්, මේ මේ 27 දෙනාම අත උස්සයි. මොකද අධ්‍යාපනයෙන් ළමයින්ට ඉදිරියට යන්න නම් ඔවුන්ට තොරතුරු සොයා ගැනීමට අවශ්‍ය වෙනවා. ඒ තොරතුරු ටික සොයා ගන්නනම්, අපි මේ 27 දෙනා මෙතන වාඩි වෙලා අපි මොනව හරි යුතුකමක් අඩුම ගානෙ මේ ඉගෙන ගන්න ළමයින්ට අධ්‍යනය කරන්න හරි මේ පොත් පත් ටික අරන් දෙන්න කියලා පුස්තකාල උපදේශන කමිටුවට යෝජනාවක් හැටියට අරන් එනවා. මෙන්න මේ අවශ්‍ය කරන සියලු දත්ත ටික සොයාගෙන අවශ්‍ය කරන්නෙ මොනවද කියල සොයා ගෙන, ඒ සියලු දත්ත ගබඩාව තුලට යොමු කරලා, අපේ ප්‍රාදේශීය සභාව තුලින් ඒ අවශ්‍ය කරන පහසුකම, අපේ ජනතාවට, ඒ ළමයින්ට ලබා දෙන්න කියලා. ප්‍රාදේශීය සභා ඔක්කොම එකයි මොකද නාගොඩ සභාවෙ නැති යක්කලමුල්ල සභාවේ පුස්තකාලයේ තොරතුරු තියෙන්න විදිහකුත් නැහැ. ඒක නිසා ඒ පිළිබඳව මතක් කරනවා.

සභාපතිතුමනි, මම මීට කලින් කතා කලා මාර්ග අවහිර වීම හා මාර්ග නීති ක්‍රියාත්මක නොවීම පිළිබඳව. උඩුගම සම්බන්ධව මම මේ කතා කරන්නෙ. උඩුගම හැමදාමත් ජනාකීර්ණ ප්‍රදේශයක්. මේ දිනවල සිංහල අලුත් අවුරුද්ද නිසා ජනතාව විශාල වශයෙන් උඩුගම නගරය කරා ඇවිල්ල ඉන්නවා. එවලෙදි අපි දැක්කා උඩුගම පොලීසිය සමහර අවස්ථාවලදි එක එක ස්ථානාධිපති වරුන්ගේ කාල පරිච්ඡේද තුල බාර් හන්දියෙ රවුන්දබවුඩ් එකක් නැහැ. නමුත් එතන ඉර කපාගෙන යන කොට ලියනවා. කීප වතාවක් අපේ තරංග මන්ත්‍රීතුමා කිව්වා. සභාවල ඒව මතක් කරල දුන්නා. එතකොට මේ මාර්ග නීති කියන්නෙ ප්‍රාදේශීය සභාවට අයිති දෙයක් නෙවෙයි. නමුත් මහජන පීඩාවක් වෙනවනම්, අපේ පනත තුල මහජනතාවගේ පීඩාව ඉවත් කිරීමේ බලය ගරු සභාපතිතුමාටත් මේ සභාවටත් වගකීමක් තියෙනවා. අන්න එතනයි මම මේ කතා කරන්නෙ. ඒක නිසා වහාම ක්‍රියාත්මක වන පරිදි ගරු සභාපතිතුමා නියෝගයක් ලබා දෙන්න. මේ මාර්ග නීති පිළිබඳව දැනුවත් කර, මහජනයාගේ ආරක්ෂාව වෙනුවෙන් මාර්ග නීති ක්‍රියාත්මක කරන්න කියලා උඩුගම පොලිස් ස්ථානාධිපතිවරයාට ලිඛිත ලිපියක් යවන්න. ඒ ලිපියෙ පිටපතක් මා වෙත ලබා දෙන්නත් කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි ඔබතුමාගේ ලිපි ලේඛන යටතේ ඉදිරිපත් කලා. උඩුගම වෙළඳ සංගමය ඉදිරිපත් කරපු අනවසර කඩ ඉවත් කිරීම සම්බන්ධව. මම හිතන්නෙ සභාපතිතුමනි, මේක විධිමත් සභාවක් විදිහට විධිමත් ආකාරයෙන් යනවනම් මම හිතන්නෙ මේ ප්‍රශ්නෙ කියපු වෙලාවෙම, ඒක සාකච්ඡා කරමින්, ඒකට අවශ්‍ය කරනදේ මෙතනින් ලබා දිය යුතුයි. ඒ යෝජනාව ඉදිරිපත් වෙන කොටම ඒ යෝජනාවකට සහ ඒ ඉල්ලීමට අනුකූලව අපට ලබාදිය හැකි ප්‍රති උත්තරය අපි ලබා දිය යුතුයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ වෙලාවෙ අපි ඉල්ලා සිටිනවා. මේක ලොකු ගැටලුවක් උඩුගමට. ගරු සභාපතිතුමනි, උඩුගම ව්‍යාපාරික වෙලද සංගමය නීත්‍යානුකූල වෙලද සංගමයක් වශයෙන් අපට බදු ගෙවනවා. ආණ්ඩුවට බදු ගෙවනවා. පළාත් සභාවට බදු ගෙවනවා. එතකොට උඩුගම මොනව හරි පොදු කටයුත්තක් තියෙනවනම්, ඒ ව්‍යාපාරිකයො සියලු දෙනාම සහයෝගය ලබා දෙනවා. පෙරහැරක් තියෙනවනම් පෙරහැරට සහයෝගය ලබා දෙනවා. එතකොට මේ අවුරුදු කාල සීමාව තුල පිටින් ඇවිල්ලා ව්‍යාපාරිකයො මේ උඩුගම මිනිස්සුන්ගෙ සල්ලි ටික අරගෙන ගියා. අර මිනිස්සු එහෙමම ඉන්නවා. ඒක නිසා අපිට වගකීමක් තියෙනවා. ඒ ප්‍රදේශවල ඉන්න ව්‍යාපාරිකයන් වෙනුවෙන් අපි සභාවක් විදිහට පොදු තීන්දුවක් අරගෙන ඒ ඔවුන්ට අවශ්‍ය සාධාරණය ඉටු කර දීම මම හිතනවා සභාව සතු යුතුකමක් කියලා. මේ උඩුගමට විතරක් සීමා වෙච්ච ප්‍රශ්නයක් නෙවෙයි. නාගොඩ, මාපලගම, තල්ගස්වල ඒ හැම තැනටම මේ මාතෘකාව පැන නගීවි. ඒක නිසා සභාපතිතුමනි මේ අවස්ථාවෙදි මම ඒකට උත්තරයක් බලාපොරොත්තු වෙනවා. ඒ වගේම මේ සභාවෙ සල්ලි වලින් මොනව හරි දෙයක් වෙනවනම්, ඒක ගමට බෙදී යන ආකාරයේ වැඩපිළිවෙලකුත් හැදුවනම් එකත් හොදයි. ඒ වගේම වෙලද සංගමයේ ඉල්ලීම පිළිබදව උත්තරයක් ලබා දෙන්න.

ඔබතුමා නීතිය ක්‍රියාත්මක කරන්න. මේක ක්‍රියාත්මක වෙනවද කියලත් අපි අධීක්ෂණයෙන් බලාගෙන ඉන්නවා. අනිත් එක තමයි සභාපතිතුමනි, උඩුගම වෙළඳ සංගමයට අමතරව තවත් වෙළඳ සංගමයක් තියෙනවා. ව්‍යාපාරික සහයෝගීතා සංගමය කියලා. ඒකෙන් ඔබතුමාට ඉල්ලීමක් කරල තියෙනවා. අපි හැමදාමත් කතා කරපු උඩුගමට අවශ්‍ය කරන වැසිකිලි පහසුකම් නොමැති වීම සම්බන්ධව. උඩුගම කියන්නෙ මූල්‍ය ආයතන 12 ක් තියෙන, ලොකු ටවුන් එකක් තියෙන ස්ථානයක්. මේ උඩුගමට මිනිස්සු ගොඩාක් එනවා. අඩුම ගානෙ කාන්තාවකට වැසිකිලියකට යන්න තැනක් අද වෙන කොට නැහැ. උඩුගම නගරයට වැසිකිලියක් සැකසීම සඳහා ඉඩමක් ලබා ගැනීමට අපි උත්සාහයක් ගන්න ඕන. මම ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, උඩුගම වැසිකිලි කැසිකිලි පද්ධතිය සෑදීම සම්බන්ධව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යෝජනාව ඉදිරිපත් කරන්න. එතනදි අපි අවසන් තීන්දුවක් ඉල්ලා ගනිමු.

ඒ වගේම ගරු සභාපතිතුමනි, උඩුගම පොළ සම්බන්ධව දැනට පෙර තිබුන තත්වයට වඩා යම්තාක් දුරට නිවැරදි වෙලා තියෙනවා. නමුත් ඒ අවශ්‍ය කරන විදිහේ අපි බලාපොරොත්තු වුන විදිහේ තවම යථාර්ථයක් වෙන්න බැරිවෙලා තියෙනවා. මොකද දැනට විලේගේ ගරු සභාපතිතුමා හිටපු කාලේ හදපු බිල්ඩින් එකයි දැනට හදපු එකයි දෙක අතර තියෙන්නෙ පස් දාපු තට්ටුවක්. දැන් මේ කාලය තුල ගැටලුවක් නැහැ. වැස්ස පටන් ගත්ත ගමන් අනිවාර්යයෙන්ම පරන පොල තිබුන තත්වයට පත් වෙනවා. ඒ නිසා මම ගරු සභාපතිතුමාගෙන් අහනවා. දැනට ඒ සම්බන්ධයෙන් අරගෙන තියෙන ක්‍රියාමාර්ග මොනවද කියලා ගරු සභාපතිතුමනි, ඒකෙ පිටි පස්සෙ තියෙනවා වැසිකිලි කැසිකිලි පද්ධතියක් ඒකේ වවුල්ලු ජරා කරල තියෙන්නෙ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, හෝමදොල හන්දියෙ ත්‍රී රෝද රථ සංගමය ඉල්ලීමක් කරල තියෙනවා. ඔබතුමාට ලැබුනු ලිපි ලේඛන යටතේ ත්‍රී රෝද රථ නැවතුමක් ලබා ගැනීම සම්බන්ධව, ඔබතුමාගේ අදහස මොකද්ද කියලා දැනගන්න කැමතියි. තිස් හත් දෙනෙක් ජීවත් වෙනවා. මොකද හේතුව දැනට ඉන්න තැන දැනට ත්‍රීවිල් පාර්ක් එකක් නෙවෙයි ඉන්නෙ. පෞද්ගලික ඉඩමක ඉස්සරහ ඒ ඉඩම අයිති මිනිස්සු. දැන් බිල්ඩින් එකක් හදන්න යන්නෙ. එතකොට මේ 37 දෙනාගේ

ජීවිකාව සම්බන්ධව ප්‍රශ්නයක් තියෙනවා. ඒක නිසා ඉතාම ඉක්මනින් අඩුම ගානෙ පාර්ක් එකක් හදනකම් හරි, අඩුම ගානෙ පොල දවසට ඇරෙන්න පොල සීමාවෙ හරි ත්‍රීවිල් නතර කරන්න අවස්ථාවක් ලබා දෙන්න.

ඊලගට ගරු සභාපතිතුමනි, උඩුගම 218 බටහිර ග්‍රාම නිලධාරී වසමේ උඩුගම ශ්‍රී සුජනකන්තාරාමයත් එක්ක මුලු ගමක් සම්බන්ධ වෙන්නෙ. ගලගෙදර ලගත් ගමගොඩත් අතර මැද පාලමක් තියෙනවා. සුජනකන්තාරාමය ලග. මීට කලිනුත් මම ඉල්ලීමක් කළා. පාලම දෙපැත්තෙන් බැමි ගැලවිලා ගිහිල්ලා. දැන් පාලම තියෙන්නෙ හරස් වෙලා. මොන වෙලාවෙ හරි ඔය පාලම ගිලා බහිනවා. ඒක නිසා මම පහුගිය දවස්වල ලේකම් මිස්ට කතා කළාට පස්සෙ, ස්ථානීය පරීක්ෂාවක් සඳහා අපේ තාක්ෂණ නිලධාරී මහත්තය ඇවිල්ල බලාගෙන ගිහිල්ලා. කොහොම හරි සභා රැස්වීමට කලින් ඊයෙ බොඩ් දෙකක් ගහල තිබුනා. සංතෝශ වෙනවා. සභාවට කලින් දවසෙ හරි ඒ බොඩ් දෙක ගහපු එක පිළිබඳව. ඒවගේම තමයි මම ඉල්ලීමක් කළා එම ස්ථානයේ පාර දෙපැත්තෙ බම්පර් දෙකක් ගහන්න. ඒක නිසා මොනව හරිම ගැටලුවක් වුනොත් මහ ජනයට අවහිරතාවයක් වෙනවා. ඒ වගේම නගරයත් ගමත් එකතු වෙන පාලමක්. මහා ජන කොට්ඨාසයකට නගරයට ඒමේ තියෙන හැකියාව ලොකු රවුමක් යායුතුයි. පාලම කඩාගෙන ගියොත් ගමේ පන්සලත් එක්ක තියෙන සම්බන්ධය නැතිවෙලා යනවා. ඒක නිසා මේ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම ප්‍රමුඛතාවය ලබා දීලා, මේ අවශ්‍ය කටයුතු ඉදිරියට කරන්න තියල මම ඔබතුමාගෙන් ඉල්ලනවා. ඒකට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා වූ ක්‍රියාමාර්ග පිළිබඳව ඒ පිටපත් මා වෙත ලැබීමට සලස්වන ලෙසත් ඉල්ලා සිටිනවා.

ඊලගට ගරු සභාපතිතුමනි, පහුගිය කාලෙ පුරාම පොල ගැනමයි කතා කරන්නෙ. නඩුවකුත් දාගත්තා. ඒක නිසා පහුගිය කාලෙ මම ඒ නඩුව සභාවට මම භාර දුන්නා. මොකද හේතුව මගේ ඉඩමක් ගොඩ කළෙත් නැහැ. මගේ පුද්ගලික වාහනයක් උසාවියෙ නඩු භාණ්ඩයක් හැටියටත් නැහැ. ඒක නිසා දීර්ඝ කාලයක් මම අරගෙන ආවා. ඉදිරි ටික සභාව භාර ගන්න. මොකද ආයෙත් ඒ නඩුවට මට පෙනී හිටින්න බැහැ. මොකද හේතුව මේක මගේ පුද්ගලික ඉඩමක් ගොඩ කරන්න ගිහිල්ලනම් ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා මෙච්චර කාලයක් මම ඒ නඩු ගාස්තු ගෙව්වා. ඒක මට අවශ්‍ය නැහැ. ඉදිරියෙදි දැන් අවුරුදු දෙකක් මම නඩුව ඇදගෙන ආවා. ඉදිරි වැඩකටයුතු ගරු සභාපතිතුමනි ඔබතුමා මැදිහත් වෙලා ඒ නඩුව අරගෙන යන්න. අවුරුදු ගානක් ලක්රුවන් මන්ත්‍රීතුමාට පූර්වාදර්ශ තියෙනවා. මට පුද්ගලිකව නඩුවක් වැටිල නැහැ. එතකොට ඒ අවශ්‍ය කරන නඩුවට අදාල කරන දේවල් උසාවිය බලා ගනීවි. ප්‍රාදේශීය සභාවෙ ලොරිය තමයි අන්තිමට උසාවියට යොමු වෙන්නෙ. මගේ පුද්ගලික දෙයක් එතනට නැහැ. එච්චරයි මට කියන්න තියෙන්නෙ.

ඊට පස්සෙ ගරු සභාපතිතුමනි, ඔබතුමා ලක්ෂ දෙකක් උඩුගම කොට්ඨාසෙට ජේසීබී යන්ත්‍ර යොදලා, සංවර්ධනය කරන්න කියලා මුදලක් ලබා දුන්නා. ඒ මුදලින් කරන්න පුලුවන් උපරිම වැඩ කොටස අවුරුදු 15 කට විතර පස්සෙ සදරුස්ගම වතු මාර්ගය පවුල් 15 ක් විතර පදිංචිව ජීවත් වෙනවා. ඒ මිනිස්සුන්ට යාමට ඒමට හැකියාවක් තිබුනෙම නැහැ ඒ පාර තුල. ඒ පාර සංවර්ධනය කරන්න පුලුවන් හැකියාව ලැබුනා. ඒ වගේම සදරුස්ගම බටහේන්ගොඩ කඳු මාර්ගයක් තිබුනා. යන්නම බැරි ස්ථානයක් ඒත අවුරුදු 15 කින් විතර පස්සෙ ජේසීබී යන්ත්‍රයක් දාලා සංවර්ධනය කිරීමේ හැකියාව ලැබුනා. ඒ වගේම උඩුගම ඩිපෝව ලග සිට අපේ තරංග මන්ත්‍රීතුමා කොන්ක්‍රීට් ටිකක් දාල තිබුනා. ඔයිට කලින් එතුමාට ලැබිච්ච ප්‍රතිපාදන තුල එතන ඉදලා දවුල්හේන මාර්ගයට සම්බන්ධ වෙන ලගම පාර තියෙන්නෙ ඒ ස්ථානයේ. ඒකත් අපි සංවර්ධනය කළා. ඒ වගේම කුරුන්ද ප්‍රජා ශාලාව අසල යාමට හැකියාව තිබුනෙ නැහැ. ඒ ස්ථානයත් කානු පද්ධතියක් සකස් කරලා පුලුවන් ආකාරයෙන් පැය 80 ක් උපරිම ප්‍රයෝජනය අරගෙන අපට සංවර්ධනය කිරීමේ හැකියාව ලැබුනා. ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දුන් ඔබතුමාට ස්තුතිය ප්‍රකාශ කරමින් ඉහත කරුණු පිළිබඳව මා අදහස් දැක්වූ කරුණු පිළිබඳව වඩ වඩාත් විශ්ලේශනයට ලක් කොට, මා යොමු කළ ප්‍රශ්න තුල ඒවට පිළිතුරු ඉතා

ඉක්මනින්ම ලබා දෙයි කියන විශ්වාසයෙන් ඔබතුමා ඇතුලු සියලු දෙනාටම සුබම සුබ සිංහල අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තූතියි.

**ගරු සභාපතිතුමා පිලිතුරු දෙමින්,**

ගරු මන්ත්‍රීතුමා සංදේශ, පෙත්සම් පැමිණිලි යටතේ උඩුගම වෙළඳ සංගමය ඉදිරිපත් කරපු අනවසර කඩ ඉවත් කිරීම සම්බන්ධව ඒ වෙලාවෙ කතා කරන එක ප්‍රශ්නයක් නෙවෙයි. නීති රීති වලට පටහැනිව අපි හැමදේම කතා කරනවා. ඒක ඉදිරිපත් කරන වෙලාවෙ නෙවෙයි. ඒක ඉදිරිපත් කලාට පසුව තමයි. ඒක සාකච්ඡාවට බඳුන් කරලා තීරණ ගන්නෙ. දැන් අපට ඒක කරන්න පුලුවන්. අනවසර කඩ ඉවත් කිරීම අපි අද ඉඳලම ක්‍රියාත්මක කරන්නම්. මෙහෙමයි සභාවෙන් අපි නීත්‍යානුකූලව වැඩ කටයුතු කරනවා. නැවත අනේ අපේ මිනිහෙක් ඔහොම කරන්න එපා කියලා ඔබතුමාල කෝල් කරන්න එපා. අනවශ්‍ය ඉදිකිරීම් ඉවත් කරන්න ගියාම අනේ මහත්තයො මේ අපේ මිනිහෙක් මොකක්ද මේ කරන්නෙ කියලා අපේ මන්ත්‍රීතුමාලම අපට කතා කරනවා. එහෙම කතා කරන්න එපා. මම නීතිය ක්‍රියාත්මක කරන්නම්. මොකද මගේ කවුරුවත් නෙවෙයි. අනවසර ඉදිකිරීම් ගමේද, ගමෙන් පිටද කියලත් බැහැ. නීතිය එකයි. ඒක දැන් ක්‍රියාත්මක කරන්න පුලුවන්.

ඒ වගේම උඩුගම නගරයේ වැසිකිලි පද්ධතියක් සකස් කරන්න ස්ථානයක් දෙනවනම් හෙටම පටන් ගන්නවා. ස්ථානයක් දෙන්න. අපි නීත්‍යානුකූලව කරන දෙයක් කරමු. එතකොට ඉස්සර නීතියට පිටින් දේවල් කරල තියෙනවා. මම ඒවට උත්තර බඳිමින් ඉන්නෙ. ගන්න පුලුවන් ස්ථානයක් පිළිබඳව ඔබතුමාලා කතා කරලා බලන්න. අපි කැමතියි වැසිකිලියක් හදනවනම්. එතන ඉඳල මීටර් 500 ක් 600 ක් දුරින් හදලා වැඩක් නැහැ. ඒ අවටම තියෙන්න ඕන. මාපලගම වැසිකිලියක් ග්‍රවුන්ඩ් එකේ හදන්නෙ නැහැ. දුර වැඩියි කියලා. මේ ප්‍රායෝගික ප්‍රශ්න. මේ නාගොඩ නගරයේ වැසිකිලියට ස්ථානයක් නැහැ. යටලමත්ත නගරයේ නැහැ. අපි යෝජනා දාලා තියෙන්නෙ. ස්ථාන නැති කම තමයි තියෙන්නෙ. නැත්නම් සභාවෙන් වුනත් කරන්න පුලුවන්. පහුගිය දවස්වල මාපලගමට වැසිකිලියක් සඳහා ලක්ෂ 100 ක් වෙන් කළා. නමුත් ආපහු ගියා. ලක්ෂ 35 ක් සැරයක් ආවා. ඊට කලින් ගියා. හදන්න තැනක් නැතුව. එක තැනක හදන්න හදන කොට, විරෝධතාවක් දැක්වුවා.

අජිත් මහත්තයා සභාවෙ සභාපතිධූරය දරද්දි, උඩුගම ටොයිලට් එකක් හදන්න උත්සාහ ගත්තා. අපි ඕක දැන් යෝජනාව හැටියට සම්බන්ධී කරණ කමිටුවට යොමු කරමු.

උඩුගම පොළ සංවර්ධනය සඳහා ලක්ෂ පහක ප්‍රතිපාදන වෙන් කරලා තියෙනවා. යථා කාලෙදි තවත් ලක්ෂ පහක් එනවා. තවම වැඩ අවසන් නැහැ. දැන් මුදලාලිලා කඩත් අල්ලගෙන තියෙන්නෙ. එයාලට මම ඒව දෙන්නෙ නැහැ. යම් කිසි ක්‍රමයකට වෙනම කඩ වෙන් කරල දෙන්නෙ. දැන් ඉන්න විදිහට නෙවෙයි ඒක වෙන්නෙ. ඒක මගේ පෞද්ගලික වුවමනාවකට නෙවෙයි. යථා කාලෙදි සම්පූර්ණම පොළ සංවර්ධනය වෙනවා. දැනට ඔය අර තාවකාලික එක එක විදිහට කඩවල් වලට ඇතුල් වෙලා තියෙනවා. ඒ පොල බදු කරුත් එක්ක හිතවත් කමට. ඒක කරන්න දෙයක් නැහැ. දැනට අනුමත වී ඇති ප්‍රතිපාදන වලින් අවුරුද්දෙන් පස්සෙ මැයි ජුනි වෙනකොට සම්පූර්ණ පොල අවසන් කරල දෙන්න පුලුවන්. ජලය ලබා ගැනීම සඳහා මුදල් බැඳීමටත් කටයුතු කළා. වැසිකිලි කැසිකිලි පද්ධතියට ජලය ලබා දීලා, ඒව සුද්ද පවිත්‍ර කරලා කටයුතු කරනවා. ජුනි වලින් ඉස්සර වෙලා වැඩ කටයුතු කරනවා. ඔබතුමාලත් ගිහිල්ල උනන්දු වෙන්න බලන්න මෙන්න මේක හරියට කෙරෙනවද නැද්ද කියලා. අපේ මිනිස්සු ගිහිල්ලා හරියට කරනවද නැද්ද කියලා, සොයලා බලන්න. මොකද මට විතරක් ඒ කටයුතු කරන්න බැහැ.

මන්ත්‍රීතුමා හෝමදොල ත්‍රීවිල් රථ සංගමය මගින් කරන ලද ඉල්ලීමට අනුව, මම එදා උඩුගම පොළ ළඟට ගිය වෙලාවෙ ඒ ත්‍රීවිල් අය අපිත් සමග කතා කළා. මම කිව්වා ලියුමක් ඉදිරිපත් කරන්න කියලා. අර එතන ඉස්සරහ තට්ටු දෙකට කඩ පේලියක් ගහන්න. අපේ ඔබතුමාල කාගෙත්

යෝජනාවක් හැටියට තියෙනවා. දැන් පොල ඉවත් වුනාට පස්සෙ අන්න ඒ හරියෙ තමයි ඔය ත්‍රීවිල් අය ඉල්ලන්නෙ. මට ඉතිං සියලු දෙනත් එක්ක සාකච්ඡා කරලා තමයි ත්‍රීවිල් සංගමයට ඒක දෙන්න ඕන. මොකද එහෙම සේවයක් සලසා දීම අපේ යුතුකම. ඒක සාකච්ඡා කරල කටයුතු සුදුසු විදිහට කරමු.

ගරු මන්ත්‍රීතුමනි, පොළ සම්බන්ධ නඩුවට මට ඍජු පිළිතුරක් දීමට නොහැකියි. අපි කරන්න ගිය එකට පටහැනිව දෙයක් වීම තුල තමයි එතන පොලීසියෙන් ඇල්ලුවෙ. ඊට පස්සෙ ඔබතුමා මේ සභාවෙ ප්‍රකාශ කළා. මම ඒක වගකීම භාර ගන්නවා, මම ඒ නඩුවට යනවා කියලා. දැන් අපි ඒ නඩුවට මැදිහත් වෙන්න බලමු. නමුත් ඔබතුමාම මෙතන ප්‍රකාශ කළා මම ඒකට මැදිහත් වෙලා ඒක බලා ගන්නවා කියලා. ඊලගට දැන් ඔය එක එක ප්‍රශ්නවලදී අපට ඒවයි වගකීම භාර ගන්න බැහැ. ගරු මන්ත්‍රීතුමා නමුත් අපි උත්සාහ ගමු. ඕක සභාවෙ දේකට ගියාට වෙනත් ආකාරයකට වැඩේ වුනේ. මට ඍජු පිළිතුරක් ඕකට දිය නොහැකියි. අපි සාකච්ඡා කරලා, කොමසාරිස්තුමාට යොමු කරලා, මොකක්ද මේකට වෙන්න ඕන පිළිතුර කියලා අපි කටයුතු කරමු. ඔබතුමාම මේ සභාවෙ ප්‍රකාශ කළා. ඒක නිසා මම ඒකට යථා කාලෙදි අපේ අදාල නිලධාරි සමග සම්බන්ධ වෙලා, විසඳුමක් ලබා ගැනීමට කටයුතු කරන්නම්. එතන සිදු වීම තුල යම් වරදක් වෙලා තියෙනවා. නමුත් කල්පනා කරලා, කතා කරලා, කටයුතු කරමු. නැතුව මට ඍජු පිළිතුරක් දීමට හෝ භාර ගන්නවා කියලා කියන්න බැහැ.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ගෙන්, ලේකම්තුමියගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරන්න කැමතියි. මම උදේ ඔබතුමාට ලිපියක් භාර දුන්නා. ගරු සභාපතිතුමනි, හෝමදොල වතුයායේ වටවල වැවිලි සමාගම විසින් හෝමදොල ගම්මානයට පෙරපාසලක් හා ඩිස්පෙන්සරියක් ලබාදීලා ඒකෙ වැඩකටයුතු මේ වෙන කොට සියල්ලම නිම වෙලා ඉවරයි. පෙරපාසලට ලැබිය යුතු සියල්ලම ගෙනත් දාලා. ඒකෙ කිසිම අඩුපාඩුවක් නැතුව වටවල වැවිලි සමාගම විසින් අපට කරගෙන යන්න අවසර දුන්නා. ගරු සභාපතිතුමනි, ඒ ඉල්ලීම කළේ සභාව හරහා. ඒ පෙරපාසල ගෙනියන විදිහට තමයි. ගරු රමේෂ් පතිරන, ඉසුරු දොඩංගොඩ මැතිතුමාල ඇවිල්ලා තමයි ඒක විවෘත කළේ. එතනදිත් සභාව හරහා ඉල්ලීමක් කළා. මේ පෙරපාසල පවත්වාගෙන යන්න කියලා, ඔබතුමාට ඉසුරු මන්ත්‍රීතුමත් කතා කරලා සභාවට මේ පෙරපාසල පවරගෙන වැඩකටයුතු කරන්න කියලා කිව්වා. ඔබතුමාගෙන් හා සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරන්නෙ, ගරු සභාපතිතුමනි, කොට්ඨාස 15 ගත්තාම හෝමදොල කියන්නෙ පවුල් 700 ක් විතර ජීවත් වෙන ඉතා විශාල, අති දුෂ්කර ගම්මානයක්. ඒ ගම තුල කිසිම පෙරපාසලක් නැහැ. ගරු සභාපතිතුමනි, කිලෝ මීටර් අටක් විතර දුර එන්න ඕන. ඒ වතුකරයේ ඉන්න ළමයි පවා උඩුගමට එන්න ඕන පෙරපාසලකට. ඒ කුලී වැඩ කරන අම්මලා, තාත්තලා ඒ ත්‍රීවිල් රථයට රු. 1700.00 ක් ගෙවන්න ඕන. ඒක නිසා කිලෝ මීටර් අටක් විතර දුරට ඇවිල්ල තමයි පෙරපාසලකට දාන්න වෙන්නෙ. ඒ පෙරපාසල සභාවට ගන්න කියලා ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරනවා. ගරු සභාපතිතුමනි අපට එතනට මිස් කෙනෙක් දෙන්න, නිල ඇඳුම් ටික දෙන්න කියලා අපි ඉල්ලීමක් කරන්නෙ නැහැ. අපට ඒ දේවල් ඕන නැහැ. අපට ඒකෙ සභාවට පෙරපාසල විතරක් ගන්න කියන ඉල්ලීම විතරයි අපි කරන්නෙ. අපි ගුරුවරියගෙ පඩිය මොකක් හෝ ක්‍රමවේදයකට ලබා දෙන්නම්. අපිට නිල ඇඳුම් ටික අපිට එහෙම ඕන නැහැ ගරු සභාපතිතුමනි. ඒක නිසා ඒ පෙර පාසල සභාවට පවරා ගැනීම හරි කරන්න කියලා මම හෝමදොල මිනිස්සු වෙනුවෙන් සභාපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් මේ අවස්ථාව අපට ලබා දෙන්න. කොට්ඨාස 15 න් හෝමදොල කොට්ඨාසයට

පෙරපාසලක් නැහැ. තරංග මන්ත්‍රීතුමාලත් දන්නවා. ඇත්තටම අන්ත අසරණ දුප්පත් වතු කරයේ මිනිස්සු ටිකක් ඉන්නෙ. පවුල් හත්අට සීයක් ජීවත් වෙනවා. කිලෝ මීටර් හතක් අටක් දුර විතර ත්‍රී රෝද රථයෙන් තමයි පෙරපාසලට ළමයි ටික ගෙනියන්නෙ. ඒක නිසා අපේ යුතුකමක්, ලොකු පිනක් ගරු සභාපතිතුමනි, සභාපතිතුමාගෙ කාලෙ හරි මෙතනට පෙරපාසලක් ඇති කරල දුන්නොත්. ඒක නිසා ඒක මේ වෙලාවෙ ඉල්ලීමක් කරනවා. මම බලාපොරොත්තු වෙනවා. ඔබතුමාගෙන් මේකට උත්තරයක් ලැබෙයි. ඒ වගේම අපේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා. ඉතා ගෞරවයෙන් මේකට අනුමැතිය ලබා දෙන්න කියලා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, සම්බන්ධීකරණ කමිටු කීපයක කතා කළා. ගිය සභා වාරෙත් කතා කළා. උඩුගම පොලීසිය අසල සභාවෙ පාර මේ වෙන කොට වලවල් දෙකක් හාරලා මාස හත අටක් වෙනවා. නමුත් මේ වන තෙක් කිසිම ක්‍රමවේදයක් නැහැ. සභාපතිතුමනි, අපි දැන් සම්බන්ධීකරණ කමිටුවෙදි කතා කළා. ඒ වගේම සභාවෙ කතා කළා. අදාළ ආයතනවලට ලිපියක් යොමු කරලා තියෙනවනම්, අපටත් අදාළ ලිපියෙ කොපි එකක් ලබාදුන්න නම්, අපි වෙන තැන්වල කතා කරන්නෙ නැහැ. අපට සභාවෙන් දැනුවත් කිරීමක්වත් කරල තියෙනවයි කියලා මම දන්නෙ නැහැ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, හෝමදොල ප්‍රධාන පාරෙ ජන උදාන ගම්මානය අසල බෝක්කුව පාරත් එක්ක ගලවගෙන ගිහිල්ලා තියෙනවා. සම්බන්ධීකරණ කමිටුවෙදි කතා කළා. සභාපතිතුමා එතනදි භාර ගත්තා. මේක සභාවෙ පාරක් කියලා. මම මේ සභාවෙම ගිය සභා වාරෙ කතා කළා. වර්ෂා කාලෙ ආවොත් ලොකු විනාශයක් වන නිසා  මොකක් හෝ ක්‍රමවේදයක් ඇති කරල දෙන්න තව වර්ෂා දෙකක් ආවොත්, පාර ගලවගෙන යනවා. කාපට් එක අයිනටම ගැලවිලා තියෙන්නෙ.

ඒ වගේම  මම දැන ගන්න කැමතියි. ගරු සභාපතිතුමනි, 218 බී උඩුගම වසමෙ රබර් ෆැක්ටේරිය අසල තිබුණු පාලමේ යකඩ ටික කපලා, මම හිතන්නෙ විකුනලා තියෙනවා. එතනදි අපට කීප දෙනෙක් කතා කළා. ඔබතුමාටත් කතා කළා. ඔබතුමා මට දැනුවත් කළාට පස්සෙ, ඔබතුමා හරහා මම ගිහිල්ල පොලීසියෙ පැමිනිල්ලකුත් දැම්මා. නමුත් කිසිම ක්‍රමවේදයක් මේ වෙන කොට නැහැ. තාක්ෂණ නිලධාරී මහත්තයා ගිහිල්ලා බැලුවා. වෙච්ච දෙයක් මම දන්නෙ නැහැ. කිසිම ක්‍රමවේදයක් නැහැ. යකඩ ටික ගත්තද? නඩුවක් දැම්මද? පැමිණිල්ල විභාගයක් මොකක්වත්ම නැහැ සභාපතිතුමනි. අපි බලාපොරොත්තු වෙන්නෙ. මෙතනදි අපි රාජකාරි කරන්න ගියාට පස්සෙත් කිව්වෙ මෙතන කවුරු මේව වෙිද දන්නෙ නැහැ කියලා. නමුත් අපි නිවැරදිනම් ගරු සභාපතිතුමනි අපේ යුතුකමක් තියෙනවා. කවුරු කළත් කමක් නැහැ. සාධාරන විදිහෙ වැඩපිළිවෙලක් කරන්න. එතනදි පැමිණිල්ල දැම්ම එක විතරයි. ගරු සභාපතිතුමනි අපි කළේ. මොකක් වුනාද කියලා අපි දන්නෙ නැහැ. එක්කො අපි පැමිනිල්ල විභාග කරන්න ගෙන්වන ක්‍රමවේදයක් හදන්න ඕන. එක්කො නඩුවක් දාන්න ඕන. කැමර් තියෙනවා කැමර් චෙක් කරන්න ඕන. කැමර් ටික චෙක් කිරිලි මොකුත් නැහැ. සභාපතිතුමනි දැන් පැමිණිල්ල දාල සති දෙකක් තුනක් විතර වෙනවා. අපිව කැදවල පැමිණිල්ල විභාග කරලවත් මොකක්වත්ම ක්‍රමවේදයක් නැහැ. මම දන්නෙ නැහැ. මොන ක්‍රමයකට ඒක යට ගහලද, කෙරෙනවද, නැද්ද? කියලා. අපි දන්නෙ නැහැ. ඒක නිසා ඉතා ගෞරවයෙන් ඉල්ලීමක් කරන්නෙ. පොලීසියෙ දාපු එකම පැමිණිල්ල තමයි මම දාල තියෙන්නෙ. මගේ ඉතිහාසෙ මම කවදාකවත් මගේ වෙන පුද්ගලික ප්‍රශ්නෙකටවත් වෙන කිසි දේකට මම පැමිණිල්ලක් දාල නැහැ. මේ සභාව නිසා තමයි පැමිණිල්ල දාන්න වුනේ. ඒ නිසා ගෞරවයෙන් ඉල්ලීමක් කරන්නෙ. වංචාවක් කළානම්, එතන පක්ෂ පාට අපිට කවුරුත් අදාල නැහැ. අපේ කෙනෙක් වැරැද්දක් කළත්, ඒ දේට දඩුවම් දිය යුතුමයි. ඒක ගෞරවයෙන් ඉල්ලීමක් කරන්නෙ. අදම කතා කරල ඒකට මොකක්ද කරන්නෙ. මොකක්ද වුනේ. ඒක සියල්ලම ඔප්පු වෙලා ඉවරයි. යකඩ කඩේට බඩු ටික අරගෙන ගිහිල්ලා. ඒ මිනිස්සුත් කියනවා ගෙනාවයි කියලා. ගරු සභාපතිතුමනි, පොලීසියෙන් යකඩ කඩේට ගිහිල්ල හොයන කොට බඩු ටික ගෙනත් දීපු කෙනාත් කිව්වා. ඒ පාර කට උත්තරත් දුන්නා. මේ අසවල් ලොරියෙ අරන් ගියාය කියලා. මම දන්නෑ මොකක්ද කියලා. සභාපතිතුමාගෙ යුතුකමක්

තියෙනවා. මේක හොයල බලන්න. අපිත් උප කාර්යාලයට ගිහින් බැලුවා. ඒක නිසා මම දන්නෑ අපේ යුතුකම අපි කරල තියෙනවා. මේක වාර්තා ගත වෙන හින්දා අපි අපේ යුතුකමත් ඉෂ්ඨ කරන්න ඕන. සභාපතිතුමාගෙ වගකීමක් යුතුකමක් තියෙනවා. මේක පැමිණිල්ලක් දැම්මනම් මොකක්ද මේක හොයල බලල අඩුවක් තියෙනවනම් ඒකට නඩුවක් දාල කරන්න. දැන් සභාපතිතුමනි අපි දන්නෑ ඇත්ත කතාව. ඊට පස්සෙ ආරංචියක් තියෙනවා උප කාර්යාලයට තව බඩු ටිකක් ගෙනත් දාලයි කියලා. සභාපතිතුමනි, මම දන්නෑ මුරකාරයෙක් ඉදිද්දි කොහොමද මේ කටයුතු වෙන්නෙ කියලා. හොරකමක් වෙලානම් සභාපතිතුමනි, ඒකට මොකක් හරි කරන්න ඕන. සභාපතිතුමාගෙන් මම ඉල්ලීමක් කළා. මේ යකඩ ටික කපනවයි, පටවන්න හදනවයි කියලා මට ගමෙන් පැමිණිලි ආවා. මම සභාපතිතුමාට එවලෙම කතා කරල කිව්වා. සභාපතිතුමා මෙතන වැරැද්දක් වෙනවා. සභාපතිතුමා සභාවෙන් කවුරු හරි යවල බලන්න කියලා. සභාපතිතුමා එවලෙම කිව්වා. මෙහෙම දෙයක් වෙන්නෙ නැහැ. එහෙම වෙන්න විදිහක් නැහැ කියලා. මම ඉන්ජිනියට කතා කළා. ඉන්ජිනියත් කිව්වා එහෙම වෙන්නෙ නැහැ කියලා.

ගරු සභාපතිතුමනි මගේ නමින් පැමිණිල්ල දාන්න කලින් මම ඔබතුමාගෙන් කතා කරල ඇහුවා. ඔබතුමා පොලීසියට උපදෙස් දුන්නා මෙන්න මේ විදිහට කරන්න කියලා. නමුත් මම දන්නවා සභාවේ යම් කිසි ක්‍රමවේදයකට සිද්ද වෙන්නෙ නැහැ කියලා. මේක මොකක්දෝ අපි දන්නෙ නැහැ. සභාපතිතුමා හොරකමක් කළාය සභාව හොරකමක් කළාය කියල නෙවෙයි මම ඒ කිව්වෙ. නමුත් සභාවෙන් කිසිම ක්‍රමවේදයක් නැතුව වැඩපිළිවෙලක් යයි කියලා අවිශ්වාසයක් තිබුනා. සභාවෙන් හෙව්වෙ නැතොත් පැමිණිල්ල දැම්මට පස්සෙ ඒක හොර ගොඩ යනවා. ඒක නවත්වන්න බැහැ. දැනටත් ඒකනෙ වෙලා තියෙන්නෙ. සභාපතිතුමාත් හොර කරන්නෙ නැහැ. අපේ නිලධාරිත් හොර කරන්නෙ නැහැ. ඒක අපි පිළිගන්නවා. අපේ ලේකම්තුමිය හොර කරන්නෙත් නැහැ. නමුත් සභාපතිතුමා සභාවෙන් හොයල වැඩක් කරන්නෙ නැති වුනහම ඒ අය ගහන්න තියෙන මුක්කු ටික ගහගන්නවා. ඒක නිසා එකදවසක් කූඩු කරලත් හිටියා. ගරු සභාපතිතුමනි මම ඉල්ලීමක් කරනවා. උපකාර්යාලෙ අපේ කවුරු හරි මුර මහත්තයෙක් ඉන්නවනම්, මම දන්නෑ කවුද කියලා. දෙවනි පාර බඩු ගෙනත් දැම්මෙ කොහොමද? දෙවනිපාර භාර ගන්න පුලුවන්ද? ඒව හොයල බලල වැඩ කරන්න. ඒක එහෙම නැති වුනාම ගරු සභාපතිතුමනි අපේ යකඩ පාලම් ටික සියල්ලම කපාගෙන යනවා. තව යකඩ පාලම් දෙකක් තියෙනවා මගේ කොට්ඨාසෙ. ඒ ටිකටත් ඔය ටික වෙනවා. අපේ යුතුකම් ටික ගරු සභාපතිතුමනි මම කරලා තියෙනවා. මේව වාර්තා ගත වෙනවා. මම ගෙනියන්න යකඩ ටික කපන කොට ඔබතුමාට කතා කරල කිව්වා මෙහෙම දෙයක් වෙනවයි කියලා. ඒ නිසා අපේ යුතුකම් ටික කරල තියෙන්නෙ. ඔබතුමාගෙ යුතුකම් ටික කරනකම් අපි බලාගෙන ඉන්නවා. ඒක නිසා ඒක මතක් කරන ගමන්ම, ඉල්ලීමක් කරන්නෙ. අපට ඊලග සභා වාරෙ වෙද්දිවත් මේකෙ හොරු ටික අල්ලලා සභාවට වුන පාඩුව පියව ගන්න වැඩපිළිවෙලක් කරල දෙන්න. සභාවෙ සියලු මන්ත්‍රීවරු බලාපොරොත්තු වෙනවා. ඔබතුමාගෙ සාධාරණය. ඒකත් මතක් කරන ගමන්ම ඔබතුමාට ස්තූතිය ගෞරවය පුද කරන්න ඕන. කොට්ඨාස 15 ට ලක්ෂ දෙක ගනනෙ ඔබතුමා ලබා දුන්නා. ගරු සභාපතිතුමනි, මම රු. 95000.00 ක මේ වෙන කොට ජේසීබී යන්ත්‍ර යොදාගෙන දුෂ්කර පාරවල් කීපයක් ජේසීබී කර ගන්න මට අවස්ථාව සලසා දුන්න ඔබතුමාට මගේ ගෞරවය ස්තූතිය මේ වෙලාවෙ පුද කරන ගමන්ම, මම නැවත වාරයක් ගෞරවයෙන් ඉල්ලීමක් කරන්නෙ. ගරු සභාපතිතුමනි පෙරපාසල සභාවට පවරා ගන්න. ගරු සභාපතිතුමනි ඒක ගෞරවණීය ඉල්ලීමක්. හෝමදොල මිනිස්සුන්ට කරන ලොකු යුතුකමක්. සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රී මණ්ඩලයෙන් මම ඉල්ලීමක් කරන්නෙ. මට එකට අවස්ථාව සලසා දෙන්න කියන ගෞරවණීය ඉල්ලීම කරමින් සියලු දෙනාට සුබ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ගරු මන්ත්‍රීතුමා මේ වන විට උඩුගම පොලීසිය අසල පාර සම්බන්ධයෙන් ස්ථානීය පරික්ෂාවක් සිදු කර, ඇස්තමේන්තුවක් හදලා, අදාල ආයතනයට යවල තියෙන්නෙ. හෝමදොල ප්‍රධාන පාරෙ ජන උදාන ගම්මානය අසල බෝක්කුව සම්බන්ධයෙන්, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ඇවිල්ලා නිරීක්ෂණය කර එය සකස් කර දෙන බව ප්‍රකාශ කළා. ඔබතුමාටත් මතක ඇති.

මම සමන් මන්ත්‍රීතුමාගෙ හෝමදොල පාලමේ ප්‍රශ්නෙට උත්තරයක් දෙනවා. ගරු මන්ත්‍රීවරුනි මේක දැනුවත් වෙන්න. පසුගිය දවසක සමන් මන්ත්‍රීතුමා දූරකතනෙන් කතා කරලා සභාපතිතුමා පාලමක් ගලවන්න කිව්වද? ඇහුවා. මම කිව්වා නෑ මම දන්නෙ නෑ කියලා. මම ඇහුව කොහේද කියලා. බංගම පාරෙයි කිව්වා. මම කිව්වා එහෙම එකක් නැහැ. බංගම පාරෙයි කිව්වහම, මම පීආර්ඩී එකෙන් ඇහුවා. එස් පීආර්ඩී එකට කතා කළා. ඔබතුමාල පාලමක් ගලවනවද? කියලා. නැතෙයි කිව්වා. මම දන්නෙත් නැහැ. ඔය පාලම තිබුන තැන. ඊට පස්සෙ ග්‍රාමීය පාලම් අංශෙ ඉංජිනේරුතුමියගෙන් ඇහුවා. හෝමදොල පාරෙ දාන පාලමද කියලා. නැහැ කිව්වා. ඊට පස්සෙ මම සමන් මන්ත්‍රීතුමාට ආපහු කතා කරලා මෙහෙම එකක් දැනගන්න නැහැ. ඔබතුමා ගිහින් බලන්න කියලා කිව්වා. එදා හවස සභාවෙන් කවුරුවත් එවන්න කෙනෙක් හිටියෙ නැහැ. ඒ පාර මම මුර කරන සම්පත්ට කතා කළා. සම්පත් නෝනත් එක්ක ඉස්පිරිතාලෙ ඉන්නවයි කිව්වා. ඒ වෙලාවෙ මට කරන්න දෙයක් නැහැ. ඊට පස්සෙ මම අපේ වනිගරත්න මන්ත්‍රීතුමාටත් කතා කරල කිව්වා. මේක ගිහිල්ලා බලන්න කියලා. මොකද මට එන්න විදියක් නැහැ. මම ඈත මළ ගෙදරක ගිහින් හිටියෙ. ඒ නිසා තමයි ඒ විස්තර බලලා, ඔබතුමා පොලීසියෙ ඇන්ට්‍රිය දාන්න කියලා කිව්වෙ. ඔබතුමා බොහොම අකමැත්තක් දැක්වුවා. මම කිව්වා බය වෙන්න එපා ඔබතුමා ඇන්ට්‍රිය දාන්න. ඒ පාර මම ඕඅයිසී මහත්තයට කතා කළා. ඕඅයිසී මහත්තය හිටියෙ නැහැ. වැඩබලන නිලධාරීතුමා හිටියෙ. මම කිව්වා. අපේ බල ප්‍රදේශයේ පාලමක් හොරෙන් ගලවලා, දැන් සමන් මන්ත්‍රීතුමා ඒ සම්බන්ධව පැමිණිල්ලක් කරන්න පොලීසියට එයි කියලා. මම පොලීසියට කිව්වා ඒ සම්බන්ධව සොයා බලා රාජකාරි කරන්න කියලා. ඊට පස්සෙ ඒ අදාල ආයතනෙ කවුරු හරි ඔබතුමත් එක්ක කතා කරලා වෙලාවක් ඉල්ලනවයි කියලා, ඔබතුමා කතා කරල කිව්වා. පාලම හදපු ඉංජිනියර් කියල එක්කෙනෙක් කතා කළේ. මගෙන් වෙලාවක් ගන්න. උපකාර්යාලයට ගෙනත් දාන්න. ඊට පස්සෙ තමයි මම සම්පත්ට කතා කරල යකඩ වගයක් ගෙනෙයි. භාර ගන්න කියලා කිව්වා. කෑලි කීපයක් භාර දීල තියෙනවා. ඊට දවස් තුනකට පස්සෙ මට කීප දෙනෙක්ගෙන් දූරකතන ඇමතුම් ලැබුණා. සභාපතිතුමා මේ මොකද පාලමේ යකඩ කපලා. යකඩ කොයිද? ඊට පසු මට ලියුමකුත් ආවා මහාසේන කියලා කෙනෙක්ගෙන්. ගලවපු යකඩ කෝ කියලා. වනිගරත්න මන්ත්‍රීතුමත් ගිහින් බැලුවා. කොහොම හරි හොරකමක් වෙලා. දැන් නීත්‍යානුකූලව වැඩකටයුතු කෙරීගෙන යනවා. තාක්ෂණ නිලධාරී යවලා යකඩ ටික මැනීම් කරලා, මම පරීක්ෂණයක් කරනවා. හොරකමක් සිදු වී ඇත්නම්, ඊට අදාළ අයට නීතියෙන් දඩුවම් ලබා දෙනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. කතා කරන්න නොහිටියත් කතා කරන්න ඕන කියලා හිතුනා. මොකද පහුගිය අප්‍රේල් හතර වෙනිද වෙන කොට කතා කරලා අවුරුදු තුනක් වෙනවා. මීට දවස් දෙකකට පෙර තමයි අපි ඉස්සෙල්ලම මංගල සභාවාරය විදිහට අපි නාගොඩ ප්‍රාදේශීය සභාවට රැස් වුනේ. අපි ජීවිතේ පළවෙනි වතාවට මන්ත්‍රීවරු විදිහට මෙතනට ආවෙත් පහුගිය වසර තුනකට ඉහතදී, හරියටම අදට වසර තුනකුත්, දවස් දෙකක් තමයි ගෙවිල තියෙන්නෙ. ඉතිහාසයත් එක්ක කතා කරද්දි එදා අපි 2018 පෙබරවාරි 10 වෙනිද තිබුන ප්‍රාදේශීය සභා මැතිවරණෙන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු විදිහට පත්වෙලා, අවුරුදු තුනක් ආපස්සට හැරිල බලද්දි, ඇත්තටම අපට තියෙන්නෙ, විශාල කණගාටුවක්. විශාල කලකිරීමක්. ඒ වගේම මන්ත්‍රීවරු විදිහට වෙන්න ගත්ත තීරණය. ජීවිතේ කරපු ලොකුම ගොංකම කියල තමයි මම මේ අවුරුදු තුනේදි දකින්නෙ. මම බය නැතුව චෝදනාව එල්ල කරනවා. ගරු සභාපතිතුමනි ඒකට ප්‍රධාන හේතුව ඔබතුමා. නාගොඩ ප්‍රාදේශීය සභාවේ

මන්ත්‍රීවරු විදිහට වෙන්න ලැබීම පහුගිය අවුරුදු තුනක් ගත කරන්න ලැබීම ඉතාමත්ම කණගාටුවට කරුණක් බවට පත් වෙන්න අපට ප්‍රධානම හේතුව ඔබතුමා. විශේෂයෙන්ම ඔබතුමා අද ඔය පුටුවෙ වාඩිවෙලා ඉන්නවා. කිසිම සදාචාරාත්මක අයිතියක් නැහැ. ඔබතුමාට මේ පුටුවෙ වාඩි වෙලා ඉන්න. මම කතා කරන්න නෙවෙයි හිටියෙ. නමුත් කතාකරන්න සිද්ධ වුණා.

මම පැහැදිලි කරන්නම්, ගරු සභාපතිතුමා. සභාවෙ සභාපතිධුරය පත්කර ගැනීමේදී. ගැටලුවක් ඇතිවුනා. ඒ ගැටලුව ඇති වුන වෙලාවෙ. ගාල්ල දිස්ත්‍රික්කයේ ආසන සංවිධායකවරු, නාගොඩ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන ආසන සංවිධායකවරු දෙදෙනා, ගාල්ල දිස්ත්‍රික් නායකතුමා, පක්ෂයේ ඉහල නිලධාරීන් සහ නාගොඩ ප්‍රාදේශීය සභාවෙ පොදුජන පෙරමුණ නියෝජනය කරන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු 15 දෙනා ඉදිරියෙදි තීන්දුවක් ගත්තා. මේක වසර දෙක බැගින් කරන්න. ඔබතුමා අපි සියලු දෙනා ඉදිරියෙ ගිවිසුම් ගතවුනාද? නැද්ද? කියන්න මම දන්නෙ නැහැ. නමුත් සදාචාරාත්මකව ඔබතුමා එකඟ වුනා. නාගොඩ ප්රාදේශීය සභාවෙ වසර දෙකක කාලයකට පළවෙනි සභාපතිධුරය හොබවන්න. එතනදි ඔබතුමා සභාපතිධුරයේ දැන් වසර දෙක ගෙවිලා ඉවරයි. වසර තුනක් වෙනවා. ඔබතුමාට කිසිම සදාචාරාත්මක අයිතියක් නැහැ. ඔය පුටුවෙ වාඩිවෙලා ඉන්න.

ඊට පස්සෙ දෙවනි කාරණය පැහැදිලි කරන්නම්. පහුගිය දවසක පක්ෂයේ සියලු දෙනා කැදෙව්වා. කැදවල පක්ෂය පැහැදිලි තීන්දුවක් දුන්නා. ඔබතුමාට අයින් වෙලා, ගිවිසුම් ගත වුන විදිහට, පක්ෂයේ නායකත්වය නියෝජනය කරන චමල් රාජපක්ෂ මැතිතුමා මේ මන්ත්‍රීවරු 15 දෙනා ඉදිරියෙදි නියෝගයක් දුන්නා. ඔබතුමාට අයින් වෙලා අනෙකුත් තැනැත්තට සභාපතිධුරය දෙන්න කියලා. එතකොට ඒ නියෝගය ඔබතුමා අනුමත කළෙත් නැහැ. සදාචාරයක් නැද්ද ඔබතුමා ඔය පුටුවෙ වාඩි වෙලා ඉන්නවා. ඒ විතරක් නෙවෙයි ගරු සභාපතිතුමා සමාජයේ අපේ ගම්වල ඇති වෙච්ච ප්‍රශ්නවලදි ඒ පැත්තට මේ පැත්තට ප්‍රශ්නවලට උත්තර දාලා, දැන්මේ සමන් මන්ත්‍රීතුමා කටයුතු කරපු විදිහ ඒ යකඩ ටික ගේන්න බැහැ සභාවට. ඒ යකඩ ටික සභාවට ගේනවනම් සම්පූර්ණ මුලින්ම ගෙනැල්ල දාපු එකම වැරදියි. සභාවට භාර ගත්ත විදිහත් වැරදියි. සභාවට භාරගන්නවනම්, ඒ පාලමේ තියෙන යකඩ ප්‍රමාණය නිරීක්ෂණය කරලා, විධිමත් විදිහට සභාවට භාර ගන්න ඕන. සභාපතිට සහ සභාවට තමයි ඒ අයිතිය තියෙන්නෙ. හැම වෙලේම කරන්නෙ ප්‍රශ්නෙ කාගෙ හරි පිටේ දාලා,' ගැටලුවක් ඇති වෙද්දි වෙන කොහේට හරි යොමු කරලා, මේ සභාව හැල්ලුවට ලක් කරලා, මේ මන්ත්‍රීවරුත් හැල්ලුවට ලක් කරලා, විශේෂයෙන් දේශපාලනය කරන්න අපට තිත්ත කරල තියෙන්නෙ. සභාවෙන් කියලා අපට එක ලයිට් එකක් දාගන්න, වතුර බවුසරයක් අරගෙන ගිහිල්ල අසරණ මනුස්සයෙකුට දෙන්න වගේ, කිසිම සහයෝගයක් නැහැ. සදාචාරයක් නැතුව පුටුවෙ වාඩිවෙලා ඉන්න ගමන්, මේ ප්‍රදේශයේ මුදල් ටික කාබාසිනියා කරමින්, මතක තියා ගන්න හොර කම් නොකරනවා වෙන්න පුලුවන්. හොරකම් කරන ඒවත් අපි ඉදිරියෙදි ඉදිරිපත් කරන්නම්. නමුත් හොරකම් වෙනකම් බලාගෙන ඉන්න එකත් වැරදියි. හොදට මතක තියා ගන්න නාගොඩ ප්‍රාදේශීය සභාවෙ එලියට බැහැල අහන්න ඕන මනුස්සයෙක්ගෙන් නාගොඩ ප්‍රාදේශීය සභාව ගැන මොකක්ද ඔය ගොල්ලන්ගෙ ආකල්පය කියලා. එයාලා හොද උත්තර දෙනවා.

මන්ත්‍රීවරුන්ටත් ඒ චෝදනාව ඒ විදිහටම කරනවා. මේ දේ වෙලා තියෙන්නෙ මතක තියා ගන්න. 100% සම්පූර්ණයෙන්ම සභාපතිතුමාගෙ වැරැද්ද. සභාපතිතුමාගෙ කිසිම කළමණාකාරිත්වයක් නැහැ. කිසිම සදාචාරයක් නැති විදිහට මේ වැඩ කරන්නෙ. පහුගිය දවසක ලක්ෂ දෙකක් දීල අපට කියනවා. ඒකෙන් 150,000 ක වැඩ කරන්නලු. අනිත් ටිකේ ලයිට් ටික දාගන්නලු. සභාවට කෝටි ගණන් සල්ලි ඇවිල්ල තියෙනවා. මේ අවුරුදු හතරටම ලකෂ තුනයි මන්ත්‍රී කෙනෙකුට දීල තියෙන්නෙ. මැතිවරණයකදි අපි මොකක්ද කියන්නෙ. මිනිස්සු අහන ප්‍රශ්නවලට අපි උත්තර දෙන්නෙ කොහොමද? මේ විදිහට ලැජ්ජ නැති වැඩ කරන්න එපා සභාපතිතුමනි. මේ ප්‍රාදේශීය සභාවෙ මන්ත්‍රී ධුරය හැල්ලුවට ලක් කරල තියෙන්නෙ. ප්‍රාදේශීය සභාව විතරක් නෙවෙයි මන්ත්‍රීවරු

විදිහට අපෙත් ආත්ම ගරුත්වය නැති කරල තියෙන්නෙ. මම මේ ප්‍රාදේශීය සභා වාර කීපයකදිම කතා නොකර ඉන්න හදලා, මේ සමන් මන්ත්‍රීතුමාට වෙච්ච දේට හෝමදොල හදල දීල තියෙන මොන්ටිසෝරිය ප්‍රාදේශීය සභාවට පවර ගන්න සභාපතිතුමාට බැහැ. හගරංවල පෙරපාසලේ පාලිකාවට පඩි ගෙවන්න සභාවට බැහැ. මොකක්ද මේ සභාවෙ තීරණ. ඔබතුමාගෙ වාහනේට තෙල් ගහන ටිකයි. ඔබතුමා එහෙට මෙහෙට මළ ගෙවල්වල යන ටිකයි විතරක් නෙවෙයි. සභාවෙ කරන්න තව වැඩ තියෙනවා. මේ ප්‍රාදේශීය ග්‍රාම නිලධාරී කොට්ඨාස පනස් ගණනක් තියෙන සභාවක් මේක. මොකක්ද කරල තියෙන්නෙ අද මේ පනස් ගණනටම සභාව තනිකරම කාබාසිනියා කරපු එක විතරයි කරලා තියෙන්නෙ. කරුණාකරලා ඔබතුමාට කියන්නෙ. ඔබතුමාට ආත්ම ගරුත්වයක් තියෙනවනම් ඔබතුමා වැදගත් මනුස්සයෙක්නම්, ඔතනින් බැහැලා එදා ඒ පොරොන්දු වෙච්ච විදිහට පක්ෂ නායකයො කියපු විදිහට ආසන සංවිධායක වරු දිස්ත්‍රික් නායක වරු කියපු විදිහට කටයුතු කරන්න කියන එක මතක් කරන ගමන් මම නිහඬ වෙනවා බොහොම ස්තූතියා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

මට සභාපති පුටුවෙ වාඩිවෙලා ඉන්න බැහැ කියලා ඔබතුමා කියන්නෙ කොහොමද? එහෙමනම්, ඔබතුමාටත් ඔය පුටුවෙ වාඩිවෙලා ඉන්න බැහැ. අවුරුදු දෙක අවසානයේ මට ඉවත් වෙන්න කියලා නියෝගය දුන්නනම්, මම ඉවත් වෙනවා. මට ඒ නියෝගය දෙන්න. මට නියොගෙ දුන්නොත් දැන් මම අයින් වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි, පුංචි අදහසක් දැක්වීමට අවසරයි. පළවෙනි කාරණය විශේෂයෙන් සභාපතිතුමනි, ප්‍රාදේශීය සභා පනතෙ මූලික අංගයක් සංකල්පයක් හැටියට තියෙන උපන් මොහොතෙ ඉඳලා මළගම දක්වා සියලු අවශ්‍යතාවයන් ඉටු කරන්න ප්‍රාදේශීය සභාව බැඳී ඉන්නවා. ඒ නිසා මම මේ වෙලාවෙ අදහසක් හැටියට ඉදිරිපත් කරනවා. සමන් මන්ත්‍රීතුමාගේ ප්‍රදේශයේ ආරම්භ කරපු පෙරපාසලේ දරුවොත් මේ රටේ අනාගත පරපුර වෙනුවෙන්, ඒ දරුවන්ගේ අනාගතය වෙනුවෙන්, විශේෂයෙන් අපේ ප්‍රදේශීය බල සභා ප්‍රදේශයේ අනාගතය සමහර විට ඔය පෙරපාසලේ ඉන්න දරුවෙක් මේ සභාව මෙහෙයවන කෙනෙක් බවට පත් වෙන්නට යම් වෙලාවක ඉඩ තියෙනවා. ඒ නිසා ඒ දරුවන්ට ඒ අවස්ථාව සලසලා දෙන්න. මම මගේ කැමැත්ත පළ කරනවා. මම හිතන්නෙ අනිත් මන්ත්‍රීවරුත් මෙවැනි කටයුතුවලට කිසි කෙනෙක් පක්ෂ බේදයකින් තොරව සහය දක්වයි කියන කාරණය මම මේ වෙලාවෙ සඳහන් කරනවා. ඒ නිසා මම කාරුණික ඉල්ලීමක් කරනවා. සභාපතිතුමා ඒ පිළිබඳ අවධානය යොමු කරලා ඒ පෙරපාසලේ කටයුතු, මම හිතන්නෙ බරක් එන්නෙ නැහැ සභාවට දැනට ඒ බරක් එන්නෙ නැති නිසා, ඒ කාරණය ඉෂ්ඨ කරන්න කියන කාරණය ඔබතුමාගෙන් ඉල්ලීමක් හැටියට මේ වෙලාවෙ මමත් කරනවා.

ඒ වගේම සභාපතිතුමනි, අපේ වෙරංග මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි නැවත නැවතත් මටත් සිහිපත් කරන්න වෙන්නෙ. මම හැමදාම කියන දෙයක් තමයි. අපිට සකස් කරන්න බැරි මොකක් හෝ අඩුපාඩුවක් මේ නිලධාරී තන්ත්‍රය තුල තියෙනවා. ඒක අපේ ප්‍රාදේශීය සභා මට්ටමෙනුත් තියෙනවා. මහ ආණ්ඩුවෙ මට්ටමෙනුත්, ප්‍රධාන ආණ්ඩුවෙ මට්ටමෙනුත් තියෙනවා. ඒ නිසා ඒවයි පළ විපාක අද අපට පේනවා. සමහර නිලධාරීන් තම තමන්ගේ ඒ කරන කාර්යයන් දිහා බැලුවම කිසිසේත්ම මන්ත්‍රීවරු හැටියට අපට අනුමත කරන්න බැරි දේවල් ඉහල නිලධාරීන්ගෙන් වෙනවා. මේවයි මේ තියෙන අඩුපාඩුව නිසා අවසානයේ ඒ නිලධාරීන් නෙවෙයි. මේකෙ වැරැද්ද භාර ගන්න වෙන්නෙ. රජයට තමයි අවසානයේ වැරැද්ද භාර ගන්න වෙන්නෙ. ඔබ දන්නවා අද සමාජ ගත වෙලා තියෙන ඔය සියලු ප්‍රශ්න දිහා බැලුවහම, ඒ හැම එකකම අවසානයේ වැරැද්ද වෙලා තියෙන්නෙ නිලධාරීන් අතින්. අවසානයේ දොශාරෝපනය සහ ඒ වැරැද්ද යන්නෙ අතිගරු ජනාධිපතිතුමා මාර්ගයෙන් රජයට. ඒ නිසා මේ යාන්ත්‍රණයේ තියෙන දෝශය අපි දකිනවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙදි

කතා කරපු කාරනා ගොඩක් තියෙනවා. මම අදත් නැවත වරක් මම හිතන්නෙ අද මේ කතා කරන්නෙ. පස්වෙනි වතාවට විතර වෙන්න ඇති. මේ යාන්ත්‍රණය සකස් කරන්න බැරි ගැටලුවක් මතු වෙලා තියෙනවා. ඒකෙ එක කාරණයක් මම නැවත සිහිපත් කරන්නෙ ඔබට සමහර වෙලාවට අහල අහලම එපා වෙලා ඇති. උඩුගම මගේ වසමෙ ආනන්ද විජය විද්‍යාලය අසලින් එගොඩට වැටෙන පාලම පිළිබඳ. ඔබතුමා මේව කතා කරන වෙලාවෙත් ඒ නිලධාරීන්ට දුරකතනෙනුත් කතා කළා. අවසානයේ මේක හැම මාසෙකම සභාවෙ කතා කළහම නැත්නම් සම්බන්ධී කරණ කමිටුවෙ කතා කළහම දවසක් ඇවිල්ල වැඩ කරනවා එහෙම ඇවිල්ල ඇවිල්ලා අවසානයේ ඒකෙ අර ස්ලැබ් එක දාලා අවසන් කළා. දැන් තියෙන්නෙ ඔක්කෝම වැඩ ටික ඉවර කරලා වලිගෙ විතරයි ඉතුරු වෙලා තියෙන්නෙ. හැබැයි දැන් මාසයකට විතර උඩදි ඒ වැඩ නිම කරලා, මේක ඒ ගමේ මිනිස්සුන්ට ප්‍රයෝජනයට ගන්න පුලුවන් මට්ටමට  පත් කරන්න අර දෙපැත්ත ගොඩ කරලා ඒ පුංචි වැඩේ කරන්නෙ නැහැ. මම මේ පිළිබඳව ඒ නිලධාරීතුමියගෙන් කතා කරල ඇහුවම ඉතිං අපට මේකෙ පොඩි ප්‍රශ්නයක් තියෙනවා. මේ කොන්ත්‍රාත්තුව භාර දීපු නිලධාරියා මේ ටික කරගන්න සල්ලි නැතෙයි කියල කියනවලු. ඉතිං මේක ප්‍රශ්නයක්ද? මේක ජනතාවට කියන්න පුලුවන් දෙයක්ද? එතකොට ඒ නිලධාරිනියකට එහෙම කියන්න පුලුවන්ද? එතකොට මෙතන බරපතල ගැටලුවක් තියෙනවා. ඊට පස්සෙ කතා කළහම කියනවා. දුරකතනයවත් ගන්නෙ නැතිලු දැන්. මටත් හිතා ගන්න බැරිලු මේකට මොකක්ද කරන්නෙ කියලා. ඒක තමයි මම කිව්වෙ අවසානයේ මේ සියල්ල චෝදනා එන්නෙ මේව නිලධාරීන්ගේ වරද. අපි සම්බන්ධීකරන කමිටුවෙදි ඉල්ලීම් කළා. මේයා අසාදු ලේඛන ගත කරලා, මේක අවලංගු කරලා, මේක ඍජු ශ්‍රමයෙන් හරි කරන්න කියලා. ඒ නිසා මම අද යෝජනා කරනවා. තව රුපියල් දහ පහලොස් දාහක බොහොම පුංචි වැඩක් ඉතුරුවෙලා තියෙන්නෙ. ඒ දහ පහලොස් දාහට එතුමා කියනවනම්, මට සල්ලි නැහැ කියලා. එවැනි කොන්ත්‍රාත්කරුවන්ට මේවා ලබා දීම පිළිබඳව බරපතල ගැටලුවක් තියෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. වහාම මේකට අවශ්‍ය විදිහට ඔබතුමා අවශ්‍ය පියවර අරගන්න. පුලුවන් තරම් ඉක්මනින්  සිංහල අලුත් අවුරුද්දට කලින් ඒ ගමට ප්‍රවේශ වෙන්න පුලුවන් මට්ටම හැදෙයි කියලා මිනිස්සු බලාපොරොත්තු වුනා. නමුත් ඒක සිදු වුනේ නැහැ. ඒ නිසා මේකට අවශ්‍ය ක්‍රියාමාර්ගය ගන්න. කතා කිරීමෙන් වැඩක් නැහැ. සම්බන්ධී කරන කමිටුවෙ අවස්ථා කීපයක් කතා කළා. මේ සභාවෙ කතා කළා. මේව ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. ඒ නිසා මේක ක්‍රියාත්මක නොවීම පිළිබඳ ගැටලුව මම ඒකයි කියන්නෙ. යාන්ත්‍රණයේ මොකක් හරි දෝශයක් තියෙනවා. ඒ නිසා ඒ දෝශය අවසානයේ අපි සියලු දෙනාගේ පිටින් යනවා. සමහර වෙලාවට මේ ගොඩක් ඒවයි ඔබතුමාගෙ පිටින්ම මේ වැරදි යන්නෙ. මේ නිලධාරීන්ගේ ඒ සමහර වෙලාවට නිලධාරීන්ට නීතිමය ගැටලු හෝ එහෙම නැත්නම් නිලධාරීන්ගේ අකාරයක්ෂම තාවය හේතු කොට ගෙන. ඒ නිසා ඒ කාරණයට මම ඉල්ලීමක් කරනවා ලිඛිතව දැනුම් දීලා, මේ කාරණය වහාම ඍජු ශ්‍රමයෙන් හරි මේක නිම කරල දෙන්න කියලා ඒ ජනතාව වෙනුවෙන්. ඒ පළවෙනි කාරණය.

ඒ වගේම ඒ සම්බන්ධී කරණ කමිටුවෙදිම කතා කරපු කාරණයක්. මේව දකින කොට අපට හිතෙන්නෙ. සමහර වෙලාවට අර කවුද කියනව වගේ මේ නිලධාරීන් සහ ඒ ආයතන අතර මොනවා හෝ ඩීල් තියෙනවද කියල අපට සැකයක් එනවා. මොකද මෙච්චර කියද්දිත් මේවට පියවර ගන්නෙ නැහැ. වටවල වතු සමාගමේ ගැටලුවක් පිළිබඳව මම සම්බන්ධීකරණ කමිටුවෙදි අවස්ථා දෙක තුනකදිම දැනුම් දුන්නා. මාර්ගය අයිති දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට. මේ මාර්ගය සකස් කරල තියෙන්නෙ  ජනතාවගේ මුදල් යොමු කරලා. හොඳට කාපට් කරලා පාර සකස් කරලා තියෙනවා. වටවල වතු සමාගම පාරක් කපලා මේ පාරෙ තිබුන බෝක්කු කඩාගෙන ගිහිල්ලා සම්පූර්ණයෙන්ම විනාශ මට්ටමට පත් කරල තියෙනවා. අවස්ථා දෙකකදි නිවැරදි කරනවයි කියලා පොරොන්දු වුනා. අවස්ථා දෙකේදිම පොරොන්දු වෙලා ගියා සම්බන්ධීකරණ කමිටුවෙදි නිවැරදි කරන්න. නමුත් අද තව වෙනකනුත් ඒක නිවැරදි කළේ නැහැ. නිවැරදි වෙලා නැහැ. ඒ නිසා වහාම මේ දුරකතනයෙන් කතා බහින් කරලා මේව කරන්න ගියහම අපට සැකයක් තියෙනවා. මේවයි

එහෙම ඩීල් වෙනවද කියලා. ඇයි නිලධාරියෙක් එහෙම බලාගෙන ඉන්නෙ. ඔබතුමාට අයිතියක් තියෙනවා මෙහේ නිලධාරියෙක් යොමු කරලා, ඒක හැබෑවටම නිවැරදි වෙලාද? කියලා බලන්න. හැබැයි අයිතිය තියෙන්නෙ ආර්ඩීඒ එකට. මොකද ඒ පළවෙනි දවසෙ මෙහේ කතා කරන්නෙත් නැතුව මම කිව්වහම ඇවිල්ලා, ඒ බොක්කුව සම්පූර්ණයෙන්ම කැඩිලා පිටින් වතුරපාර යන්නෙ. අර බෝක්කුව ගොඩ වෙච්ච එක විතරක් හාරලා එහෙමම ගොඩ ගහලා පාරෙ තියෙනවා. ඒක අයින් කරලවත් නැහැ. ඒ නිසා ඒ සඳහා කාර්මික නිලධාරියෙක් යොමු කරලා, මේක නිවැරදි වෙලාද නැද්ද කියලා සොයලා බලලා නැවත ලිඛිතව දැනුම් දෙන්න කියලා මම මේ වෙලාවෙ ඉල්ලීම කරන ගමන්, මේ වගේ කරුණු දෙකක් පිළිබඳව විශේෂයෙන් සමන් මන්ත්‍රීතුමාගෙ කොට්ඨාසයට තමයි අදාල වෙන්නෙ. නමුත් මම යන එන තැන පාර නිසා මට හැමදාම එතනින් යන එන කොට කතා කරල මගෙන් අහනවා. අර රබර් ගස් වගයක් කපන්න ඒකත් තවම ඉටු වෙලා නැහැ. ඒ නිසා මේ දෙකම වටවල වතු සමාගමෙන් කෙරෙන්න ඕන කාරණා. මම කියන්නෙ ඔබතුමා මේක ලිඛිතව දැනුම් දීලා, ඒ කාරණා දෙක ඉටු කරල දෙන්න කියන කාරණය මේ වෙලාවෙ සිහිපත් කරනවා. මම ඒ සිහිපත් කළේ කලිනුත් ඉදිරිපත් කරපු අඩුපාඩු කීපයක් පිළිබඳව.

ඒ වගේම මම මීට පෙර අද හදිසි යෝජනාවක් හැටියට මම සභාවට ඉදිරිපත් කරන්න අවස්ථාව සලසලා දුන්නා. උඩුගම නැගෙනහිර ගුණානන්ද මාවත, ගුලන කන්ද මාර්ගය මේ මාර්ගය පසුගිය දිනවල ඇස්තමේන්තු ගත කිරීම සඳහා නිලධාරීන් පැමිණියා. නමුත් අවසානයේ ඒ නිලධාරීන් කියන්නෙ මේ පාර මේක ඇස්තමේන්තු කරන්නවත් යන්න බැහැ. ඒ නිසා ඉල්ලීමක් කළා මගෙන්. ඔයගොල්ලන්ට පුලුවන්නේද? ඔබතුමා මන්ත්‍රීවරයෙක් නේද? සභාවෙන් මේක කරගන්න කියලා. නමුත් ඉතිං කරුණු දක්වලා දැන් මම අදහස් කළා මට ලැබෙන මුදල් වලින් ටිකක් යොමු කරලා, ඒ මාර්ගය සකස් කරගන්න. ඒ සඳහා අවස්ථාව මම අද යෝජනාවක් හැටියට ඉදිරිපත් කළා වගේම අර කුනු එකතු කිරීමේ ගැටලුවටත් ඔබතුමා මම හිතන්නෙ ඒක ඔබතුමාට විශේෂ ගැටලුවක් නැහැ. ඒ වාහනය නැත්නම් ඒ කුනු එකතු කරන රථය එතනටම යනවා. එතකොට තව විනාඩි 10 ක 15 ක වගේ කාලයක් තමයි මේ පුංචි දුර ගිහිල්ල එන්න තියෙන්නෙ. ඒ නිසා මේ ඉදිරි සතියෙ ඉඳලා ඒ කාරනය ඉටු කරන්න කියන ඉල්ලීමත් මේ වෙලාවෙ කරනවා.

ඒ වගේම අවසාන වශයෙන් තව පුංචි සිහිපත් කිරීමක්. මේකත් මම මේ සභාවෙදිම අවස්ථා කීපයකදිම ඉදිරිපත් කළා. සමහර වෙලාවට හැමදාම එකමදේ කියන කොට ගැටලුවකුත් ඒවි. සභාපතිතුමා මගේ ගමේම කොට්ඨාසයේම අය දුරකතනයෙන් කතා කරලා, නාගොඩ ප්‍රාදේශීය සභා සීමාව සඳහන් කරල නැති එක පිළිබඳව මගෙන් කරුණු අහනවා. ඇයි එච්චර හොඳට පාරත් සකස් කරල ප්‍රාදේශීය සභාවක් හැටියට තියෙන මේ සභාවෙ සීමාව කෙනෙකුට හඳුන ගන්න පුලුවන් වෙන විදිහට පුවරුවක් සවි කරන්න. දැන් ඔබතුමා අපට කියන්න කියලා කියනව වගේ, අපි කියනවා ඔබතුමාට කියන්න කියලා. හැබැයි මෙහෙමයි දැන් එතනදි මිනිස්සුන්ගෙත් ගැටලුවක් තියෙනවා. මම හිතන්නෙ එතනින් එහා මාතර දිස්ත්‍රික්කය. සීමාව. මම අවස්ථා දෙක තුනකදි යෝජනා කළා. දැන් මම යෝජනා කරනවා. දැන් සමාන්‍ය සම්ප්‍රදාය නාගොඩ ප්‍රාදේශීය සභාව ඔබ සැම සාදරයෙන් පිළිගනී කියලනෙ ගහන්නෙ. දැන් සභාවට මේකට මේක කරන්න වත්කමක් නැත්නම් ඔබතුමා මට අවසර දෙන්න. මම දැන්වීමක් දාන්නම් නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී වනිගරත්න මහතා විසින් ඔබ සියලු දෙනා ආදරයෙන් ගෞරවයෙන් පිළිගන්නවයි කියලා. එහෙම තමයි කරන්න වෙන්නෙ. හැබැයි ඒක දිගමට තියේවි සදාකාලිකව. අපි දැන් ඉදිරි මැතිවරණ වලදි අපි ආවෙ නැතත් මන්ත්‍රීවරයෙක් වුනත් නැතත් දිගටම මන්ත්‍රීවරයෙක් හැටියට තියේවි. ඒකනිසා සභාපතිතුමා කරුණා කරල මට ඔය දෙකෙන් එකක් කියන්න. ඔබතුමා මට අවසර දෙනවනම් හැබෑවටම මම කරනවා මේ සඳහා අවදානය යොමු කරන්න. මොකද ඔබ සියලු දෙනා දන්නවා. අඩුම තරමින් මේ වගේ එකක්වත් කරගන්න බැරිය කිව්වහම අර ධනංජය මන්ත්‍රීතුමා කිව්ව වගේ

හැබැවටම අපි ගම්වල හැල්ලුවට පත් වෙලා ඉන්නෙ. මේ සියලු දෙනා ඉස්සරහ කිව්වට ගැටලුවක් නැහැ. සමස්ථ වැඩපිළිවෙල පිළිබඳ හැල්ලුවට ලක් වෙලා.

මමත් මේ සභාවෙ හිටපු මන්ත්‍රීවරයෙක්. හැබැයි අපි හිටපු කාලය තුල අපිට ඒ සභාපතිවරුත් ඔයිට වැඩිය සහයෝගයක් දුන්නා. අපි කියපු වැඩ කළා. ඔය මම කියන පාර සම්පූර්ණයෙන්ම කපල දුන්නෙ අපේ නිශාන්ත මුතුහෙට්ටිගම අපේ හිටපු සභාපතිතුමා. අපි එතුමාට කියන්න ඕන නැහැ. කතා කරල කියන කොටම ඉස්කෝලෙ කුනු ටික ගෙනියන්න කියන්න කලින් ඒ කුනු බස්කටුත් එක්ක එවනවා. ඒ වගේ ලයිට් එකක් දාන්න කිව්වහම කියන කොටම ඒ වැඩේ කෙරුණා. පැහැදිලිවම අපට වෙනසක් පේනවා. ඒ නිසා ඒකෙ මම දන්නෙ නැහැ ඔබතුමා පිළිගන්නවද නැද්ද කියලා. සභාවෙ හිටපු මන්ත්‍රීවරයෙක් හැටියට ඒ හිටපු කාලයේදී මේ සියලු කටයුතු වලට වඩා වැඩි වැඩ කොටසක් කරයි කියන එක පැහැදිලිව එදා මිනිස්සු අපිව පිළිගන්නවා වැඩි වැඩ කොටසක් කරයි කියලා. ඒ නිසා ඒ කාරණයත් මේ වෙලාවෙ සිහිපත් කරනවා. ඒ සභාපතිවරු වෙනමයි මේ සභාපතිතුමා වෙනම සභාපතිවරයෙක්. හැබැයි ඔබතුමා සභාපතිතුමා හැටියට අපිත්, ජනතාවත් බලාපොරොත්තු වුනෙ, ඒ අයගෙන් සිදු වුන අඩුපාඩු තිබුනනම්, ඒවත් නිවැරදි වෙලා, මේක ඉදිරියට යයි කියලා. ඉතිං අර චෝදනාවම එනවනම් එතන බරපතල ගැටලුවක්. ඒ නිසා ඒක නිවැරදි වෙන්න ඕන. එහෙම වෙලා නැතෙයි කියන එක මේ වෙලාවෙ මතක් කරනවා. තෙරුවන් සරණයි සියලු දෙනාට.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමනි අවසරයි. මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. පෙරපාසල් ගැන කතා කිරීම තුලදී ගරු සභාපතිතුමනි, මීට මාස තුනකට විතර උඩදී මම කැප්පිටියාගොඩ වලකුඹුර පෙරපාසල පිළිබඳව යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ යෝජනාව ඉදිරිපත් කළේ සභාව සතු ඉඩමක පෙරපාසල කරගෙන යන ගමන්, ඒ පෙරපාසල සභාව සතු කර ගැනීම සඳහා ඔබතුමාට කටයුතු කරන්න කියල තමයි ඉල්ලීම කළේ. සභාවේ තීරණය යෝජනා ස්ථිර කරගෙන තිබුනා. නමුත් මේ වෙනකම් ඒ පිළිබඳව අපට තොරතුරක් ලැබුනෙ නැහැ. සමන් මන්ත්‍රීතුමා සිහිපත් කළ පරිදි අද දවසේ එතුමාගේ පෙරපාසල සභාව සතු කර ගන්න කියනවනම්, විශේෂයෙන්ම ඒ පෙරපාසලත් සමගම මේ පෙරපාසල් දෙකම දරුවන් වෙනුවෙන් කරන දෙයක් නිසා. ඇත්තටම මමත් අදහස් කරනවා. ඔබතුමාට මේ පෙරපාසල් දෙකම එහෙමනම් සභාව සතු කර ගැනීමේ වැඩ කටයුතුතට වැඩකටයුත්ත සිදුකරල දෙන්න කියලා.

ඒ වගේම මේ වෙලාවෙ විශේෂ ස්තූතියක් කරන්න ඕන. මොකද නාගොඩ ප්‍රාදේශීය සභාවට අඩුවක් සේ පැවතුන ආදාහනාගාරය පිළිබඳව විශේෂයෙන්ම ඔබතුමා විශාල කැපවීමක් කළා. වතුකරයෙන් ඉඩම් ලබාගැනීම සඳහා විශාල කැපවීම් රැසක් ඉටු කරමින් ආදාහනාගාරය සඳහා පසුගිය 22 දින උදේ 9.20 ට පාර කැපීමේ කටයුත්ත සුබ මොහොතින් ආරම්භ කළා. ඒ පිළිබඳව කොට්ඨාසයේ මන්ත්‍රීවරිය හැටියට ඔබතුමාට මගේ ගෞරවණීය ස්තූතිය මේ අවස්ථාවෙදි ස්තූතිය පුදකරනවා. මගේ කොට්ඨාසය තුල ආදාහනාගාරය ඉදිකිරීමේ කටයුත්තට මැදිහත් වූ ඔබතුමාට කොට්ඨාසෙ මන්ත්‍රීවරිය හැටියට මම ස්තූතිය පුද කරනවා. ඒ වගේම මේ සියලුම මන්ත්‍රීවරුන්ටත් මම ස්තූතිය ප්‍රකාශ කරනවා. මොකද මේක කිසිම පැකිලීමකින් තොරව මගේ කොට්ඨාසය තුලට ලබාදීමෙදි ඒ වෙලාවෙ ස්ථානය පිළිබඳව කාගෙවත් එහෙම විරුද්දතාවයක් තිබුනෙ නැහැ. ඒ සඳහා සියලු මන්ත්‍රීවරුන්ටත් මගේ ස්තූතිය පුද කරනවා. ඒ වගේම ලබන්නාවූ සිංහල දෙමළ අලුත් අවුරුද්ද සියලු දෙනාටම සතුටු සෞභාග්‍යමත්වූ සුබ නව වසරක් වේවා කියල ප්‍රාර්ථනා කරමින්, සියලු දෙනාටම තෙරුවන් සරණයි කියල ප්‍රාර්ථනා කරමින්, නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ගරු මන්ත්‍රීතුමිය, මන්ත්‍රීතුමියගෙ කතාවෙන් වැරදි අදහසක් මතු වෙනවා. ඒක එතුමියත් දන්නවා. එදා ඔය පාරවල් ඇස්තමේන්තු කරලා, සේරම කටයුතු වෙලා ඉංජිනේරුතුමා කතා කරලා, ප්ලෑන් එකේ තියෙන පාර පාර සුද්ද කරල ඉල්ලුවා. ඒ ක්ෂණිකවම මම නියාගම ප්‍රාදේශිය සභාවේ ජේසීබී එක අරගෙන පාර සකස් කළා. මොකක් හරි දෙයක් කරන කොට පොඩි නැකතක් බලන්න ඕන නිසා මෙතුමියටම කියලා ඒ හැන්දෑවෙම නැකතක් හදලා පාරෙ වැඩ කටයුතු කළා. ඒක කිසි කෙනෙක් දන්නෙ නැහැ. ඔබතුමියගෙ කතාවෙන් අනෙක් මන්ත්‍රීතුමියන්ලට, මන්ත්‍රීතුමන්ලට වැටහෙන්නෙ, එයාල නොදන්වා මේ කටයුතු සිදු කලා කියලා. පාර සුද්ධ කරලා, ඇස්තමේන්තු හදාගන්න, ඉංජිනේරු මහත්තයට මේක ඉක්මණට යවන්න අවශ්‍ය නිසා ක්ෂණිකව පාර සුද්ධ කරලා වැඩ කටයුතු කළා. මෙතුමිය ෆේස් බුක් එකට දාල තිබුනා. මම ඒත් දොස් කිව්වා. ඕක දැකලා මා ගැන වරදවා හිතනවයි කියලා. නමුත් මෙය වෙච්ච දෙයක්.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සභාවේ ලේකම්තුමිය ප්‍රධාන සියලු දෙනාගෙන් අවසරයි. මම මුලින්ම මේ අවස්ථාවෙ ලබන්නා වූ සිංහල දෙමළ අලුත් අවුරුද්ද සාමය සතුට පිරි ඒ වගේම නිරෝගිමත් සුබම සුබ නව වසරක් කියල ප්‍රාර්ථනය කරමින්, අද දවසේ මේ අප්‍රේල් මාසයේ සභාවාරය ආරම්භක මොහොතෙ ඉඳලා මම මුලින්ම සිහිපත් කරනවා. ගරු සභාපතිතුමනි, මේ වනවිට සභාවේ කටයුතු පිළිබඳව යෝජනා ඉදිරිපත් වෙලා තියෙනවා. මම නැවත වාරයක් සිහිපත් කරනවා. මාපලගම නගරයට අත්‍යවශ්‍යම කටයුත්තක් තමයි වැසිකිලි කැසිකිලි පද්ධතියක්. ඔබතුමා දැන් අර සභාවේ යෝජනා ඉදිරිපත් කරද්දිත් කතා කළා. ඒක මම හිතන්නෙ ඔබතුමාලට සංවර්ධන කටයුතුවලට මුදල් ලැබෙනවයි කියලා. මේ මුදල් සංවර්ධන කටයුතුවල යොදා ගන්න කොට මාපලගම නගරයේ වැසිකිලි කැසිකිලි පද්ධතිය පිළිබඳව විශේෂ අවදානය යොමු කරන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මොකද මේ දිනවල නිතර කතා බහ වෙන කතාවක්. අපේ පියල් මන්ත්‍රීතුමා දන්නවා. අපි හන්දියට ගියාට පස්සෙ මිනිස්සු කියන කතාවක් තමයි. ඔය ගොල්ලගෙ සභාව මොකක්ද මෙච්චර කාලයක් තිබුනා. මේ වැසිකිලියක්වත් හදාගන්න බැරි සභාවක් කියලා. ඔබතුමා කිව්වා අර පිට්ටනියෙ ඉදිකරනවට කට්ටිය කැමති නැහැ කියලා. මම කියනවා මම ඉල්ලීමක් කරනවා. අර පිට්ටනියෙ දයානි එක ගාවින් ඇතුලට ගියාට පස්සෙ. එතන පිටි පස්සෙ ඔබතුමන්ට පුලුවන් ඒක එහෙම තැනක හරි හරිගස්සලා, මේ නගරයේ ජනතාවගේ අවශ්‍යතාවය ඉෂ්ඨ සිද්ධ කරන්න. මොනවා හෝ කටයුත්තක් සිදු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද පහුගිය කාලෙ යහපාලන ආණ්ඩුව කාලේ ලක්ෂ 100 ක් ඇවිල්ලත් ඒ ප්‍රදේශයේ ජනතාවගේ යම් විරුද්දතාවක් මතු වුනා. නමුත් ඔබතුමාට ඍජුව ඒ කටයුත්තට සභාවෙ සභාපතිවරය හැටියට නිර්දේශයක් ලබා දෙන්න තිබුනත්. ඒ කටයුත්ත සිදු වුනේ නැහැ. ඒකට කමක් නැහැ යහපාලන ආණ්ඩුවනෙ තිබුනෙ. දැන් ඔබතුමාලගෙ ආණ්ඩුව තියෙන්නෙ. මේ ආණ්ඩුවෙන් හරි අන්න ඒ අත්‍යවශ්‍ය කටයුත්ත ඉටු කරල දෙන්න කියලා. විශේෂ අවදානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම සභාපතිතුමා කිව්වා. මාපලගම නගරයේ වෙළඳ සංකීර්ණය අලුත් වැඩියා කරන්න ලක්ෂ පහක මුදලක් වෙන් වුනයි කියලා. හැබැයි තව මේ වෙනතුරු ඒ කටයුත්තෙ ආරම්භයක් අපට දකින්න ලැබෙන්නෙ නැහැ. මොකද ඒකත් අත්‍යවශ්‍ය කටයුත්තක්. මොකද අර උඩුමහලෙ තියෙන කඩ කාමර වහල දිරලා, ඒ උඩු මහලෙ කඩ කාමරවල විශාල ගැටලු තියෙනවා. ඒ බදු අරගනිපු අයට සමහරක් ඒවට විදුලිය නැහැ. විවිධ ගැටලු තියෙනවා. මෙන්න මේවා පිළිබඳ නිරාකරණය කරලා. මාපලගම නගරයටත් අනිත් නගරවලට වගේම ඒ පහසුකම් බලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ පිළිබඳ කතා කරන්න බොහෝ දේවල් තිබුනත් මම දැක්කා පහුගිය දවස්වල මාපලගම මහජන ක්‍රීඩාංගනයේ යෞවන සමාජ ක්‍රීඩා උළෙලවල් තිබුනා. අපට ක්‍රීඩා පිටියෙ දියුනුවක් අත්‍යවශ්‍ය දැනිල

තියෙනවා. මොකද ප්‍රදේශයේ විවිධ තරග රාජ්‍ය මට්ටමේ පවතින තරග මාපලගම මහජන ක්‍රීඩාංගනයේ පවතින්නෙ. ඒ වෙලාවෙ අපේ ක්‍රීඩාංගනයේ තියෙන පහසුකම් එක්ක අපි දැඩි අසීරුතාවයට පත් වෙනවා. හරිහමන් ක්‍රීඩා පිටියක් නැති නිසා අපේ පළාතේ තරුණ පිරිස් ඒ ක්‍රීඩා කටයුතුවල නියැලෙන්න පැකිලීමක් දක්වනවා.

මේ වෙලාවෙ මම හැමදාමත් කතා කරනවා. සභාපතිතුමනි මේ අයාලේ යන සුනඛයින් සහ ගවයින් සහ ඒ වගේම අපේ බෝගවලට වෙන වන සතුන්ගෙන් වන හානි. වන සතුන් කිව්වහම රිලවුන් වඳුරන් ඉත්තෑවො දඩු ලේන්නු ඒ වගේ සත්තුන්ගෙන් දැඩි හානියක් වෙනවා. මොකද විශේෂයෙන්ම වාඩියකන්ද අසල ඒ වගේම මේ කඳු ආසන්නයේ ජීවත්වෙන ජනතාවට දැඩි අසීරුතාවයක් තියෙනවා. මොකද ඔබතුමන්ලගෙ ආණ්ඩුවෙන් දැන් පොල් ගෙඩිය රු. 120.00 වත් නැහැ. 150 ට විතර ගිහිල්ලා. පොල් ගහක අඩුගානෙ යන්තම් කුරුම්බ ගෙඩියක්වත් තියාගන්න බැහැ. මොකද මේ සත්තු විනාශ කරනවා. මේ පිළිබඳව මේ සතුන්ගෙන් වන හානිය විශේෂයෙන්ම මේ සුනඛයින් ගෙන් පාසල් ළමයින්ට, පාරෙ යන මිනිස්සුන්ට වෙන හානිය දැඩි ලෙස ප්‍රශ්නයක් වෙලා තියෙනවා. මොකද සමහර නිවාසවල මේ සුනඛයො වයෝවෘද්ධ වෙනකම් ඉදලා, හදල ඉවර වෙලා පාරට යොමු කරල තියෙනවා. ඒ සතුන් ගෙන් පාරෙ යන මිනිස්සුන්ට තියෙන හානිය දැඩියි. මේවගේ ප්‍රශ්න මොකද ප්‍රාදේශීය සභාවෙ සභාපතිවරයා හැටියට ඔබතුමාට තමයි මේවයි වගකීම් තියෙන්නෙ. මේ සුනඛයින් ගෙන් වන හානිය අපි හැමදාම මේ සභාවෙ කතා කරනවා. මේ ප්‍රශ්නෙට පහුගිය කාලවල්වලනම් පහුගිය රජයන් තියෙන කොට විවිධ වැඩසටහන් හරහා මේවා යම් පාලනයක් තිබුනා. නමුත් දැන් දශකයක කාලයක සිට මේ සත්තුන්ගෙන් වන හානිය පිළිබඳ කිසිම දේක අවදානයක් යොමු කරන්නෙ නැති වටපිටාවක් අපිට දකිනවා. මේ වෙලාවෙ ඔබතුමාට මේවා සිහිපත් කරන්නෙ. ජනතාවගෙන් අපට ලැබෙන තොරතුරු. අපට පාරට ගියාට පස්සෙ මේව තමයි කියන්නෙ. ඔය ගොල්ලයි සභාවට තමයි මේව කරන්න පුලුවන්. සභාවට තමයි වගකීම තියෙන්නෙ. මේවා පිළිබඳ අවදානය යොමු කරන්න කියලා.

ඒ වගේම සභාපතිතුමනි මම එක දෙයක් කියන්න ඕන. පහුගිය දවස්වල ඔබතුමන්ලගෙ ඔය අභාග්‍යයේ දැක්ම ක්‍රියාත්මක වෙන මේ මොහොත, පහුගිය දවස්වල වප් මගුල් උත්සව තියෙනවා දැක්කා. හැබැයි ඉතිං ඔබතුමත් මම දැක්කා පිටි පස්සෙන් යනවා. හැබැයි මම කවදාවත් දැකල නැහැ මේ දවල් 12 න් පස්සෙ වප් මගුල් උත්සව තියෙනවා. මොකද සිරිතක් තියෙනවා ඉර හැරෙන්න ඉස්සර වෙලා වප් මගුල් උත්සව තියන්න ඕන කියලා. හැබැයි මෙතුමන්ලගෙ මේ අභාග්‍යයේ දැක්ම ක්‍රියාත්මක කරන කට්ටිය හවස තමයි වප් මගුල් උත්සව තියන්නෙ. ඇත්තටම මේවා විහිලු. කුඹුරු වගා කරන්න ඕන තමයි. නමුත් මේක හවසට තමයි වප් මගුල් උත්සව තියන්නෙ. මේවා ඇත්තටම ජනතාව අපෙන් අහනවා. මම කිව්වා ඕක තමයි අලුත් සංස්කෘතිය කියලා. මොකද පොහොට්ටුවෙ සංස්කෘතිය ඒක තමයි.

ගරු සභාපතිතුමනි, කොහොම හරි අපේ ගමේ මිනිස්සු කොහොමත් ඒ කුඹුරු යායේ සතියකට ඉස්සෙල්ල වැඩ පටන්ගෙන තිබුනා. මෙතුමන්ලා ඇවිල්ල නොමිලෙ සල්ලි ටිකක් දෙනවයි කියලා. ගෙවල්වලට ගිහිල්ල මිනිස්සුන්ට කියල තියෙනවා. ඔය ගොල්ලන්ට මේ කුඹුරු කරන්න ආධාර දෙනවා. රැස්වීම්වලට එන්න කියලා. අනේ මිනිස්සුන්ට මේ දවස්වල ජීවත් වෙන්නත් අමාරුයි. ආර්ථිකයත් අන්තිම බිංදුවටම වැටිල තියෙන්නෙ. සල්ලි ටික ගන්න බලාගෙන ඇවිල්ලා අන්තිමට නවය දහය වෙන කොට නැහැ. දොළහ වෙනකම් බැලුවා මිනිස්සු බැන බැන නැවත ගියා. මේක තමයි ඇත්තටම තවම මේ ගොල්ලො මුල ඉදලම අර 69 ලක්ෂයක් අරගෙන අපේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ජනාධිපති වුන දවසෙ ඉදලම. හැමදාම ජනතාව රවට්ටපු එක තවමත් කරන්නෙ ඒ රවට්ටන එක. තවම මිනිස්සු ගොනාට අන්දනවා. තවම රැවටෙන මිනිස්සු කොටසකුත් ඉන්නවා. පව් කියල හිතෙනව ඇත්තටම. මම දැක්ක දැන් මේ සභාවෙ කතා කරනවා. ඕක තමයි දිට්ඨ ධම්ම වේදනීය කර්මය පළිසන් දෙනවයි කියන්නෙ. මම දැන් සභාවාර දෙක තුනකදි කිව්වා. මේ 15 දෙනා

තමයි තනිකර වගකියන්න ඕන. මේ රටට අපේ ප්‍රදේශයට වෙච්ච හානියට. ජනතාවට වෙච්ච පීඩනයට. අද ඒව මේ ගොල්ලන්ගෙ පිටි පස්සෙ කරකැවීගෙන එනවා. ඕව තමයි මම සභාවාර දෙක තුනකදි කිව්වා. ඕව කරකැවිල එයි කියලා. තව මාස කීපයක් යන කොට මේ ඉන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු තුන් දෙනෙක් තමුන්නාන්සෙල හැම දේටම අත ඉස්සුවා. කෝ දැන් ප්‍රතිපාදන ඒක තමයි ඇත්ත. අපි විපක්ෂයේ අය හැටියට අපි ශක්තිමත්ව ඉන්නවා. අපේ කාල වකවානුව තුල අපේ යහපාලන ආණ්ඩුව තුල ගරු විපක්ෂ නායක තුමනි මේ ගොල්ලො අද මේ කාපට් පාරවල් කරන්නෙ. අපි කිලෝ මීටර් ලක්ෂයේ පාර වැඩසටහන් ගෙනාවා. පාලම් 10000 වැඩසටහන් ගෙනාවා. අද ඒව තමයි ඉදිරියට ගෙනියන්නෙ. අද මේ අය කියනවා අපි පාරවල් කාපට් කරනවයි කියලා. ඔය ගොල්ලන්ට පාරවල් කාපට් කරන්නනම් ඒ පසුබිම හදල දුන්නෙ පසුගිය යහපාලන ආණ්ඩුවෙන්. අපි පාරවල් හතරයි කළේ. අපි වැඩසටහන පටන්ගෙන. අද තමුන්නාන්සෙල උඩ බලාගෙන හිනා වෙවී ඉන්නවා. මම හිතනවා මේ වෙලාවෙ කමක් නැහැ එහෙම හරි සතුටු වෙන්න. අපි දන්නවා තමුන්නාන්සෙලට දැක්මක් නැහැ. වැඩපිළිවෙලක් නැහැ. වැඩපිළිවෙලක් නැති හින්ද තමයි අද ජනතාව අතර මේ තරම් කෙටි කාලයකදි පීඩනයකට පත්වෙලා තියෙන්නෙ.

අද ජනතාව අතර ඉන්නෙ කොතනද කියල තමුන්නාන්සෙල දන්නවා ඇති. ඒ අතරෙ තමුන්නාන්සෙලට බලා ගන්න පුලුවන් ගමට ගියාම කඩේකට ගියාම. මම ඒව කියන්න ඕන නැහැ කඩේ තියෙන බඩුවල ගණන්. කමක් නැහැ දැන් ඔය පොල් බෑය 159 ට හරි කාව්නෙ. දැන් විපක්ෂ නායකතුමනි මට හිනහයි. අර ආණ්ඩුවෙ හොරනෑවෙන් කියනවා. අපි 93ට හාල් දෙනවයි කියලා. මේ අර අපේ ගමේ මාපලගම හන්දියෙ තියෙන පුඩ් සිටියෙ තියෙනවා. කැකුළු හාල් කිලෝ එක 80 යි 85 යි. මේ අර ආණ්ඩුවෙ කඩේ සතොසෙ සමූපකාරෙ 93 යි. අතන තියෙනවා. 85ට. ඒකෙන් හිතන්න පුලුවන් මුංගෙ චක්‍ර ලේඛන ගේන්නෙ. පෞද්ගලික වෙලෙන්දා 85 ට හාල් දෙනවා. රැවටිලා සතොසට යනවා. අද ජනතාව සතුටු කරන්න තමුන්නාන්සෙල මොන විජ්ජාවල් නැටුවත් ජනතාවට තේරිලා තියෙනවා අපි කළේ මෝඩ වැඩක් කියලා. 69 ලක්ෂයට විතරක් නෙවෙයි අනිත් කට්ටියට දැන් වැදිල තියෙන්නෙ. 69 ලක්ෂයට කොහොමත් එපා වෙලා තියෙන්නෙ. අපිට අද ජීවත් වෙන්න බැරුව ඉන්නෙ. මේක තමයි ඇත්ත තත්වය.

සභාපතිතුමනි, මේ වෙලාවෙ තව එකක් කියන්න ඕන. අර මාපලගම ගල්වාන පාර කාපට් කරන්න වැඩ ආරම්භ කළා. ඇත්තටම මම සතුටු වෙනවා. ඇත්තටම අපිත් ඕක දෙතුන් පාරක් ඇස්තමේන්තු කළා. නමුත් අපේ ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා මැදිහත් වෙලා වැඩේ පටන් ගෙන තියෙනවා. මම හිතනවා ඒකෙ සභාපතිතුමනි ඔය පාරෙ ගගට කඩන් යන තුන් පොලක් තියෙනවා. ඒ තුන් පොලේ ගල් බැම් තුනක් හදන්න අපි ඇස්තමේන්තු කරලා. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය හරහා පහුගිය යහපාලන ආණ්ඩුවෙන් වැඩකටයුතු කළා. ඒක මේ පාර කාපට් කළා වගේම නිතර ගගට බාදනය වෙන තුන් පොලක් තියෙනවා. අන්න ඒ බැම් තුනත් ඇත්තටම ඉදි වෙන්න ඕන. ඒ වගේම සභාපතිතුමනි මේ පාරෙ පළල අපි ඇස්තමේන්තු කළේ අඩි 22 ට. දැන් මම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙ නිලධාරින්ගෙන් ඇහුවම අඩි 16 කාපට් කරනවයි කිව්වා. කමක් නැහැ 16 ට හරි කාපට් කළාට කමක් නැහැ. ඒ වගේම මේ පාරෙ යටවෙන හතර පස් පොලක් තියෙනවා. සාමාන්‍යයෙන් පොඩි ගංවතුරකට යටවෙන මාර්ගයේ හතරපොලක් තියෙනවා. මේ හතර පොල යම් මට්ටමකට අඩි දෙකක් තුනක් වගේ ඔසවන්න වෙලා තියෙනවා. මොකද නැත්නම් පාර හැදුවට වැඩක් නැහැ. සුළු ගංවතුරකට වුනත් ප්‍රධාන පාර යට වෙනවා. මේක මේ පිළිබඳ ඔබතුමාගෙ අවදානය යොමු කරන්න. මම ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා ඔබතුමා දන්නවා ඇති. ඔබතුමත් මේ පිළිබඳ කටයුතු කරයි කියලා මේ වෙලාවෙ සිහිපත් කරනවා.

ඒ වගේම සභාපතිතුමනි තව එකක් කියන්න තියෙනවා. මොකද අපි පහුගිය කාලෙ ඔය යහපාලන ආණ්ඩුව කාලෙත් අපි කතා කරපු දෙයක් තමයි මේ මාපලගම ඇල්පිටිය බස් හැන්දෑවෙ හයෙන්

පස්සෙ මාපලගමට එන්නෙ නැහැ. ජනතාවක් දැඩි අපහසුතාවයට පත්වෙන දෙයක්. මොකද වැරදිලාවත් බයිසිකලේකින් ආවොත් මේ දවස්වල අපේ පොලීසිය ජනතාව පස්සෙන් එලවලා දඩ හූරගෙන කන හින්දා පොලීසියට දඩය හම්බ වෙනවා. මොකද මග ඉදලා හෙල්මට් එක නැත කියලා දාහක් දෙන්න වෙනවා. ඇත්තටම ත්‍රීවිල් එකක් අරගෙන එන්නත් සමහර මිනිස්සුන්ට හැකියාවක් නැහැ. මේ බස් රථ පිළිබඳ ඔබතුමන්ලගෙ සම්බන්ධීකරණ කමිටුවෙ හරි කතා කරල මේ බස් රථ හැන්දෑවට අඩු ගානෙ හැන්දෑවෙ අට නවය වෙනකන්වත් මාපලගමට එන්න ක්‍රමයක් සකස් කිරීම සම්බන්ධයෙන් කතා කරන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ප්‍රයිවට් බස් සහ සීටීබී මේ සියල්ල මාපලගමට හැන්දෑවෙ අට වෙනකම් නැත්නම් ඇල්පිටිය පිටිගල පාරෙ එන බස් තල්ගස්වලින් හරවලා යනවා. මොකද ගොඩක් බස් තියෙන්නෙ හොරංගල්ල වත්තහේන පැත්තෙ බස්. මිනිස්සු අතනින් බස්සලා ඒ අය ගෙදර යනවා. මිනිස්සු කිව්වත් ඒ ගොල්ලො ඒ පිළිබඳ සෑහීමකට පත් වෙන්නෙ නැහැ. මේක තමයි ප්‍රශ්නය මේ පිළිබඳවත් සිහිපත් කරනවා.

ඒ වගේම මේ සභාවෙ වියදම් වාර්තා, මේ ලැබීම් ගෙවීම් වාර්තාව දිහා බැලුවා. මේකෙ මාර්ග පිළිබඳ ඉදිරපත් වුන අංක 28 මොකද මේව අපේ වෙරංග මන්ත්‍රීතුමා අපි කතා කරන්නත් ඉස්සර වෙලා එතුමා යෝජනා ස්ථිර කළා. පාරවල් කීපයකට ජේසීබී යන්ත්‍ර යොදලා විශාල මුදලක් වැය කරල තියෙනවා. අපි දන්නෙ නැහැ මේව කිලෝ මීටර් කීයක් ජේසීබී යන්ත්‍ර දාලා කැපුවදකියලා. එකක තියෙනවා 92500 ක් එකක තියෙනවා 200000 ක් එකක 188750 මේ වගේ ලොකු මුදල් තියෙනවා.

ඒ වගේම මම දන්නෙ නැහැ. ඒව කොහොම වාර්තා තියෙනවද කියලා. මේවයි අධීක්ෂණය කරනවද? අපේ නිලධාරි වැඩ කරන කොට ගිහිල්ලා බලනවද? මේ පිළිබඳ මම දන්නෙ නැහැ. පහුගිය සභාවල් වලනම් සභාවෙ ටීඕ කෙනෙක් ලග ඉදගෙන තමයි මේව කළේ. මේවා එහෙම කෙරෙව්වද කෙරුනද කියලා දන්නෙ නැහැ. මොකද මේ සභාවෙ අද ධනංජය විලේගේ මන්ත්‍රීතුමා කිව්වා. අයතා ගනුදෙනු වෙනවයි කියලා. මේ සභාවෙ අයතා ගනුදෙනු රාශියක් වෙනවා. අපට වැඩක් නැහැ. මේව කතා කරලා. මොකද මේ අයතා ගනුදෙනු වාහන දිහා බැලුවම වාහනවලට රෙපෙයාර්වලට යන වියදම් අපි දන්නෙ නැහැ. මේව ඉංජිනේරු වාර්තාවලට කරනවා ඇති. නමුත් විශාල මුදල් නාස්තියක් වෙනවා. ඒවා අපිට වැඩක් නැහැ. අපිත් කැමතියි මේවා වියදම් කරනවට. මෙන්න මේක තමයි අද ඇත්ත තත්වය.

ඒ වගේම තව එකක් කතා කරනවා සභාපතිතුමනි. මේ දවස්වල අපේ අලුත් සමෘද්ධි නියාමක වරු අලුත් සෙල්ලමක් කරනවා. මොකද මේ පහුගිය කාලෙ අපි අන්ත අසරන මිනිස්සුන්ට සමෘද්ධිය ලබා දුන්නා. අද ඒ ගෙවල්වල තියෙන රුපියල් 3000 ට තියෙන සමෘද්ධි කාඩ් එක අඩු කරන්න මේ මිනිස්සු සැලසුම් කරලා. මොකද ඒ ගෙදර පදිංචිය, ගෘහ මූලිකේ අම්මා තාත්තා ඉන්නවා. ඒ පුතා හෝ දුව බැදල ඒ ගෙදර පදිංචිව ඉන්නවා. එහෙම වුනාම අර දුවයි පුතයි ලේලියි එක ගෘහ මූලිකයෙ හිටියත් වෙනම පවුලක් හැටියට තමයි යන්නෙ. ඇත්තටම හරි අසාධාරණයක්. දැන් ඒ මිනිස්සුන්ට සමෘද්ධිය කාඩ් එකක් දෙන්නෙත් නැහැ. අර වැඩිපුර ඉන්නවයි කියලා අර අම්මයි තාත්තයි නමට තියෙනවනම් අම්මයි තාත්තයි විතරයි සමෘද්ධි කාඩ් එකට අයිති වෙන්නෙ. අනිත් කට්ටිය එතනින් කපා හරිනවා. ඇත්තටම ඔයිට වැඩිය හොඳයි හිගා කැවනම්. මේ වගේ දහජරා වැඩ කරන්නෙ නැතුව. මොකද මේ මිනිස්සුන්ට අපි ඒ කාලෙ දුන්නෙ අන්ත අසරන මිනිස්සුන්ට සාක්ෂි හේතු සාදක තියෙනවා. අලුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නිලධාරී මහත්තයෙක් ඇවිත් ඉන්නවලු. එයා කියනවලු ඒ විදිහට කරන්න කියලා. සමහරක් ගෙවල්වල තාත්තයි අම්මයි පුතා විවාහ වෙලා පුතාගෙ ලේලියි දරුවොයි ඉන්නවා. ඒ වුනාට පුතයි ලේලියි දරුවොයි අයින් කරනවා. අම්මයි තාත්තයි විතරයි. එතකොට 1000 යි 1500 යි කාඩ් එක. ඒක තමයි මේ වෙන්නෙ. මේ වගේ අමන වැඩ කරන දහජරා වැඩ කරන ආණ්ඩුවක් මේක. මේවා මේ වගේ දේවල් ගොඩාක් දේවල් තියෙනවා. මොකද මේ සමහර නිලධාරී දේශපාලන බලය මොකද අපට අපේ ආණ්ඩුව තියෙන කාලෙ අපට වැඩක් කරන්න දුන්නෙත් නැහැ. අද පොහොට්ටුවෙ ආණ්ඩුවෙ බලය තියාගෙන. අපේ

මිනිස්සුන්ගෙ තියෙන තුට්ටු දෙකත් කපාගෙන කන්න හදනවා. ඇත්තටම මේ ගොල්ලො මහා ලොකුවට පුරාජේරු නටනවා. ලක්‍ෂ ගණන් වලින් කෝටි ගණන් වලින් මේ රටේ සංවර්ධනය කරනවයි, ප්‍රදේශයේ සංවර්ධනය කරනවයි කියලා. කරන සංවර්ධනයට වැඩිය හොඳයි මේ අහිංසක මිනිස්සුන්ගෙ බඩට ගහන්නෙ නැතුව ඉන්නවනම්.

සිංහල අලුත් අවුරුද්දක් ලබාගෙන එනවා. මිනිස්සුන්ට කොරෝනා වසංගතයයි. ඊලගට මේ අපිට අලුතින්ම මේ ආණ්ඩුවෙ පොහොට්ටුවෙ කට්ටිය අපිට ගෙනත් දීල තියෙනවා පිළිකා පොල්තෙල්. පොල්තෙල් බෝතලේ කොහාමත් 450 පිලිකා නැති වුනත්. කොහොමත් දැන් අපි කාලත් ඉවරයි. ගිය අවුරුද්දෙ තමයි ඔය පිලිකා පොල්තෙල් ලංකාවට ඇවිල්ල තියෙන්නෙ. අපි දැන් කාලා ඉන්නෙ. අද සෞඛ්‍ය අංශවල නිර්දේශවලට පටහැනිව මේ ආණ්ඩුව කටයුතු කරන්නෙ. ඒහෙම කටයුතු කරන ආණ්ඩුවක් එක්ක ජනතාවට බුදු සරණයි. ඒක තමයි කියන්න තියෙන්නෙ. මේ ලබන්නාවූ සිංහල දෙමල අලුත් අවුරුද්ද නිරෝගිමත් ඒ වගේම ලෙඩදුක් කරදර හාදක මැඩගෙන ඉදිරියට යන්න අවශ්‍ය රැකවරණය ලැබේවා කියල ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි මම වාර දෙක තුනකින් සභාවෙදි කතා කළේ නැහැ. අද දිනයේ සභාව දිහා බැලුවම යම් අවස්ථාවක් ලබා ගන්න හිතුනා. මට මේ අවස්ථාවෙ මුලින්ම කියන්න තියෙන්නෙ. මගේ කොට්ඨාසෙ මමත් එක්ක ඡන්දෙ ඉල්ලපු විලේගේ මන්ත්‍රීතුමාගෙ කතාව ගැන යම් ප්‍රකාශයක් කරන්න ඕන මම. මොකද එතුමගෙ සමහර කාරණාවලට අපි මන්ත්‍රීවරු විදිහට එකග වෙන්න ඕන දේවලුත් තියෙනවා. එහෙම නැති දේවලුත් තියෙනවා. බහුතරයක් කතාව සම්පූර්ණ සත්‍යයක් කියල තමයි මේ අවස්ථාවෙ අපිට වුනත් කියන්න වෙන්නෙ. ඒක සභාපතිතුමාට කරන චෝදනාවක් විදිහට නෙවෙයි. නමුත් ඔබතුමාගේ තියෙන සමහර දුර්වල තැන්වලින් සමහර සේවකයන් සහ සමහර පිරිස් වාසි ගන්නවා. ඔබතුමා නීතිය ක්‍රියාත්මක කරන්න පසුබට වීම තුලින් සමහර සිද්දීන් ඇත්ත කියලා අපට කියන්න සිදු වෙනවා. මේ සභාවෙදි. මොකද සභාපතිතුමනි ඉතිහාසය පුරා බැලුවම අපේ හිටපු සභාපතිවරු දෙන්නෙක් මේ ස්ථානයේ ඉන්නවා. තවත් සභාපතිවරු මේ සභාව පාලනය කරල තියෙනවා. නමුත් ඔබතුමා වගේ අවස්ථාවක් මන්ත්‍රීවරුන්ට කවුරුවත් දීලා නැහැ. මම දන්න තරමින් කවදාවත් රුපියල් පන්දාහක දහදාහක වත් මෙන්න මේ ගානක යෝජනා දෙන්න කියලා විසිපන්දාහකවත් එහෙම දුන්න කාලයක් අපේ කාලෙනම් තිබුනෙ නැහැ. ආණ්ඩු පක්ෂයේ චේවා විපක්ෂයේ චේවා කිසිම මන්ත්‍රීවරයෙකුට. නමුත් ඔබතුමා යම් උත්සහයක් කරනවා. එහෙම කරල මොනව හරි ඔබතුමාගෙ තියෙන ගැටලුවක් වහගන්නද කියල මම දන්නෙත් නැහැ. ඒක කියන්නෙත් ඔබතුමාලගෙ කණ්ඩායමේ කණ්ඩායම් රැස්වීමෙ ප්‍රකාශ කරන්න ඕන නායකයන්ගෙ නම් කියලා. මේ ගරු සභාවෙදි එවැනි ප්‍රකාශයන් සිදු වුනා. ඇත්තටම අපි කණගාටු වෙනවා. ඔබතුමන්ලාගේ මේ වගේ ගරු සභාවකදි මේ වගේ කතා අහන්න ලැබීමත් අපෙත් අභාග්‍යයක් කියල තමයි මම සලකන්නෙ. මේ 27 දෙනාගෙ වටිනා කාලය ඒවට වෙන් වෙන එක. සභාපතිතුමාගෙ මොනව හරි අඩුපාඩුවක් හින්දද මම දන්නෙ නැහැ. ඔබතුමා ඒ කණ්ඩායමට ලක්ෂ දෙක ගානෙ හරි ලක්ෂ තුන ගානෙ හරි එක එක ගණන් ප්‍රකාශ වුනා. ඒ මුදල් ප්‍රතිපාදන දීලා ඔබතුමන්ලා රැකගන්න හදනවද දන්නෙ නැහැ. ඒ රැක ගන්න හැදුවත් ඔබතුමාට ඔය සිද්ධිය වෙන්නත් ඕන එක පැත්තකින්. මොකද එහෙම නොවුනොත් ඒකත් අපරාධයක්. මොකද මේ සභාවෙ අපි ඕනම කටයුත්තකට පක්ෂ භේදයකින් තොරව අපි හත් දෙනෙක් ඔබතුමාට ඉන්නවා. ඒ ගමන අපේ අජිත් මන්ත්‍රීතුමාගෙ කණ්ඩායමේ තුන් දෙනෙක් ඉන්නවා. අනිත් කණ්ඩායම්වල තව දෙන්නෙක් ඉන්නවා. අපි 12 දෙනෙක් විතර ඔබතුමාගේ සෑම කටයුත්තකටම දෙන්න පුලුවන් හැම අවස්ථාවෙදිම, මේක සහයෝගයෙන් මේ සභාව කරගෙන යන්න දෙන්න පුලුවන් සහයෝගය ලබා දුන්නා. නමුත් ඔබතුමා ප්‍රසිද්ධියෙ සභාවෙ කියනවා. මාත් එක්ක වැඩ කරනවනම් මෙහෙමයි. මේ සභාවෙ වැඩ කරන කොට කොට්ඨාසෙ

ඉන්න 15 දෙනත් එක්ක එකතුවෙලා එන්න ඕන. ඔබතුමා මේ පල්ලෙහා ඉදල ගිහිපු මන්ත්‍රීවරයෙක් විදිහට ඔතනට ගියාට පස්සෙ ඔබතුමාට ඔහොමනම් අනිත් අයටත් ඒකම තමයි වෙලා තියෙන්නෙ. මන්ත්‍රීවරු මට මතකයි. ගරු සභාවට ආපු මුල්කාලෙ කිව්වෙ. අපට දීමනාව එපා මම දීමනාව ගන්නෙ නැහැ. මම මේ වෙනුවෙන් කැප වෙනවා. අරක මේක කියපු අය අද වෙන කොට දීමනාව නෙවෙයි මේකෙ ව්‍යාපාරිකයො වෙලා. දැන් කොන්ත්‍රාත් කාරයො වෙලා. අපි දන්නවා මොකද ඒක නම් කියන්න ඕන නැහැ. මීට කලින් අපේ වනමල් මන්ත්‍රීතුමා කතා කළ කතාවෙ වුනත් මම මේ ජේසීබී ප්‍රශ්නෙමත් නෙවෙයි මට තියෙන්නෙ. ලක්ෂ දෙකක ජේසීබී බිලක් ගෙවන්න ලක්ෂ දෙකට දවස් කීයක් වැඩ කරන්න ඕනද කියලා පොඩක් බලන්න. පැයකට 2500 යි. සාමාන්‍යයෙන් ලොකු කාලයක් වැඩ කරන්න ඕන. මොකද එකදිගටම වැඩ කරනවයි කියලා. උදේ අටට ඇවිත් හවස පහ වෙනකම් කොයි විදිහට පැය හැදුනත් ඒ වැඩ කරන්න ඕන අපිත් පහුගිය කාලෙ ආණ්ඩු කළා. අපිත් වැඩ කරල තියෙනවා ගම්වල. ජේසීබී වලින් වැඩ කරල තියෙනවා. බිල් ගෙවල තියෙනවා. නමුත් ඒවත් එක්ක බලන කොට ඔබතුමා කියනවා. ඒවා ටීඕ වාර්තාව අනුව තමයි වෙන්නෙ කියලා. ඔබතුමා එහෙම කියනවනම් අපට පිළිගන්න කියලනෙ ඔබතුමා කියන්නෙ. නමුත් ඒක සමහර වැඩ නොකෙරිලා නෙවෙයි. නමුත් 100% ක් අපි ඒවට එකග වෙන්නෙ නැහැ. අපි ඒව අහගෙන හිටියට එකග වෙලා නෙවෙයි කියලා කරනවා. ඔබතුමා ඒව ගැන තව වුට්ටක් බුද්ධිමත්ව කටයුතු කරන්න. මොකද ඒව ආකාරයෙන්ම වෙනවද? ඒ සංවර්ධනය වුනාද? අපට වාර්තා වලින් සභාවෙ මොන ඉලක්කම් වලින් තිබුනට වැඩක් නැහැ. ගම් මට්ටමේ සංවර්ධනය වෙලා තියෙනවද කියලා. ඔබතුමා සල්ලි දුන්නා කියලා ඔබතුමාට ස්තූති කරනවා. කතාව පටන් ගනිද්දි එක කතාවක්. කතාව අවසානෙදි එක කතාවක්. ඔබතුමාගෙ කණ්ඩායමේ මන්ත්‍රීවරු. මේ ගැන මේ සභාව දිහා බලන් ඉන්න කොට අපට පුදුම කණගාටුවක්, දුකක්, සතුටක් ඔක්කොම ඇති වෙනවා. මොකද ඔබතුමාම හදාගත්තු, ඔබතුමාම පෝෂනය කරපු කණ්ඩායම තමයි ඔබතුමාට විරුද්ධව ඒ කටයුතු කතා කරන්නෙ. ඇත්තටම විපක්ෂයත් ඔය 15 දෙනා අතරෙම තමයි ඉන්නෙ. සභාපතිතුමනි මම මේ අවස්ථාවෙ එහෙම කියන්න ඕන. සමහර මන්ත්‍රීවරු සභාවට ආපු මුල් කාලෙ කිව්වෙ. මම දීමනාව ගන්නෙ නැහැ. ෆේස් බුක් වලින් බැලුවම වෙන කතා. නමුත් අද වෙන කොට අපිනම් මේ පෙට්‍රල් ටිකක් ගහගෙන මළ ගෙදර මගුල් ගෙදර යනවට වඩා වැඩක් කරගන්න බැහැ. මේ දීමනාවෙන්. නමුත් ඒකත් නෙවෙයි අපි ඊට වඩා අතින් දෙන ඒව තියෙනවා. නමුත් කියපු නැති ඒව තියෙනවා ඕන තරම්. ෆේස් බුක් දාපු නැති ඒව තියෙනවා. මේ ආණ්ඩු කළාට නමුත් ජීවිත කාලෙම එකදවසක්ව අපි කොන්ත්‍රාත් කරලත් නැහැත්. නමුත් කොහොම හරි ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ සමහර අය කියන කතා එදා කතා නෙවෙයි. විශේෂයෙන්ම මම නම කියල කියන්නෙ. අපේ වෙරංග මන්ත්‍රීතුමා ගැන ඔබතුමා සභාවෙදිම කිව්වා. දැන් ලක්රුවන් මන්ත්‍රීතුමාගෙ නඩුවෙ පෙරනිමිත්ත අනුව කියනවා. දැන් එතුමගෙ පස් නඩුව මට මතකයි. එතුමා මේ සභාවෙදි භාර ගත්තා. මේ සභාවට රුපියලකවත් වියදමක් යන්න තියන්නෙ නැහැ. ඒව වාර්තාවල තියෙනවා. වාර්තා සභා ගත වෙලා තියෙනවා. ඔබතුමාල පක්ෂ බේදයෙන් තොරව කවුරුත් සාක්ෂි දරනවා ඇති. ඒ ගමන ඔබතුමාම කියනවා මම යවපු කටයුත්ත නෙවෙයි එතන වෙලා තියෙන්නෙ. ටිපර් එක වෙන එකකට පාවිච්චි කරල තියෙන්නෙ. පස් පටවල තියෙන්නෙ වෙන තැනකින්. ඒක හින්ද තමයි මේක වුනේ කියලා. ඔබතුමා ඒ නඩුවටත් ඒ සිද්ධිය දවසෙත් ආවා. ඒ වගේ සිද්ධි වෙනවා. නමුත් අද කියනවා කාලයක් යන කොට කියනවා එහෙම නෙවෙයි කියලා. නමුත් ඔබතුමා මම දැක්කෙ නැහැ. ඒකට අවස්ථාවක් දුන්නා නෙවෙයි. නමුත් මම කියන්නෙ වෙරංග මන්ත්‍රීතුමාටවත් මටවත් වෙන කිසිම කෙනෙකුටවත් එහෙම කරන්න දෙන්න බැහැ. සභාවෙ මුලින් ආපු 15 දෙනා හරි 27 දෙනා හරි තමයි තවම ඉන්නෙ. ඒක නිසා සභාපතිතුමනි, ඔබතුමා සමහර තීන්දු කාලෙන් කාලෙට වෙනස් කරන්න යන්න එපා. ඒ ගැන මේ අවස්ථාවෙ විශේෂයෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමත් කෙලින් තීරණ ගන්නවනම් ඔබතුමාට මේ වගේ කතා අහන්න වෙන්නෙ නැහැ. අපි කණගාටු වෙනවා. මේ සභාවෙදි ඔබතුමාට එහෙම චෝදනා කරන එක ගැන. නාගොඩ විතාන කියන සභාපතිතුමා හොරෙක් නෙවෙයි කියලා අපි

දන්නවා. නමුත් මම මෙහෙම කියලා ඔබතුමාගෙන් හෙට මොනවත් ඉල්ල ගන්න නෙවෙයි මේ කියන්නෙ. මේ ඉතිහාසය පුරාවටම අපි සමහර කාලවල් වලදි යම් යම් දේවල් දැක්කා. එක එක සභාපතිවරුන්ගෙ කාලෙ අපේ ප්‍රදේශවල දැකපු දේවල් එක්ක බැලුවම සාපේක්ෂව ඔබතුමා හොරෙක් නෙවෙයි. නමුත් ඔබතුමා ඔබතුමාගෙ මන්ත්‍රීවරුන්ට හොරකම් කරන්න අවස්ථාව දීල තියෙනවා. ඔබතුමාගෙ යටතෙ ඉන්න නිලධාරීන්ට ඕන ඕන විදියට හැසිරෙන්න සහ ඒවට පහසුකම් ඉඩ සලස්වල තියෙනවා. ඒක තමයි ඔබතුමාගෙ වැරැද්ද. ඒ වැරැද්ද අර වැරැද්දට වඩා වැඩියි. මොකද අරකෙනම් චෝදනාවට ලක් වෙන්න කෙනෙක් හිටියා. නමුත් මෙතනදි ඔබතුමා ඒ වැඩේ නොකළාට මුලු සභාවම දැන් ඒ තත්වයට පත්වෙලා. ඒ ගැන කණගාටුවෙන් වුනත් කියන්න ඕන. අපි ඉන්න කාලෙක මේ වගේ වෙනවනම් ඒක ඇත්තටම අපි කතා කළ යුතුයි.

විශේෂයෙන්ම සභාපතිතුමනි, මම මේ කියන්න ගියේ. අපේ වනිගරත්න මන්ත්‍රීතුමාගෙ කතාවෙදි කිව්වා. එතුමාටත් මම හිතන්නෙ ලක්ෂ දෙකක් දෙන්න ඇති මේ ගරු සභාවෙන්. රුපියල් 15000 ක වැඩක් ගැන එතුමා මේ සභාවෙ කතා කරනවා. රුපියල් දහ පහලොස් දාහක වැඩක් තමයි තියෙන්නෙ. ගරු සභාපතිතුමනි ඔබතුමා ඒ ලක්ෂ දෙකට අමතරව හරි පුලුවන්නම් ඒක දීල ඉවර කරන්න. අර එතුමා කියපු විදිහට සිංහල අවුරුද්දට කලින්. ඔතන මම හිටියනම් සමහර වෙලාවට ඒ රුපියල් 15000 මගේ දීමනාව හරි දීල ඒ වගේ පොඩි වැඩක් නම් මම ඉවර කරන්න බලනවා. මම හිතන්නෙ මම කියන්නෙ ඒක පරිත්‍යාගයක් හරි විදිහට කරලා රුපියල් දහපාලොස් දාහක වැඩක් මේ ගම් දෙකක් යාකරන වැඩක්. මොනව හරි යම් බලයක් පාවිච්චි කරලා ඒ දේ මොකද මමත් යන එන නියෝජනය කරන ගම් ප්‍රදේශ. විශේෂයෙන් මේක නාගොඩ ප්‍රාදේශීය සභාවෙ නෙවෙයි මම හිතන්නෙ. අද වෙන කොට උඩුගම ප්‍රාදේශීය සභාව. උඩුගම තමයි ප්‍රශ්න තියෙන්නෙ.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, අපේ සමන් මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළා. පෙරපාසලක් ගැන. එතුමා පහුගිය උත්සවයකදිත් මට කිව්වා. සභාපතිතුමනි එතුමගෙ කොට්ඨාසෙ පෙරපාසලක් නැහැ. එතුමා නිල ඇඳුම් බෙදන්න උත්සව වලට ආවෙ වෙනත් කොට්ඨාසවල. එතනදි කිව්වා මගේ කොට්ඨාසෙට වසම් තුනටම පෙරපාසලක් නැහැ කියලා. ඇත්තටම අති දුෂ්කර ගමක් වටවල වතු සමාගමෙන් ඒ පහසුකම් සපයනවනම් ඔබතුමා යම් ක්‍රමවේදයක් හදාගෙන. ඒ සඳහා සභාවට බර පැනක් නොවෙන විදිහට හරි ඒ අයිතිය අපට ලබාගෙන කටයුතු කරනවනම් වඩා සුදුසුයි කියල මේ අවස්ථාවෙ අපේ කැමැත්ත ප්‍රකාශ කරනවා. පක්ෂ බේදයකින් තොරව. අපි කරන හොඳම කටයුත්ත තමයි පෙරපාසල් පවත්වා ගෙන යන එක. ඒක හින්දා ඒ සඳහා ඔබතුමන් මීට වඩා පොඩ්ඩක් මැදිහත් වෙලා ඒ අවස්ථාව සභාවට වාසි දායක අන්දමින් ගන්න අවස්ථාව ලබා ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි ව්‍යාපාරිකයන් ගැන කතා කළා. මීට පෙර ඇත්තටම මම ඕකෙ දෙපැත්තම දකිනවා. මමත් වෙළඳ සංගමයක් නියෝජනය කරනවා. විශේෂයෙන් උඩුගම වුනත් වෙළඳ සංගම්වලින් ඉල්ලීම් කළාට, එතුමන්ලත් එක්ක ඒ වගේම ඉන්නවා. මේ පොල මේ වගේ විශේෂ අවුරුදු කාලෙ වගේ ඒ උත්සව කාලෙදි කීයක් හරි හම්බ කර ගන්න තමන්ගෙ තියෙන සම්බන්ධ කම් වලින් මහරගම ගිහිල්ලා රෙදි ටිකක් හරි ගෙනැල්ල, පාර අයිනෙ හරි සරමක් විකුනල හරි කීයයක් හරි හම්බ කර ගන්න පිරිසකුත් ඉන්නවා. ඒ මිනිස්සු පහසුකම් බලාපොරොත්තු වෙන්නෙ නැහැ. කොහේ හරි පේමන්ට් එකක හරි දාලා විකුණන්න බලාපොරොත්තතු වෙන්නෙ. ඒක මෙහේ නෙවෙයි ගාල්ලෙ නෙවෙයි කොළඹ නෙවෙයි හැම තැනම උත්සව කාලෙට ඒක සිදු වෙනවා. නමුත් ඒ ගොල්ලන්ගෙන් බද්දක් ගෙවන්න කියන එක බලාපොරොත්තු වෙන්න බැහැ. ඒ අය සතියක් හරි අප්‍රේල් 12, 13 වෙනකම් ඒ ව්‍යාපාරයක් කරගෙන කීයක් හරි ජීවත් වෙන්න හම්බ කරගනීවි. නමුත් ඒ සඳහාත් අපි අවස්ථාවක් දෙන්න ඕන. මේ එදා ඉඳලම ඉන්න මහා පරිමානයේ තට්ටු බිල්ඩින්වල ඉන්න ව්‍යාපාරිකයන්ට විතරක් නෙවෙයි. හැම කෙනාම හම්බ කරන්නෙ ජීවත් වෙන්න. ඒක නිසා ඒ අයටත් ඒ මොකක් හරි සාධාරණ ක්‍රමයකට අවස්ථාව ලබා දෙන්න ඕන. ඒකෙන් අපට පාරට

අවහිරයක් එහෙම හානියක් වෙනවනම් ඒක ඉවත් කරන්නත් ඕන. ඒ ගැන මම හිතන්නෙ කියනව වගේම ඕන කටයුත්තක දෙපැත්තක් තියෙනවා. මේ කියන කරුණු ඔක්කෝම සභාපතිතුමාට කිව්වට වැඩක් නැහැ. අපි වුනත් ඇත්තටම දන්නවා. එකෙන් සමහර වෙලාවට පිට පළාත් වලින් ආවත් මිනිස්සු. සමහර වෙලාවට මේ ප්‍රදේශයේ නෙවෙයි නම් ජන ගහනය වැඩි ප්‍රදේශවලට ගිහිල්ලා බඩු විකුණනවා. දැන් අපේ උඩුගම ප්‍රදේශයේ අය පිටකොටුවෙ ගිහිල්ලා කඩ කරන්නෙ. මොකද එන්න එපා කියනවද? ඒ මිනිස්සු කඩේ හරි පේමන්ට් එකේ හරි බඩු විකුණලා හවසට ගෙදර එනවා. දෙහි ටික දොඩම් ගෙඩි ටික එකතු කරගෙන ගිහිල්ලා. කොළඹ ගිහිල්ලා විකුනගෙන එන මිනිස්සු ඉන්නවා. ඒක නිසා කවුරු මොනව කිව්වත් ඒ වගේ මිනිස්සුන්ටත්, ඇත්තටම පල්ලෙහා මට්ටමේ ව්‍යාපාරිකයන්ටත් යම් අවස්ථාවක් අපි දෙන්න ඕන. විරෝධතාවයක් නෙවෙයි ඔබතුමා හොඳ දේ කරන්න. සභාපතිතුමා අපි මෙහෙමයි රටේ ලෝකෙත් එක්ක ජීවත් වෙන්න ඕන. දැන් බලන්න උඩුගම පෙරහැර තියෙනවා. ඔය පෙරහැර කාලෙට ඇවිල්ල පාර දෙපැත්තෙ සෙල්ලම් බඩු කඩ, බැලුම් බෝල, ඔය එක එක ඒව එල්ලගෙන විකුණනව. කඩල කරත්ත එනවා. අයිස්ක්‍රීම් එනවා. නමුත් ඉතිං අයිස් ක්‍රීම් කඩකාරය කියනවනම් මම තමයි සභාවට ගෙවන්නෙ කියලා. එහෙම බැහැ. එයාට නෙවෙයි ඒ මිනිස්සුත් එක්තරා කොට්ඨාසයක්. මොනම හරි ඒ වෘත්තියෙ තැන් තැන්වල ගිහිල්ලා. ජීවත්වෙන එහෙම ඔබතුමා මේකෙ හරි දේ තීරණය කරන්න. මොකද ව්‍යාපාරිකයො ඇවිල්ලා අපිට බදු ගෙවන්නෙ රුපියල් 750 හරි 1000 හරි ගෙව්වයි කියලා. සමහර වෙලාවට අපට ඒ අය කියන සියලු දේ කරන්න කරන්න බැරිවෙයි. ඒක නිසා මේ කතාව මධ්‍යස්ථව ඔබතුමා බලන්න. මොකක්ද කරන්න ඕන කියලා. ඒක අපට හානියක්, අවාසියක් වෙනවනම් ඒක කරන්නත් ඕන. ඒ වගේම ඒකෙ වාසියක් වෙනවනම් ප්‍රදේශයේ මහජනතාවට සමහර වෙලාවට අඩුමිලට දෙනවනම් කඩේට වඩා මිනිස්සු එතනට යනවා. ඒක නිසා ඒකත් සලකන්න ඕන.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ගමගොඩ පාලම බෝඩ් එක විතරක් ගහල වැඩක් නැහැ. බම්පර් දාල වැඩක් නැහැ. හෙට අනිද්ද වෙනකොට වාහනයක් එක්ක කඩන් වැටෙන්න ආසන්නයි. මොකද මම දිනපතා යනවා. මගේ බස් එකේ වැඩ කරන රියදුරු මහත්තයත් ඉන්නෙ ගමගොඩ ප්‍රදේශයේ මම හැමදාම උදේට බස් එක එයාට ගිහින් දෙනවා. එයාලයි ගෙදර ඉදන් ස්කූල් බස් එකට එන්න බැහැ. මම දිනපතා යන පාරක් නිසා දකිනවා. ඒක කොයි වෙලාවක හරි වාහනේකුත් එක්ක කඩන් වැටෙන්න ඔන්න මෙන්න. පන්සලේ හාමුදුරුවොත් මාත් එක්ක කතා කළා. හාමුදුරුවො කියන්නෙත් බෝඩ් ගහන්නත් එපාලු. බම්පර් දාන්නත් එපාලු. ඕක කැඩෙන්න අරින්නලු. එතකොට තමයිලු මේ මිනිස්සුන්ගෙ ඇස් ඇරෙන්නෙ. නැත්නම් ඕක හැදෙන්නෙත් නැහැ. ගිය සැරේ තාවකාලික පිළියමක් කරලා ටික දවසක් ගියා. නමුත් ඕකෙ යන ඩිලිවරි වාහන සහ කාබිල් වත්තට එන ගොඩක් වාහන එන්නෙ ඔය පාරෙ. ඒ වගේම දලු වාහන එනවා. ඒක මම හිතන්නෙ මේ මොනව හරි හරිදෙයකට යොමු කරලා. ඉක්මනින් ඒකට පාලමක් ලබා ගන්න වැඩසටහනකට යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් ගරු සභාපතිතුමනි ප්‍ර දේශයේ ව්‍යාපාරිකයන්ට මම අර ඔබතුමාගෙ කතාවෙදි මම අර වෙරංග මන්ත්‍රීතුමා කියපු වෙලාවෙත් මම කිව්වෙ. අපේ ප්‍රදේශයේ ඉන්න ව්‍යාපාරිකයන් ගැන අපි බොහෝම අමාරුවෙන්කතා කරනවා මෙතන. ඒ ගොල්ලන්ට අසාධාරණයක් වෙනවා මෙතන මෙහෙම කියලා. නමුත් අපි මම අර කලින් කිව්ව වගේ අපේ මේ වියදම් වාර්තාවල බැලුවම අපි කොච්චර දේවල් පිටටද වියදම් කරන්නෙ. දැන් මේ ප්‍රදේශයෙන් අපේ නාගොඩ ප්‍රාදේශීය බල සභා ප්‍රදේශයේ නැත්තෙ මොනවද? සමානොයයන් බැලුවොත්. අපි නමුත් අපි හැම තැනින්ම කොටේෂන් කොල් කරන්නෙ. වාහනේ හෝදන එකේ ඉදලා ටයර් එක ගන්න එකේ ඉදලා බැටරිය ගන්න එකේ ඉදලා සර්විස් එකේ ඉදලා කර්ටන් රෙද්ද මොකක්ද අපි පිටින් ගේන්නෙ නැත්තෙ. බල්බ් එක හැම දේම ගන්නෙ මේ ප්‍රදේශයට පරිභාහිරව. එක්කො කොළඹින් එක්කො අඩුමගානෙ යක්කමුල්ලෙන්. නැත්නම් ගාල්ලෙන් අපි අඩු ගානෙ සීල් එකක් කපනවද බලන්න අපේ ගමෙන්. මොකද සමහර

වෙලාවට ගානත් අඩුයි. මොකද ගාල්ලෙ තැනකින් කරන සීල් එක රුපියල් එක්දහස් ගානක් යන එක මෙහේ රුපියල් 600 ට 700 ට කපන්න පුලුවන්. නමුත් අපි ඒක බලන්නෙ නැහැ. නමුත් අපි බොරුවට සභාවෙ ඇවිල්ලා ව්‍යාපාරිකයො ගැන එහෙම කඳුලු හෙලනවට වඩා හොඳයි. අපට මොකක්ද අපේ යන වියදමකින් අපි ලක්ෂ ගණන් මාසෙට ගෙවන බිල් අපේ ව්‍යාපාරිකයන්ට දෙන්න පුලුවන් ක්‍රමයක් හදලා. අපේ ගානට ඒ ගොල්ලා ගෙන්න ගෙන එහෙම කුමයක් හදනවනම් වඩාත් සුදුසුයි කියල මම මීට කලිනුත් ඕක කතා කළා කරල තියෙනවා. ගරු සභාපතිතුමනි ඉදිරියෙදි වත් ඒ ගැන අවදානය යොමු කරන්න. ඉදිරියෙදිවත් ඔබතුමා මම හිතන්නෙ මේ සභාවෙදි අද වෙච්ච සිද්ධිය ගැන මම කණගාටු වෙනවා. ඔබතුමා එහෙම අපි දන්නෙ නැහැ ඔබතුමාලගෙ මොනවද පක්ෂයේ මොනවද තීන්දු. ඔබතුමාල කොහොමද එකගතාවයට පත්වෙලා තියෙන්නෙ කියලා. මේ වගේ ගරු සභාවකදි ඒ වගේ තත්වයට පත්වෙන එක ගැන කණගාටු වෙනවා.

අවසාන වශයෙන් ගරු සභාපතිතුමනි ඔබතුමා කතා කළා. උඩුගම පොල ගැන මම ගිහිල්ලා මම මොකක්ද පොලීසි යන්නත් පොලීසියටත් අල්ලන් යනවයි. නැත්නම් රිමාන්ඩ් වෙන්න හැදුවයි කියලා. සභාපතිතුමනි එතන ලොකු වැරැද්දක් වුනා. දෙසැම්බර් 31 වෙනිදා 2020 දෙසැම්බර් 31 වෙනිදා උඩුගම ප්‍රදේශයේ පොල අවට ත්‍රීවිල් සංගම් සහ කඩවල්වල අය මට දවල් 12 ට විතර කතා කරනවා. මෙන්න මේ විලේගේ සභාපතිතුමාගෙ කාලෙ අපිත් ඉල්ලුම් කරලා හදපු අර පොලේ කැටගල් අල්ලපු එක කඩලා මැෂින් එකක් දාලා ස්කැවේටරයක් දාල කඩ කඩ අලුතෙන් කනු හිටවන්න හදනවයි කියලා. මම ඒ ස්ථානයට ගිහිල්ල බලන කොට ඒ සිද්ධිය ඇත්ත. එතකොට වැඩෙත් අවසානයි. කිසිම නිරීෂකයෙක් නැහැ. බලධාරියෙක් නැහැ. ඒ කීප දෙනෙකුට ඕන විදිහට සහ අපේ සභාවෙ මුර කරන කෙනෙක් ඉන්නවා. මම ඇහුව මල්ලි ඔයාද මෙතන බලධාරිය කියලා. ඊට පස්සෙ නෑ මගේ මේ අයිය කෙනෙක් වැඩ කරන හින්ද මැෂින් එකේ ඒ හින්ද මම ආවයි කිව්වා. ඊට පස්සෙ මම කිව්වා කවුද මෙතනට මේ වැඩේ භාර දීල තියෙන්නෙ. ඊට පස්සෙ මට අපේ තාක්ෂණ නිලධාරීතුමා කතා කළා. මම දවල් ඇවිල්ල බලල ගියා. නමුත් මෙතන වෙන්නෙ හානියක්. දැන් මිනිස්සු කියනවා. ඒකයි මමත් ඇවිල්ල බැලුවෙ. ඔය වැඩේ ඔහොමම නවත්වන්න කියලා. ඊට පස්සෙ මම ඇහුවා දැන් කවුද මේක කියපු එක්කෙනා කියල මම ලිඛිතව ලියුමක් ගත්තා. මේක කොයි ආකාරයෙන්ද වුනේ කියලා ඒ අවස්ථාවෙ ගරු සභාපතිතුමාත් එතනට එන්න සිද්ද වුනා. ඇවිල්ල ඔය කතාව කිව්වෙ. නමුත් මට පොලීසි යන්න නෙවෙයි එතන වෙච්ච දේ ලොකු වැරැද්දක් වුනා. ලොකු හානියක් වුනා. සභාවෙන් ලක්ෂ 50 ක් වියදම් කරල හදපු පොලේ කැටගල් ටික මැෂින් එකක් දාලා ඕන ඕන විදිහට කඩලා. පරිස්සමකින් තොරව ගලවනව නම් ඒකට විරුද්ද වෙන එකට පොලීසි ගියත් කමක් නැහැ ගරු සභාපතිතුමනි. ඒක තමයි වුනේ ඔබතුමා ඇවිල්ල ඒකෙ වගකීම භාරගන්නවයි කිව්වා. වගකීම භාරගත්තයි කියලා ඒ හානියේ වගකීම භාරගන්න බැහැ. මීට කලිනුත් ඒ වගේ වගකීම් ඔබතුමා භාරගත්තා. ලයිට් රුපියල් 12500 යෙ 7000 ට තියෙන ලයිට් ගෙනාපු වෙලාවෙ ඔබතුමා කිව්වා. ඒකෙ වගකීම භාරගන්නවයි කියලා. නමුත් ඒකෙ අලාභෙ ඔබතුමාට දරන්නත් බැහැ. ගෙවන්නත් බැහැ. ඒක අලාභෙ අලාභෙමයි. 12500 ට ලයිට් ගේන කොට 7000 ට ඒක තියෙනවනම් එතන තියෙන අලාභෙ අපි හොයල බලන්නෙ නැතුව හරි, වංචාවක් වෙලා හරි, නොවී හරි, අර සභාපතිතුමනි කැටගල් වලත් ඒකයි මම මේ කියන්නෙ අර හදලා විවෘත්ත කරන්න කලින් පොලේ කැටගල් ටික ආපහු අයින් කරනවනම් එතකොට ඒකෙ වෙන හානිය මොකක්ද? ඒ වට කීයක් වියදම් කරලද? ඇයි එහෙම අච්චර ඉඩ තියෙන පොලේ කඩල බිදල ඕන ඕන විදිහට කරන්න ඉඩ දෙන්නෙ කියලා. වගකීම භාරගන්න එක නෙවෙයි වැඩේ. සභාපතිතුමනි, ඒකෙ වෙච්ච හානිය මම පොටෝ ගැහුවා. මම පෙන්නන්නම් මම අද පොත් එක ගෙනාවෙ නැහැ. ඔබතුමාට මම පොටෝ ටික දෙන්නම් ඒකෙ හානිය පේනවා.

ඒක මිනිස්සු ඒක තමයි මම කියන්නෙ මේ ඉන්න අපේ සභාවෙ ඉන්න මුරකරන අයට ඕන විදිහට වැඩ කරන්න දෙන්න එපා. මේක ඔබතුමා සභාපතිනම් තාක්ෂණ නිලධාරී හරි ඒ අදාල කෙනා ඒ හරි

අධීක්ෂණයක් යටතේ හරි විදිහට කරන්න කියන්න. තාක්ෂණ නිලධාරී ඇවිල්ල ගියා. එතුමගෙ වැරැද්දක් නැහැ. එතුමා කියල ගියා නමුත් ඒකෙ හානියක් වෙනවනම් ඒ හානිය අපට පේනවනම්, මහජනතාව අපට කෝල් කරනවනම්, ඒ ගිහිල්ල බලන එක අපේ යුතුකම නෙවෙයිද? ඒක නිසා සභාපතිතුමනි, ඉදිරියෙදි ඒ ගැන ඔබතුමාගෙ අවදානය යොමු කරලා අර වගේ චෝදනාවලට ලක් නොවෙන්න විශේෂයෙන්ම අර යකඩවලත් කතාව ඒක තමයි. ඔබතුමාට පැමිණිලි කළාම කියනවා ඕක දවස් තුනකට කලින් කතාවක් කියලා. මේ ඔබතුමත් එක්ක තර්ක කරනවා නෙවෙයි. අවසානයේ සභාපතිතුමා ඕක දුර දිග ගියොත් ඕකෙ වෙච්ච හානිය ඉවර නැහැ. ඔය ප්‍රශ්නෙ ඉවරත් නැහැ. ඕක දුර දිග ගියොත් ආයිමත් කීදෙනෙකුට වැඩ තහනම් වෙනවද කියලා බලන්න. ඒ වගේ ප්‍රශ්න ඇති වෙනවා. කවුරු හරි මහජනතාව කියනවනම් ඒ ගැන පොඩ්ඩක් අවදානය යොමු කරන්න. ඕක පරන කතාවක් දවස් දෙක තුනක් වෙන එකක් දැන්ද කියන්නෙ කියල අහන එක නෙවෙයි කතාවෙ ඇත්ත නැත්ත බලන්න. සභාපතිතුමා ඒක දැනුවත් වුනාට පස්සෙ හරි ඒතන ඉදල හරි නිසි ක්‍රියා මාර්ගය මොකද උඩුගම ඩිපෝවෙ ගහක් කැපුවා. අද වෙන කොට මොකක්ද වුනේ. ඒ වගේ තමයි ඕවත්. ඉතිහාසෙ ගැන කතා කළොත් ගොඩක් කතා තියෙනවා. සභාපතිතුමනි, ඉදිරියෙදිවත් අපි මේ ආකාරයේ කටයුතු නොවෙන්න ඔබතුමා ඔය තනතුරේ ගෞරවය රැකගෙන, මන්ත්‍රීවරුන්ටත් තමන්ගෙ තනතුරේ ගෞරවය රැක ගන්න පුලුවන් ආකාරයට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින්, මා නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්,**

ගරු මන්ත්‍රීතුමා, වෙරංග මන්ත්‍රීතුමා ප්‍රකාශය කරපු වෙලාවෙ ඔබතුමත් ඒකට උත්තරයක් දුන්නානම් මෙතන සාකච්ඡා කරන්න තිබුණා. අනවසර ඉවත් කරන්න කියලා දැන් මම නියෝගය දෙනවා. දැන් ඔබතුමා ඒකට විරෝදතාවයක් දක්වනවා. දැන් මොකක්ද මම ගන්න ඕන තීරණය. අනවසර අයින් කරන්න ඕන. නමුත් ඉතිං එක පාර්ශවයක් කියනවා එකක්. තව පාර්ශවයක් කියනව තව එකක්. සභාවක් හැටියට මිනිස්සුන්ට සාධාරණ මිළකට බඩු ගැනීමට අපි අවස්ථාව දිය යුතුයි. ඒ අනුව වෙනත් ප්‍රදේශවලින් වෙළඳුන් ඇවිල්ලා පේමන්ට් බිස්නස් කරනවා. ඒකට ගමේ ව්‍යාපාරිකයන් විරුද්ධයි. ඒ නිසා මේ පිළිබඳව සාධාරණව කටයුතු සිදු කරන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් මදුසංක මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. මට අත්‍යවශ්‍ය කාරණාවක් සඳහා සභාවෙන් බැහැර යන්න ඕන නිසා පොඩි කාරණාවක් තියෙනවා ගරු සභාපතිතුමනි. මම ගිය සභා වාරෙත් කිව්වා කැටගොඩ පාලම සම්බන්ධව. තවම ඒකට පළිතුරක් නැහැ

අනිත් කාරනාව තමයි ගරු සභාපතිතුමා, ඔබතුමා මෙතනදි යම් යම් අපහසුතාවයන්ට පත් වෙනවා. ඒ පත් වෙන්නත් ඔබතුමාගේ යම් අඩුපාඩු තියෙයි කියලා මම විශ්වාස කරනවා. මොකද මම නම් වශයෙන් කියන්න එහෙම කැමති නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, අපට සභාවෙන් ගන්න තියෙන යම් සමහර දේවල් අපි හොයන කොට නැති වුනාට, පිට කඩවල තිබුනු අවස්ථා තියෙනවා. ඒව යන විදිහත් තියෙනවා. ඉතිං ඒවයි හරි අධීක්ෂණයක් දැනට නෙවෙයි මීට අවුරුද්දකට විතර කලින් එහෙම දෙයක් වුනා. කොම්පෝස්ට් පොහොර මම මෙහේට ආවම ගන්න නැති වුනා. නමුත් මේ සභා බල ප්‍රදේශයේ යම් කඩේක තිබුණා. ඉතිං මට දෙපැත්තම ඕන නිසා මම සද්ද නැතුව හිටියා. ඉතිං ඒ වගේ කාරණා තියෙනවා. එක තැනක් විතරයි ඒ. මම ගත්තෙ නැහැ මම ගියහම මට විස්තරේ කිව්වා. මෙන්න මෙහෙමයි කියලා. ඒ කාලෙ ඉදලා ඔය වගේ පොඩි පොඩි දේවල් ලොකුවට සිද්ද වෙනවා. ඉතිං ඒ දේවල් වෙන කොට ඒවයි අපකීර්තිය අපහසු තාවයට පත් වෙන්නෙ ඔබතුමා. ඉතිං ගරු සභාපතිතුමා මම කියන්නෙ ඉදිරියටවත් ඒ වගේ වැඩකටයුතු නොවෙන්න වග බලා ගන්න ඕන.

සියලු දෙනා අතින් වැරදි සිද්ද වෙනවා. නමුත් ඒ වැරැද්ද දිගමට සිද්ද වෙනවනම්, ඒක කොහොම නිවැරදි විය යුතුද කියල මම දන්නෙ නැහැ.

අනිත් කාරණාව තමයි ගරු සභාපතිතුමනි, පහුගිය යහපාලන ආණ්ඩුව කාලෙ අපේ වනමල් මන්ත්‍රීතුමා කිව්ව විදිහට කාපට් ව්‍යාපෘති ඇවිල්ලා, කියන්න සංතෝෂයි. අද මාපලගම ඉදල කොළඹ කඩේ දක්වා එතුමන්ල කියන විදිහට ඒ සල්ලිවලට පාර කාපට් කරන්න අද පටන් ගන්නවා. දැන් මෙතුමල කියන්නෙ මෙතුමල දුන්නයි කියලනෙ. ඉතිං ඒකටත් මෙතුමන්ලාට ස්තූති වන්ත වෙමින් මා නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්,**

ගරු මන්ත්‍රීතුතුමා, කැටගොඩ පාලමේ  අවශ්‍ය අළුත්වැඩියාවන් මොනවද කියලා බලන්න,  අදම ඉංජිනේරු මහත්තයා  යනවා කිව්වා.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමනි සියලු දෙනාගෙන්ම අවසරයි. අපේ වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමා නැගූ ප්‍රශ්නයක් තමයි. වප් මගුල් උත්සවය හවස් වරුවෙ පැවැත්වීම සම්බන්ධව. මම අහන්න කැමතියි මන්ත්‍රීතුමා ඔබතුමා දැන් මේ ප්‍රාදේශීය සභාවට ඇවිල්ලා අවුරුදු ගානක් වෙනවා. ඔබ කරපු එක වප් මගුල් උත්සවයක් තියෙනවද ගමේ. සාම්ප්‍රදායික ගොවියාගේ ඒ ගොවිතැන පිළිබඳව ඒ කටයුතු පිළිබඳව ඔබතුමා දැනුවත් නොවීම ගැන මම කම්පාවට පත්වෙනවා. මොකද මගේ සහෝදර මන්ත්‍රීවරයෙක්, වැඩිහිටියෙක් ඒ වගේම ඥාති වරයෙක්. ඔක්කොම තියෙද්දි ඔබතුමා ගොවියන් ගැන ඒ නගපු ප්‍රශ්නය පිළිබඳව ඔබතුමා දැනුවත් වීමක් නැති කම තමයි මම හිතන්නෙ. අපි වප් මගුල් උත්සවයක් සංවිධානය කළා. ඒ  වප් මගුල් උත්සවය සංවිධානය කරල ඒ  වප් මගුල් උත්සවය සිදු කිරීමට අපි නැකත් පත්‍රයක් හදල තිබුනා. ඒ නැකත් පත්‍රය අනුව අපි වැඩකටයුතු කළේ. මොකද අපට අවශ්‍යතාවය තියෙන්න, ගොවියාගේ ඒ කටයුතු කරන්න. අපි ප.ව. 12.00 ට කලින් වප් මගුල් උත්සවයට අනිවාර්යයෙන්ම කුඹුරට බහින්න ඕන. හවස් වරුවෙ මළහිරු බහින වෙලාවට කුඹුරට බැහැල වැඩ පටන් ගන්නෙ නැහැ. ඉර නගින්න එන වෙලාවෙදි නැකතක් හදනවා. ඒ නැකත එන්නෙ ඉර නැගුමත් එක්ක. එතකොට නැගෙන ඉර බලාගෙන අපි වැඩ කටයුත්ත ආරම්භ කරල තියෙද්දි ඔබතුමාට ඇහෙන්න ඇත්තෙ වෙන දෙයක්. ඔබතුමා එන්න කියලා ආරාධනා කරනවා. දැනටත් ඉදිරියෙදි තියෙන දේවල්වලට සහ සම්බන්ධ වෙන්න. හැබැයි ඔය වගේ දේවල් කියනකොට පරිස්සමින් කියන්න. මන්ත්‍රීතුමා මම ඔබෙන් ඉල්ලා සිටියා මම ඔබතුමා හරි ආදරෙන් පිළිගන්නවා. හැම තැනදිම මම ඔබතුමාට කතාවක් දීල තමයි මම කතා කරන්නෙ. ඒක මගේ හැටි. ඒ ඔබතුමා පිළිගන්න. වප්මගුල් උත්සවය කෘෂි කර්ම දෙපාර්තමේන්තුව විසින් සංවිධානය  කළේ. වප් මගුල් උත්සව දෙකක් තිබුනා. මූලන ප්‍රදේශයේ එකක් තිබුනා. අනිත් එක තිබුනේ ඇටඹගහවිල යායේ. යායවල් දෙකක දෙකක් තිබුනා. එතකොට ඒවට ඒ කවුරුවත් කියන ඒව පිළිගන්න එපා. මොකද එහෙම කට්ටිය ඉන්නවා. ගොඩක් ඒ තැන්වල. හොඳ දේ දකිනවට වැඩිය නරක දේ ඉස්මතු කරල පෙන්වනවා. දැන් අපේ නම් එතනදි ගිහිපු අනිත් කවුරුවත් මොකක්වත් කිව්වෙ නැහැ. පොහොර ටික දෙන එක පිළිබඳ කිව්වද? ඔබතුමාට ඒක කියල නැහැ. එතකොට අපි එතනදි රුපියල් 10000ක අස්වද්දන්න දෙන එක කිව්වද? ඒකත් කියල නැහැ. ඒ වගේ කොච්චර හොඳ දේවලුත් තිබුනද ඒකෙ. ඒ නැති අර නැති දේ පුංචි දේ අරගෙන ඉස්මතු කරල පෙන්නනවා. ඒක තමයි අර මේකෙ කකුලෙන් අදිනවයි කියන එකට කියන්නෙ. වැඩක් කරන කොට ඒකෙ හොඳ දේ ඉස්මතු කරල දීලා අර පුංචි අඩුපාඩුව අපට කියලා නිවැරදි කරනවනම් කොච්චර වටිනවද. දැන් ඔබතුමා ඕක මට කිව්ව නම් මන්ත්‍රීතුමා මෙහෙමයි කියලා. මම ඔබතුමාට මෙතන අපහසුතාවයට පත් වෙන්න

දෙන්නෙත් නැහැ. එහෙම නම් මම කියනවා මේක මෙන්න මේ විදිහට කළේ කියලා. ඒක නිසා මන්ත්‍රීතුමනි අපේ කටයුතු සියල්ල නැකත් අනුව කරල ඉවර වෙලා, අර අපේ අදාල යම් අපේ දේශපාලනික නායකයෙක්, එතුමා එනකම් තිබුනා. ඒක ඇත්ත. එතුමා ආවයින් පස්සෙ තමයි කතාව පටන්ගෙන ඒ කටයුත්ත කළේ. තේ මේසෙ දුන්නෙත් එතුමා ආවට පස්සෙ. ඒ අනිත් සියලු කටයුතු කරල තිබුනෙ. ඒ පිළිබඳව මම සතුටු වෙනවා. මොකද මට මේ වෙන කොට මගේ කොට්ඨාසයේ අක්කර 30, 40 කට වැඩි පුරන් කුඹුරු ප්‍රමාණයක් අස්වද්දන්න අවශ්‍ය කරන යන්ත්‍රෝපකරන ගරු අපේ සම්පත් අතුකෝරල මන්ත්‍රීතුමා විසින් දකුණු පළාත් වාරි මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් මම හිතන්නෙ ලක්ෂ පහකට වැඩි එහා වියදම් වෙන ඇල මාර්ග පද්දතියක් මේ වෙන කොට සකස් කරල ඉවරයි. ඒ වගේම පළාත් වාරි මාර්ග එකෙන් එහෙම කරද්දි මහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් පුස්සැල්ලකාර කියන ඇනිකට් එක සකස් කිරීමට මේ වෙන කොට සියලු කටයුතු සූදානම් කරලා, ඒකෙත් වැඩකටයුතු කරගෙන යනවා. ඒ නිසා මේ රජය විසින් ඒ වගේම අපට නායකත්වය දෙන සම්පත් අතුකෝරල මන්ත්‍රීතුමා විසින් අපේ ගොවි ජනතාවට විශාල සේවාවක් සිදු කරන මොහොතකදි, ඒ වගේ උත්සව දෙකක් මට තියන්න පුලුවන් වීම පිළිබඳව මම සතුටට පත් වෙනවා.

ඒ වගේම මන්ත්‍රීතුමා කිව්වා. අපේ උඩුගම පාර පිළිබඳව. මන්ත්‍රීතුමාම කියනවා අපේ රජය විසින් නිර්මාණය කරපු දේවල් කියලා. හැබැයි ආපහු මට ස්තූති වන්ත වෙනවා. කාබිල් උඩුගම පාර ඔබතුමා විසින් ඉල්ලීමක් කරල ගත්ත එක පිළිබඳව. ඔබතුමා දැන් මෙතනදි මේ කතා දෙකම කියනවා. මම, මම ගැන හරි සතුටු වෙනවා. මට එතුමාත් එක්ක ගැටලුවක් නැහැ. එතුමා ඉස්සර වෙලා කියනවා. අපේ රජය විසින් පාරවල් කිලෝමීටර් ලක්ෂෙ වැඩසටහන කරලා ඒකෙ ඉතිරි ටිකෙයි මේ කරන්නෙ කියලා. හැබැයි කාබිල් වත්ත උඩුගම මාර්ගය මගේ ඉල්ලීම මත ආවයි කියලා ඔබතුමා කියනවා. හැබැයි ඔබතුමා පෙන්නපු වගේ අදාල තැන් ටිකක් තියෙනවා. ගඟට අවදානම් කලාපයක්. ඒක ඔබතුමා ඉස්මතු කළේ. හැබැයි ඔබතුමාට ඕන වෙලාවක ඇවිල්ලා. මේකෙ යම් අඩුපාඩුවක් තියෙන තැන් අපි ඒ වගේ කතා බහ කරලා, මොකද පාර හැදුවයින් පස්සෙ අපි දෙන්න විතරක් නෙවෙයි. අපේ ගමේ සියලු දෙනාට අඩුපාඩුවක් තියෙන තැන නිහඬ වෙලා ඉදලා. පස්සෙ පෙන්නල වැඩක් නැහැ. ඒ අඩුපාඩුව තියෙන, වතුරට යට වෙන තැන් ඒව අපි දැනට කියල තියෙනවා. ඒවා අපි සාකච්ඡා කරලා, ඒ වැඩකටයුතු කරගෙන යමු. ඒක තමයි අපි එකමුතුව ඒ වැඩේ වෙන්න ඕන. ඒක නිසා උඩුගම මාර්ගය සංවර්ධනයෙදි මේ වෙන කොට කිලෝ මීටර් 7.5 ක සංවර්ධනය කිරීම සඳහා කෝටි 14.5 ක මුදලක් මේ වෙන කොට වෙන් කරලා, ඒ වැඩකටයුතු පටන්ගෙන තියෙනවා. මගේ කොට්ඨාසයේ අපට අවශ්‍යම තිබුන මාර්ගය. මොකද එක පාරක් මට මතකයි මේ සභාවෙදිම මන්ත්‍රීතුමාගෙ පාලන සමයෙදි මේ සභාවෙදි කිව්වා. අපි දැන් ඔන්න උඩුගම යන පාර හදනවයි කියලා. මොකක්ද ඊට ඉස්සෙල්ල පියසේන ගමගේ ඇමතිතුමා විසින් හදපු පාරෙ අර වලවල් ටික වහගෙන ගිහිල්ලා. මන්ත්‍රීතුමා මහා හයියෙන් ලොකුවට කිව්වා. හැබැයි ඔන්න මම දැන් කාපට් එක දාන්න පුලුවන් තත්වෙට අපේ රජයෙන් ගරු සම්පත් අතුකෝරල මන්ත්‍රීතුමාගෙ අධීක්ෂණය යටතේ ගෝඨාභය ජනාධිපතිතුමාගේ සියලු ඒ ක්‍රියාකාරකම් තුල, අපේ ආණ්ඩුව තුලින් උඩුගම පාර කිලෝමීටර් 7.5 ක සංවර්ධනය මේ වෙන කොට ආරම්භ කරල තියෙනවා. ඒක මාස නවයක් ඇතුලත කාලයකදි අවසන් කිරීමට තමයි තීරණය කරල තියෙන්නෙ.

ඒ වගේම මන්ත්‍රීතුමා දැනගන්න තවත් තියෙනවා. මුලන වාඩිය කන්ද මාර්ගය කිලෝ මීටර් දෙකක් මේ වෙන කොට මුලන වාඩිය කන්ද මාර්ගය මැනුම් කටයුතු සියල්ල අවසානයි. ඒ වගේම කැටගොඩ කඩේ සිට කුරුපනාව තේ කර්මාන්ත ශාලාව ඒ වගේම සභාපතිතුමා විසින් එන අන්නාසිගල පාර අන්න එතනට වෙනකම් කාපට් කිරීම සඳහා මේ වෙන කොට කිලෝ මීටර් තුනක් මැනල තියෙන්නෙ ඒකත් සියලු ඇස්තමේන්තු කටයුතු මේව කරල තියෙන්නෙ. ඒ පිළිබඳවත් මම මේ වෙලාවෙ සහිපත් කරනවා. ඒ අතරේ ගරු සභාපතිතුමනි ඒ මාර්ගයේ මම සංවර්ධන කමිටුවෙ

ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා. ඔබතුමාගෙන් නෙවෙයි කමිටුවෙදි ඉල්ලීමක් කළා. යන්නම බැරි මාර්ගය පස් දමා ගොඩ කිරීම සඳහා අවස්ථාව දෙන්න කියලා. ඒකට ඔබතුමා ඒ අවශ්‍ය නිලධාරීන් යවලා ඒ කටයුතු සිදු කළා. ඒකට අවශ්‍ය මුදල් මම හිතන්නෙ මේ වෙන කොට වෙන් කරන්න ඉල්ලීම් කරල ඇති ඒ පිළිබඳවත් සිහිපත් කරමින්

ඊළගට අරුක්ගොමුව මාර්ගය කැටගොඩ මංසන්දිය දක්වා මාර්ගය යා කිරීම සඳහා තමයි බලාපොරොත්තු වුනේ. නමුත් නිගල් කන්ද ආශ්‍රිතව තියෙනවා. පොඩි ගස් පැල දෙක තුනක් අපිට බයක් තියෙනවා. මොකද දැන් ඔය අර මොකක්ද ගහක් අල්ලගෙන පහුගිය දවස්වල දැගලුවා. ඒ වගේ ඔය ගස් දෙක කපන්න ගිහිල්ලා ඒ මාර්ගය ඒ පාර ෆේස් බුක් එකට දාවි. මෙන්න මේ වන විනාශයක් කියලා. ඒක නිසා ඒ මාර්ගය අපි මේ වෙන කොට නවත්වල තියෙනවා. පැල්පිට වත්ත ගාවට වෙනකම් කිලෝ මීටර් තුනක් මේ වෙන කොට මැනලා එතනින් එහාට නවත්වලා තියෙනවා. මොකද නිගල් කන්ද රක්ෂිතයත් එක්ක පහලින් තමයි යන්නෙ. එතන පොඩි ගස් කොලන් දෙක තුනක් තියෙනවා කැපෙන්න. ඒක කැපුනොතින් සමහර වෙලාවට ඇත්තටම ඒක අපි දන්නෙ නැහැ අපි ඉල්ලීමක් කරල තිබුනෙ සංචාරක මාර්ගයක් හැටියට මොකද ඇල්ලක් තියෙනවා. ගිං ගගේ තියෙන එකම ඇල්ල. ඒක බලාගෙන අපේ සංචාරකයින්ට යන්න පුලුවන් වෙන්න අපි ඒ පාර නිර්මාණය කරන්න හැදුවෙ. නමුත් ඒක දැනට අපි නවත්වල පැල්පිට වත්ත දක්වා විතරක් මාර්ගය මැනල තියෙනවා. එතකොට පරණතානායම්ගොඩ කොට්ඨාසෙ සියලු මාර්ග පද්ධති මේ වෙන කොට මැනුම් කටයුතු කරල අවසානයි. ගස් කොලන් කීපයක් කැපෙනවා. ඕකත් එක්ක අපට වැඩේ කෙරෙන්නෙ නැති නිසා අපට කෙරෙන්න ඕන තැනට විතරක් දැනට මැනුම් කටයුතු කරල තියෙනවා. ඒ වගේ මේ වෙන කොට දැවැන්ත සංවර්ධන වැඩ ටිකක් කරල තියෙනවා. මම දැන් මෙතනින් පොඩ්ඩකට කලින් ගිහින් ආවෙ. උඩුමුල්ල ප්‍රදේශයේ පුරන් කුඹුරු අස්වැද්දීමේ පොඩි උත්සවයක් කළා. එහි ගොවියන් ටික එකතු කරගෙන නැකතට 11.49 ට තිබුනෙ. ඒ නැකතටත් අපි වැඩකටයුතු ආරම්භ කරල ආව. ඉතිං මන්ත්‍රීතුමා මම ඔබෙන් ඉල්ලා සිටිනවා. අපි සමග එකතු වෙලා ඔබතුමාල ඇවිල්ලි අවශ්‍ය ඒ යම් අඩුපාඩුවක් තියෙනවනම්, පෙන්නල දෙන්න. ඕන වෙලාවක ඒක අපි අනිවාර්යයෙන් ඉෂ්ඨ කරනවා.

ඒ වගේම මම දැන් ගිහින් ආවා ජයවීර මන්ත්‍රීතුමාගෙ කන්න රැස්වීමට ඔබතුමා දැනුවත් වෙන්න ඕන හින්ද මම කියන්නෙ. ඇත්තමට කන්න රැස්වීමක් අපි කැඳවන කොට එතනට හාමුදුරු කෙනෙක් එන්න අවශ්‍ය නැහැ. මොකද කන්න රැස්වීම කියන්නෙ අපි කන්නයේ වගා කටයුතු පිළිබඳ තීන්දු තීරණ ගැනීමක් තමයි එතන වෙන්නෙ. ගොවි සංවිධානෙ නෙවෙයි එතන තිබුනෙ. එතකොට ඒකට ඇවිල්ලා හාමුදුරුවො යම් අවස්ථාවක් බලෙන් අරගෙන තමයි කතා කළේ. ඉතිං මම ඒ හාමුදුරුවන් ගෙන් ඇහුව එකම ප්‍රශ්නෙ තමයි ඔබ වහන්සේට ඇයි මේ නිලධාරි දෙන්න අතරෙ තියෙන ප්‍රශ්නෙ මට කියන්නෙ. මේ නිලධාරිය හොඳයි අර නිලධාරිය හොඳ නැතෙයි කියන්න ප්‍රශ්නෙ මට කියන්න. ඉතිං හාමුදුරු කෙනෙකුට අදාල නැති සියලුම දෙනා දායකයො ගමේ එතකොට දායකයො තමයි ගොවියො මම යන්නෙ ගොවියන්ගෙ පැත්තෙන්. එයා දායකයන්ගෙ පැත්තෙන් ඇවිල්ල හිටියෙ. ඉතිං හැබැයි ඇත්තටම හරි අසාධාරණයි. හරි මට ඒ එහෙම හාමුදුරුවරුත් එක්ක මම ඇත්තටම ගනු දෙනු කරන්නත් කැමති නැහැ. මම මේ පන්සල්වලට, චීවරයට මම පුදුම ගරුත්වයක් තියෙන්නෙ. එහෙම තියෙද්දි ඇත්තටම මට හරි කණගාටුයි ඒ වගේ ඇවිල්ලා ප්‍රකාශයක් නිකුත් කිරීම පිළිබඳ මම කණගාටුව ප්‍රකාශ කරනවා. කුඹුරුහේන පන්සලේ ඒ හාමුදුරුවන්ට අනවශ්‍ය ප්‍රශ්නයකට මැදිහත් වීම පිළිබදව. මොකද ගොවි ජනතාව වෙනුවෙන් මම ඒ හාමුදුරුවන්ගෙන් ඉල්ලීමක් කරල ආවෙ ඔබ වහන්සෙගෙ දායකයො වෙනුවෙන් ඉදිරිපත් වෙනවනම් එන්න. ගොවි ජනතාවත් එක්ක සියලු දෙනා දිරිමත් කරගෙන ඉන්න නිලධාරියා ශක්තිමත් කරගෙන යන්න කියලා. නමුත් ඉන්න නිලධාරියා එයාගෙ කකුලෙන් ඇදලා පහලට දාලා කවදාවත් කරන්න බැහැ. මොකද ඕනම නිලධාරියෙකුට භාර දෙන ඕන වගකීමක් කරන්න ඕන. අනිත් එක තමයි මම එතනදි සිහිපත් කළා.

ඒ හිටපු නිලධාරි තුමිය දක්ෂනම් ඒ දක්ෂතාවය මට ඕනකම තිබුනා. මොකද මම මේ වපසරියෙම සභාපතිවරය වශයෙන් අර දුර්වල තැනක් තිබුනා එතනට තමයි මම ඒ නිලධාරි තුමිය දැම්මෙ මොකද දක්‍ෂතාවය අනුව මට වැඩගන්න ඕන. එතන ශක්තිමත් කරන්න ඕන. ඒ නිසා, ඒ නිලධාරීතුමියත් එක්ක වැඩ කරගෙන යන්න කියල මම අපේ මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එහෙමනම් සියලු දෙනාටම තෙරුවන් සරණයි මම යනවා. මට අවසරයි සභාපතිතුමනි, අපේ ගෙදර අවුරුදු අටක් ජීවත් වෙච්ච මනුස්සයෙක්ගෙ අවසන් කටයුතු වෙනවා. ඒක නිසා එතනට පොඩ්ඩක් සහසම්බන්ධ වෙන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මම අපේ සහෝදර මන්ත්‍රීතුමා යන්නට පෙර ඔබතුමාට ස්තූති වන්ත වෙනවා නැවැත්වීම පිළිබඳව. අද අපේ කන්න රැස්වීම තිබුනා. නමුත් මෙතුමා පැවසූ ආකාරයට මම හිතන්නෙ හාමුදුරුවො අනිවාර්යයෙන් සහභාගි වෙන්න ඕන. ඒ කියන්නෙ අපි දානයක් සඳහා පූජා කරන්නෙ අපේ හාමුදුරුවන් වහන්සේට. ඒ නිසා අඩුපාඩුකම් තියෙනවනම් හාමුදුරුවන් වහන්සේ එතනට ගිහිල්ලා ඒව කිව්වට කිසිම කෙනෙකුට කිසිම දෙයක් කියන්න බැහැ. ඒ මගේ මතය. මම එච්චරයි ඒ සම්බන්ධව කතා කරන්නෙ. මමත් අද එතන්ට ඉන්න ඕන. ඒ වුනාට මගේ මූලිකත්වය තියෙන්නෙ මෙතන. ඒක නිසා මෙතනට ආවෙ.

ඒ නිසා මම මුලින්ම ඔබතුමාගෙන් අහන්නෙ. දැන් න්‍යාය පත්‍රයට යෝජනා දාන්නෙ නැද්ද? යෝජනා එකක්වත් නැතුව තමයි න්‍යාය පත්‍රය අපට ආවෙ. මම 25 වෙනිද තමයි යෝජනා ටික දැම්මෙ. ඇයි යෝජනා දැන් මෙතන කතා කළ එක ඇත්ත. නමුත් යෝජනා න්‍යාය පත්‍රයට තියෙන්න ඕන. ව්‍යවස්ථාවේ වෙනසක් කරලද කියලා මම දන්නෙ නැහැ. දැන් අලුත් ව්‍යවස්ථාවක් තියෙන හින්දා. මමත් ව්‍යවස්ථාව කියෙව්වා. මාස හයකට කලින් දාපු යෝජනාවක් ඊට පස්සෙ ආපහු මාස හයකින් දාන්න පුලුවන්. ඒක නිසා ගරු සභාපතිතුමනි, අපි කියන්නෙ දැන් මේක මේ වගේ නෙවෙයි අපිට ඉහලට යවන්න ඕන. අපි යෝජනා දානවා. අපි මොනවද කළේ. අපිට නිකන් බැහැ. මොකද මේ බදු සල්ලිවලින් අපිට මොකක් හරි දීමනාවක් දෙනවා. අපි ඒක නිසා තමයි මෙතනට ඇවිල්ලා අපේ ගැටලුව ප්‍රශ්නය විසඳන්නෙ.

අනිත් කාරණය තමයි. ගරු සභාපතිතුමනි, සම්බන්ධීකරණ කමිටුව අපට දන්වන්නෙ නැහැ. මම අපේ ගරු ප්‍රාදේශීය ලේකම්තුමිය ගෙන් ඇහුවම කිව්වා. ගරු සභාවට ඒ ලියුම නම් ටිකත් එක්ක දීල තියෙනවා. එහෙම බැරිනම් මට නැවත කියන්න කියලා. ප්‍රාදේශීය ලේකම්තුමිය කිව්වා. ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් ඇහුවම එතුමිය කියන්නෙ, ගරු සභාවට මම යෝජනා ටික දුන්නා. සම්බන්ධීකරණ කමිටුව අපට දන්වන්න ඕන. ඒ කිසිම දෙයක් අපට දන්වන්නෙ නැහැ. ගරු සභාපතිතුමනි, අපට හිතෙන්නෙ මේව නිකන් හොර රහසෙ කරන වැඩක් වගේ. ගරු සභාපතිතුමනි, අපට තියෙන ප්‍රශ්නෙ තමයි. අපි ජනතාවගෙ තියෙන ප්‍රශ්න ගැටලු ටික තමයි ඔතනට ගේන්න ඕන. මෙතනින් විසඳෙන්නෙ නැත්නම් අපි සම්බන්ධීකරණ කමිටුවට යනවා. එතනින් නැත්නම් දිස්ත්‍රික් සම්බන්ධී කරණ කමිටුව වෙනත් මාර්ගයකින් යවන්න ඕන. නමුත් අපි යෝජනා ටික දැම්මට අපට කතා කරන්න විදිහක් නැහැ. ඒ ගැන මම ඇත්තටම මේ මොහොතේ කණගාටුව ප්‍රකාශ කරනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මම දැම්මෙ මේ සැරේ යෝජනා ටික තමයි. ජංගම පුස්තකාල රථය ඒ වගේම තමයි පොහොර සම්බන්ධව. පොහොර ගබඩාව පුලුල් කරන්න ඕන. ඇත්තටම අපේ ගොවිජන මධ්‍යස්ථානයේ පොහොර හිගයි. සමහර වෙලාවට රෑ 12 ටත් පොහොර ගේනවා. ගෙනැල්ලා එක්කො වාහනේ කැඩුනයි කියලා තවත් කාගෙ හරි ගෙදරක පොහොර ටික බානවා.

එහෙම නීතියක් නැහැ. අනිත් එක තමයි දැන් හවස ගොවියො එන්න ඕන පහ හයට පොහොර ටික ගේන්න. පොහොර ටික මග දාන්නෙ. ඔන්න ඕකයි තත්වෙ රාජ්‍ය තියෙන හැටි. ඇත්තටම අපට කණගාටුයි. ඒ කියන්නෙ ඒ පාක්ෂිකයෙක් නම් විතරයි එහෙම කරන්නෙ. එහෙම බැහැ. එක නීතියක් තියෙන්න ඕන.

අනිත් එක තමයි ගරු සභාපතිතුමනි වීදි ලාම්පු ගැන ඇත්තටම මම කතා කරන්නෙ නැහැ. අපේ පියල් මන්ත්‍රීතුමත් දන්නවා. ඒ වීදි ලාම්පු ටික ඉල්ලුවෙ අශෝක මහත්මයගෙ කඩේ ලග මහ වංගුවක් තියෙනවා. එතන ඇදි නැති බෝක්කුවක් තියෙනවා. අන්න එතනට වීදි ලාම්පුවක් තමයි ඉල්ලුම් කලේ. ඒක තවම නැහැ ගරු සභාපතිතුමනි. ඒ වගේම තමයි මේ ජංගම රථය ගරු සභාපතිතුමනි මේක ඉක්මනට ස්තාපිත කරල දෙන්න. මොකද දන්නවද මේ පුස්තකාල වාර්තාවෙත් තිබුනා. ඒක යෝජනාවක් වශයෙන්. ඒක ඉවත් කරයි කිව්වා. නමුත් එහෙම ඉවත් කරන්න බැහැ. අපේ නුවන පොඩි එකාගෙ පවා මනස දියුනු කරන්න ඕන. අධ්‍යාපනය දිහා බැලුවයින් පස්සෙ මේ නිදහස් අධ්‍යාපනය කිව්වට 13 , 12 වසරවලට පොත් නැහැ. මම යෝජනාවක් වශයෙන් ගේනවා. පුලුවන්නම් අන්න ඒ පොත් ටික පුස්තකාලයට ගේන්න. කිසිම පාසලක නැහැ 12 වසරටයි 13 වසරටයි පොතක්. අපි රුපියල් 1500 , 2000 දීලා ගේන්න ඕන ගාල්ලෙන් පොත් ටික. මගේ දරුවට මම පොත් ටික ගේන්න ඕන සල්ලිවලට. ඔන්න කෝ නිදහස් අධ්‍යාපනයක්. අන්න ඒව යෝජනා වෙන්න ඕන. අන්න ඒ යෝජනා දාගන්න. පුස්තකාල කමිටුවෙ ඉන්නවනම්, මම ඉල්ලා සිටිනව ඒ වගේම ඔය ජංගම රථයට අන්න ඒ වගේ පොත් ටිකක් දෙන්න. එතකොට ඒ දරුවො අරගෙන බලාවි. අපේ අනාගතේ භාරගන්න ඉන්න දරුවො ටික. අර එක පොතක තිබුනා රවීන්ද්‍රනාත් තාගෝර් කියන ඒ ගත්කතුවරයගෙ පොතේ තියෙනවා. අපේ වදනක් තියෙනවා. ලොවෙන් එකෙක් එක් දෙයකට වෙයි සමත ඔහු කියන ඒ කියමන බොරු. ඔහු කියන්නෙ මොකද අපේ ඉන්න මේ සියලුම දෙනා එක දෙයකට විතරක් නෙවෙයි සමත් වෙන්නෙ. වැඩ රාශියකට සමත් වෙන්න පුලුවන්. අපි උදාහරණයක් වශයෙන් ඔහු ගත්තත් ඔහු ගීත රචකයෙක්. අනිත් එක බංගලිදේසේ ජාතික ගීයෙ නිර්මාතෘවරයා ඔහු. ඔහු කතිකා චාර්ය වරයෙක්. ඔවුන් ලියලා තියෙන්නෙ අපට දැන ගන්න. මේ පොත්වල තියෙන වටිනාකම. අපිමේ මොනව කළත් වැඩක් නැහැ. මනෝමූලිකත්වයක් නැත්නම්. ඒකනෙ දැන් වෙලා තියෙන්නෙ. අපට මේ සභාවෙන් ඇත්තටම තේරෙන්නෙ ඒක. මේ ධනේෂ්වර ක්‍රමයක් තියෙන්නෙ මෙතන. අපේ වෙරංග මන්ත්‍රීතුමා කතා කළා. ඇත්තටම මාක්ස්වාදය ගැන සමාජවාදය ගැන. කෝ සමාජවාදයක් කෝ මාක්ස්වාදයක්? කොහෙද තියෙන්නෙ. ඇත්තමට අලුත් පුතා නෙවෙයි. අලුත් දූ ආවත් අලුත් තාත්තල ආවත් මේක කරන්න බැහැ. මේක වෙනස් වෙන්න ඕන. අපි කියන්නෙ ඒක තමයි. අපි ඒකනෙ අලුතෙන් යන්න ඕන. අලුතෙන් ගමන ආරම්භ කරන්න ඕන. දැන් අවුරුදු 73 මේකනෙ කළේ. අවුරුදු 73 අර ගොඩ හොදයි මේ ගොඩ හොදයි. දැන් ඔන්න මේක නරකයි ඊට පස්සෙ එන්නෙ කවුද අර ගොල්ලො. ඒ ගොල්ලොත් ඒකම තමයි. මේ වෙනසක්ද අනිවාර්යයෙන්ම මේක තමයි හොද. ඇත්තටම මොකක්ද මේ වෙලා තියෙන්නෙ. මේක නෙවෙයිනෙ ක්‍රමය. දැන් ඇත්තටම ඔබතුමාල එන්නෙ ඕනම මෙතන ඉන්න සියලුම මන්ත්‍රීවරු සභාපතිතුමා ඇතුලුව ඒ සියලුම දෙනා එන්නෙ ගමට රටට වැඩක් කරන්න. යෝජනාවක් දාන්න මොකක් හරි ඒ යෝජනාව න්‍යාය පත්‍රයේ නැත්නම් තවත් මොන කතාද?

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මම මේ පරිසරය ගැන කතා කරනවා. එදා රුහුණු විශ්ව විද්‍යාලෙන් ඇවිල්ලා. යන්ත්‍රෝපකරණ එක ලග ඉදලා අලුත් ෂෙඩ් එක ලගටම ගස් හිටෙව්වා. නේද පියල් මන්ත්‍රීතුමා නැදුන් ගස් තියෙනවා. පාරෙ මාර, කුඹුක් ගස්, කොහොඹ ගස් හිටවලා තිබුනා. දැන් වෙන්නෙ මොකක්ද එක එක ගහ ඉගිල්ලිලා පාර දිගේ කොටන් දාලා පස් දාලා තමන්ට ඕන ව්‍යාපාරෙ කරගෙන යනවා. නිවාස හදනවා. ඉදිකිරීම් කරනවා. ඒවට කිසිම ක්‍රියාත්මක වීමක් නැහැ. දැන් අපි ගොවිජන සේවා එකෙන් ඇහුවම කියනවා. මට අයිති නැහැ. ආර්ඩීඒ එකට. ආර්ඩීඒ එකෙන් ඇහුවම කියනවා. ගොවිජන සේවා එකට ඒ පාර සභාවට. මේක හොයා බලන්න කිසි කෙනෙක්

නැහැ. මේක කාටද අයිති? දැන් ඔය රතු පස්දාලා කිසිකෙනෙකුට බැහැ ගොඩ කරන්න. රතුපස් ටික දාල ගොඩ කරලා දැන් එතන ඇලක් තියෙනවා. ඒ ඇල මාර්ගය තනිකරම අඩියක ප්‍රමාණය නැහැ. දැන් පල්ලෙහා ඉන්න ගොවියො ටික මොකක්ද වෙන්නෙ. අර රතු පස් ටික ගියාට පස්සෙ. ඒ ලවන ගතිය ගියාට පස්සෙ. අපේ ධර්මසිරි මන්ත්‍රීතුමා හිටියනම් මම අහනවා. එතුමා ගොවි සංවිධානවල සභාපතිලු එහෙම සභාපතිකමක් නැහැ. ඇත්තටම එතන. එයා කමිටුවෙ සභාපති මම කියන්නෙ හරියට බැලුවොත් සභාපතිකමේ ඉන්නත් බැහැ. ඔන්න ඔය වගේ වැඩ මෙහෙමයි මම කියන්නෙ සභාවට ආවනම් එක්කො වෙලාවට එන්න ඕන. වෙලාවට යන්න ඕන. ඇත්තටම කණගාටු වෙන්න ඕන. මේ න්‍යාය පත්‍රය වෙනස් කරන්න. පෙ.ව.9.00 දාන්න ඕන නැහැ 10.00 ට 11.00 ට දාන්න. අපටත් ගෙදර ඉදලා මොකක් හරි වැඩක් කරලා, ඒ වෙලාවට එන්න පුලුවන්. අපි මෙතන දෙන්න තුන් දෙනෙක් එනවා. වාඩිවෙලා ඉන්නවා මොකක්ද මේ වෙන්නෙ. ඇත්තටම කණගාටුයි. හරියට වැඩක් කෙරෙන්නෙ නැති විත්තිය අපි දන්නවා. අන්න ඒ වගේ තමයි ගරු සභාපතිතුමනි, මේ පාංශු ඛාදනය වලක්වන්න නම්, ගල් වැටියක් දාල ඕන. මාස දෙක තුනකට කලින් කෘෂි කර්ම දෙපාර්තමේන්තුවෙන් ආවා. වාහනේ රාජ්‍ය ලාංඡනය ගහලා තිබුනා. එවලෙත් ඩෝසරයක් දාගෙන පස් ටික තුනී කරනවා. ඒ ආපු ලොකු මහත්තයෙක් කියනවා අනේ මචං ඕක ටක්ගාල අයින් කරහන් ඔන්න ඔහොම කතා කරන්නෙ. ඇත්තටම ගරු සභාපතිතුමනි අපට කණගාටුයි. මම ඔබතුමාලට කියන්නෙ බොරුවක් නම් මේ සියලුම මන්ත්‍රීවරු පොඩ්ඩක් ගිහිල්ල බලන්න. මේ මාසෙ ගස් කීයක් තියෙනවද කිය අර පාරෙ. ඊලග මාසෙ ගස් කීයක් අඩුද කියලා බලන්න. විශ්ව විද්‍යාලයෙන් සිටවපු ගස් තියෙන්නෙ 17 ක් 18 ක් වගේ තමයි

සාමාන්‍යයෙන් අඩි අටක් දහයක් වගේ ගස්වලට උස තියෙන්නෙ. අන්න ඒක තමයි. අවසරයක් නැහැ. කැලෑ නීතියනෙ තියෙන්නෙ. මේක තමන්ගෙ පාක්ෂිය නම් ගන්ඩ පුලුවන්. මම අහන්නෙ මේකයි. ගොඩ කරන්න බැහැ. මාර්ගස්ත දෙපාර්තමේන්තුවෙන් බෝඩ් එකක් ගහල තියෙනවා. අඩි 50 ක් ඇතුලත කිසිම ඉදි කිරීමක් කරන්න බැහැ කියලා. මේ ඉදිකිරීම් කරන්නෙ කොහොමද ඊට පස්සෙ ලයිට් දෙන්නෙ කොහොමද? ලයිට් දෙනවනම් ඒත් දෙන්න බැහැ. ඉඩමෙ ඔප්පුව තියෙන්න ඕන. ග්‍රාම සේවක අනුමැතිය දෙන්න ඕන. අපි දැන් සාමාන්‍ය සාමවිනිසුරු සහතිකයක් අපි දෙනවා. එතන මේ දිව්රුම් ප්‍රකාශයක් තනිකර බොරු දීල තියෙන්නෙ එතකොට. එහෙම දෙන්න පුලුවන්ද දිව්රුම් ප්‍රකාශයක් දෙන්න පුලුවන්ද විදුලි බල මණ්ඩලේට. ඔන්න කාගෙයි වැරදි මෙන් මේවා වැරදියි. මම කියන්නෙ අපට මේ ගැටලු ටික විසඳගන්න තියෙන එකම දේ තමයි සම්බන්ධී කරණ කමිටුව. ඒ සම්බන්ධී කරණ කමිටුවට යන්න අපි දිනයක් දන්නෙ නැහැ. මම වනමල් මන්ත්‍රීතුමාගෙනුත් ඇහුවා. එතුමත් දන්නෙ නැහැ. අපේ ප්‍රශ්න ගැටලු ටික ගේන්න ඕන ඔන්න ඔතනට. මේ විහිලුවක්නෙ. මේ මිනිස්සුන්ගෙ බදු සල්ලි වලින් අපි මොකක් හරි මුදලක් අරගෙන මොකක්ද අපි මේ කරන්නෙ

ගරු සභාපතිතුමනි ඇත්තටම මම ගරු සභාපතිතුමාට වරදක් කියනව නෙවෙයි. මම කියන්නෙ. මෙන්න මේ වැරදියි කියන එක. අපට පේන දේත්, හැගෙන දේත්. අපි ජනතාව අතරෙ ඉන්නවා. අනිත් එක තමයි මම සම්බන්ධීකරණ කමිටුවට යොමු කරන්නෙ, අපේ කොට්ඨාසෙ තියෙනවා වයෝවෘද්ද අම්මල තාත්තල ඉන්න වැසිකිලි නැති ගෙවල් හතරක්. අඩි 100 ක් 200 ක් උඩට නගින්න ඕන කන්දෙ අපි ස්වේච්ඡාවෙන් වැසිකිලියක් හදල දුන්නා. ඇත්තටම ඒ මනුස්සයට යන්න බැහැ. ඒක නිසා අපි වැසිකිලියක් හදා දුන්නා. අපිට අන්න ඒ යෝජනා ටික තමයි කමිටුවට දාන්න ඕන. කමිටුවක් කියල තියෙනවා. කමිටුවට මේ යෝජනා එන්නෙ නැත්තෙ ඇයි. අපි කොහොම හරි මේ වැසිකිලියක් වුනත් හදා දෙන්නෙ අන්න ඒකයි. අසරණ මිනිස්සු. ඒවගේම තව ගෙවල් දෙක තුනක් තියෙනව වහලවල් ගහන්න. ඒව කරන්නෙ නැති නිසා තමයි අපි ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා වැසිකිලියක් හදා දෙන්නෙ. ඒ වයෝවෘද්ද අම්මා ඇත්තටම මැරුණට පස්සෙ වැඩක් නැහැ. අපට ගිහිල්ල එතන ඉන්නවත් බැහැ. එහෙම දෙයක් වුනොත් ඒක නිසා අපි දැන් වැසිකිලිය හදල

ඉවරයි. අන්න ඒ යෝජනා ටික තමයි අපි ඔතනට දාන්නෙ. මම අහන්නෙ ඇයි මෙහෙම වෙන්නෙ කියන එක. බොමිස් කියන මනුස්සයගෙ ගෙදර වැසිකිලියක් නැහැ. දූගෙ ගේ තියෙන්නෙ අඩි 100 ක් විතර උඩින් ඒ ගෙදරට ගිහිල්ල වැටිල ඉස්පිරිතාලෙ බෙහෙත් ගේන්න යන කොට තමයි මට ආරංචි වුනේ. මම ගිහිල්ල ඇහුවම, වැසිකිලියක් නැහැ මහත්තයො කියලා කිව්වයින් පස්සෙ මම මුහුනු පොතේ දාලා ඊට පස්සෙ කොළඹින් මහත්තුරු ඇවිල්ල ඒපාර සල්ලි ටික දීලා වැසිකිලිය හැදුවෙ. මම කියන්නෙ ඔන්න ඕව එන්න ඕන කමිටුවට.

ගරුසභාපතිතුමනි තව දේවල් තියෙනවා නමුත් ඔබතුමාලගෙ කාලය නිසා අපි කතා කරන්නෙ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටින්නෙ ඔබතුමාට මේව තේරෙනව ඇති. තේරිල මේව පහද ගෙන සියලු දෙනාටම යහපත් කාලයක් උදා කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි,න් මේ ධනේෂ්වර ක්‍රමය අහෝසි වෙන විදිහට වැඩක් කරලා, මේ ධනේෂ්වර ක්‍රමය අහෝසි කරලා, සමාජවාදී රටක් බිහි කිරීමට සියලු දෙනාටම ශක්තිය ධෛර්යය ලැබේවායි කියල ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්,**

ගරු මන්ත්‍රීතුමා, සභාපතිට බලතල තියෙනවා. ඕනනම් යෝජනා න්‍යාය පත්‍රයට දාන්නත් පුලුවන්. නොදා ඉන්නත් පලුවන්. නමුත් ඔබතුමාට මම ප්‍රකාශ කළේ නිතර නිතර එකම යෝජනාව දාන්න එපා කියලා. ඒ යෝජනාව මීට කලින් මේ සභාවේ යෝජනා වෙලා තියෙනවා.

ගරු මන්ත්‍රීතුමා සම්බන්ධීකරණ කමිටු කැඳවීම සම්බන්ධ පූර්ණ අයිතිය තියෙන්නෙ, ප්‍රාදේශීය ලේකම්ට. සභාවට නෙවෙයි. ඒක ප්‍රාදේශීය ලේකම් එක්ක බේර ගන්න.

ගරු මන්ත්‍රීතුමා කුඹුරු ගොඩ කිරීම සම්බන්ධයෙන් නීත්‍යානුකූල කටයුතු කරන්න අපි ග්‍රාම නිලධාරී, ප්‍රාදේශීය ලේකම්, මාර්ග සංවර්ධන අධිකාරිය ඒ සියළු දෙනා දැනුවත් කරලා ඔය කටයුතු නතර කරලත් තිබුනා. නැවත කුඹුරු ගොඩ කිරීමේ කටයුතු සිදු වෙනවා.

ඒ වගේම ගරු මන්ත්‍රීතුමා වැසිකිලි නැති සෑම නිවසකටම වැසිකිලියක් ලබා දෙන්න කටයුතු කරනවා. මොකද වැසිකිලි නැති සුදුසු සියලු දෙනාටම වැසිකිලි ලබා දීමට කටයුතු කරනවා. ගෙවල් නැති අයට ගෙවල් ලබා දෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, මම ජයවීර මන්ත්‍රීතුමාට පළමුවෙන්ම උත්තරේ දෙනවා. ඔබතුමාගේ නායකයා වන අනුර කුමාර දිසානායක මැතිතුමාගෙ නෝනා යන වාහනේ කීයක් විතර වටීද? මම ඔබතුමාට ගරු කරනවා. ඔබතුමා අහු මුලුවල රිංගල ඒව ඔක්කොම හොයනවා. නමුත් සමාජවාදය කරා ඔබගේ නායකතුමා යන්නෙ නැහැ. අපි ඒ ගැන තර්කයක් නැහැ. ඒක නිසා මම ඔබතුමත් එක්ක තරහකට නෙවෙයි. ඔබතුමාට දේශපාලන වශයෙන් ජේ වී පී එකේ නායකයො ඇවිල්ල දේශනය කරන කොට තමුන්නාන්සෙල ඇත්තටම ඒකට ඇහුන් කන් දීල ඉන්නවා. නමුත් පිටි පස්සෙ ඕක තමයි. ඒක ගැටලුවක් නැහැ. අපි සමාජවාදයට ගිහිල්ලා අමාරුවෙ වැටෙන්නෙ නැහැ. මේ කරගෙන තියෙන්නෙ ඒක තමයි. මම අද උදේ සහබන්දු වැඩිහිටි නිවාසෙට දානයක් දුන්නා. දීලා එන අතරතුර යටලමත්තෙදි මම අනතුරකට ලක් වුනා. ඒ නිසා තමයි සභාවට එන්න ප්‍රමාද වුනේ. මගේ ජීවිතේ පළවෙනි අනතුර මේ. සහබන්දු වැඩිහිටි නිවාසය අසළ වීථි ලාම්පුව නැහැ. ඒ ගමන්ම යෝජනා කරනවා ගරු සභාපතිතුමනි එතන ලයිට් ලයිට් එක අළුත්වැඩියා කරලා දෙන්න. එම ස්ථානයට අත්‍යවශ්‍ය දෙයක් මොකද වැඩිහිටියො ඉන්නෙ. මට සමහරුන්ගෙ මූන බලල කතා කරන්නත් බැහැ. නොකරත් බැහැ. අපේ සමන් විතානගේ මන්ත්‍රීතුමා කිව්වා. ඇත්තටම මේවා අඩුපාඩු. මේකෙ

නිලධාරි ඉන්නවා. ජේසීබී එකක් යොදවනවනම්, තමුන්නාන්සෙ නිර්දෝශයි තමුන්නාන්සෙ වැරදි කාරයෙක් කරනවා නෙවෙයි. තමුන්නාන්සෙට සල්ලි පාස් වුනයින් පස්සෙ නිලධාරියා එනකම් බලාගෙන ඉන්නත් බැහැ. වැඩේ කරන්න ඕන. එහෙමනම් ඉස්සෙල්ලම නිලධාරිය ගිහිල්ලා ජේසීබී එකේ මීටරය ලියා ගන්න ඕන. මම අභියෝග කරනවා. පාර කපපු තැන ආරම්භය සහ අවසානය නිවැරදිව මෙතනට ඇවිල්ල දැන් නම් කරන්න කියලා. නිලධාරීන්ට තොරතුරු නැහැ. සභාපතිතුමා අවංක වෙන්න පුලුවන් නමුත් මේවා අර යකඩ කතා කළා වගේ රාජ්‍ය දේපොළ. මේකෙ නිලධාරි මහත්වරුන්ගෙ වාර්තාව තියෙන්න ඕන. මොකද අතිකාල වැනි සියළු ගෙවීම් මේ නිලධාරීන්ට කරනවා. මෙහෙමයි පාරක් කපනවනම්  ජේසීබී එක යොදනවනම් අපි යම්කිසි දීමනාවක් දෙනවනම්, අඩුගානෙ වරුවක්වත් එතන ඉන්න ඕන. තාක්‍ෂණ නිලධාරිවරු කී දෙනෙක් ඉන්නවද කියලා මම දන්නෙ නැහැ. නමුත් ඒ රාජකාරිය කෙරෙන්න ඕන.

කොම්පෝස්ට් පොහොර  ගැන කතා කලා. මම හොරකම අල්ලලා දුන්නා. අද පුලුවන්නම් ඒ නිලධාරියට කියන්න මෙතනට ඇවිල්ලා මේ මාසෙ නිෂ්පාදනය මෙච්චරයි. ඊයෙ දවස වෙන කොට තොගය මෙච්චරයි. මෙච්චර ප්‍රමාණයක් අලෙවි කරල තියෙනවයි කියලා කියන්න කියලා. මොකුත් දන්නෙ නැහැ. පොත එනවා. එහෙන් කියනවා. මෙහෙන් ලියනවා. ස්ටොක් එකක් ගන්නෙත් නැහැ. ඇබරිච්ච ප්‍රමාණයක් දන්නෙත් නැහැ. හැදිච්ච ප්‍රමාණයක් දන්නෙත් නැහැ. මේකෙ ආදායම කොහොමද ගරු සභාපතිතුමා. සේවකයො කීදෙනෙක් යොදවල ඉන්නවද? මෙතන පුටුවක් වෙන් කරල නිලධාරියෙක් තියල තියෙනවා. ඒ නිලධාරිය ඒ ලියන වගන්ති ඇත්තද? මේව බලන්න ඕන. මේක තමුන්නාන්සෙට අයිතියක් තියෙනවා. ගරු ලේකම් තුමියට අයිතියක් තියෙනවා. මේ සභාවෙ මම කතා කරන්න කැමති වෙන්නෙ නැහැ. කතා කරල වැඩක් නැහැ. මේ කිසිම මන්ත්‍රීවරයෙක් කතා කරපු දේක ප්‍රතිඵල නැහැ. ඒක නිසා අපි විපක්‍ෂයක් හැටියට අපටත් ඕකම තමයි තියෙන්නෙ.

ඊලගට මෙතන දැන් සිද්ධීන් කීපයක් කතා කෙරුවා. යකඩද, තව තවත් සිද්ධීන්ද අනේ කරුණාකරලා මේ මාධ්‍ය ගෙන්නන්න බලන්න. අද කොච්චර හොඳ වාර්තාවක්ද මාධ්‍යට. මගේ කතාව නෙවෙයි. මේ මාධ්‍ය ගෙන්නන්න මාධ්‍යට බය වෙන්න එපා. පුංචි ප්‍රාදේශීය සභාවල්වල බලන්න. මාසෙට දෙසැරයක් විතර තියෙනවා. ප්‍රාදේශීය සභාව අපි අඩුපාඩු කතා කරන ඒවා අදාල ආයතනවලට යන්නෙ නැහැ. අපි ආයතනය විවේචනය කරනවා. ආයතනය විවේචනය කළාට තමුන්නාන්සෙලා 27 දෙනා අහගෙන ඉන්නවා. අපි ගෙදර යනවා. ඊලග මාසෙ ආයෙ දෙවනි අගහරුවාදා එනවා. වාර්තාව  ටයිප් කරනවා. අපි ආයෙ බලනවා. ආයෙ ඒක වහල තියනවා. පැත්තකට යනවා. තමුන්නාන්සෙලාට වෙන්නෙත් ඕක. විපක්ෂෙ අපට වෙන්නෙත් මේක. අපි ඒ ගැන දුක් වෙන්නෙ නැහැ. තමුන්නාන්සෙලාට වෙච්ච දේකුත් නැහැ. අපට වෙච්ච දේකුත් නැහැ. වාර්තාව අපේ ගෙර ගොඩගහල තියෙනවා. මේ වාර්තා දෙකතුනක් කියවලා බලන්නකො හොඳ යෝජනා ඇවිල්ල තියෙනවා. ඒක නිසා අපි දුක් වෙනවා. කණගාටු වෙනවා. සභාපතිතුමා මීට වැඩිය තීන්දු ගැනීමේ දී ඔයිට වැඩිය ප්‍රානවත් විය යුතුයි. යකඩ ගොඩ ගැන මම ආයි කතා කරන්නෙ නැහැ. ඒක තමුන්නාන්සෙගෙ වගකීමක්. මේකෙ පැන්සලක්, පැනක් එහෙම නැත්නම් යකඩ ඇණයක් නැති වුනොත් ග්‍රාම සේවක වසම් 53 ක මිනිස්සු 35000 ක් 40000 ක්. ඒ  සියලු දෙනාටම මෙතන සම්බන්ධ වෙන්න බැරි නිසා 27 දෙනක් වාඩි කරල තියෙනවා. ඒකෙ සභාපතිවරය හැටියට ඔබතුමා ඉන්නවා. ඒ වගකීම තමුන්නාන්සෙ ගාව තියෙන්නෙ. ඒක නිසා අවුරුදු තුනක් අපි එකම දේ කතා කරනවා. අපි තාම පළවෙනි ශ්‍රේණිය පාස් කරගන්න බැරුව දගලනවා. මේ 27 දෙනාම. පාඩම කියා දෙනවා පාඩම අහගෙන ඉන්නවා. අපි ගෙදර යනවා. දෙන සොච්චමත් සාක්කුවෙ දාගන්නවා. ඒක නිසා ඒ පිළිබඳවත් මතක් කරනවා. මේ හැම දෙයක් ගැනම විග්‍රහ කරන්න ගියොත් කාලය ගන්න වෙනවා. එකම දේ කියන්නෙ. අන්න ඒක නිසා විශේෂයෙන්ම මම දන්නෙ නැහැ කියන කතාව සභාපතිතුමා කියන්න එපා. ඒක මන්ත්‍රීතුමා කෙරුවයි කියල කියන්න එපා. ඒක තමුන්නාන්සෙට අඩුපාඩුවක්. තමුන්නාන්සෙගෙ නොහැකියාව එතනින් ඔප්පු කරනවා. මම එක කෙරුවා. ඔය

දුරකතනෙ ප්‍රමානවත්. දුරකතනෙ උස්සලා පැය 24 ක් යන්න ඉස්සර වෙලා වැඩකිරීමේ හැකියාවක් තියෙනවා. පුලුවන්නම්, කැමතිනම්, හය මාසෙකට මට භාර දෙන්න. වැඩ පෙන්නනවා. වැඩ පෙන්නලා එලියට බහිනවා. මේක අභියෝගයක්. ඒක නිසා මේක කරන්න පුලුවන් ශක්තියක් තියෙන ආයතනයක්. ප්‍රාදේශීය සභාවක් කියන්නෙ මොකක්ද කියන එක සම්බන්ධව දීර්ඝ ඉතිහාසයක් තියෙනවා. එදා ඉදල හිටපු සභාපතිවරු ඉන්නවා. මන්ත්‍රීවරු ඉන්නවා මේකට කරන්න බැරි දෙයක් නැහැ. ඕනම දෙයක් කරන්න පුලුවන්. ඒක නිසා ගරු සභාපතිතුමාට කියනවා. තමුන්නාන්සෙ බැනුම් අහන්නෙ නිරපරාදෙ. නිලධාරින්ගෙ හිත හොද කරන්න අවශ්‍යා වෙන්නෙ නැහැ. මේ ප්‍රදේශයේ තියෙන සියලුම නිලධාරි ආයතන වලට දුරකතනෙන් කතා කරලා තමුන්නාන්සෙට ඒ වැඩ ටික කරගන්න හැකියාව තියෙනවා. ඒව කරන්න. ඒ නිසා ඒ පිළිබඳවත් මතක් කරනවා.

ඊලගට තමුන්නාන්සෙට තමයි මේ සියල්ලම කතා කරන්නෙ. සභාපතිතුමාට දොස් කියනවට මම විරුද්දයි. තමුන්නාන්සෙලගෙ නායකයත් අද ෆේල් වෙලා ඉන්නෙ. අද ජනාධිපතිවරයට කිසිම ආයතනයක කීකරු භාවයක් නැහැ. එතුමට වැඩ කරන්න බැහැ. එතුමත් ෆේල් වෙලා ඉන්නෙ. මෙතුමා සම්බන්ධයෙන් මොනවද කතා කරන්නෙ. ගිය සැරේ මගෙන් ඇහුවා මන්ත්‍රීතුමනි ගරු මන්ත්‍රීතුමියනි කල්පනා කාරීවෙන්න පොඩි එකාට හුස්ම ගන්න නැති වෙයි. මේ මොහොත වෙන කොට කැපෙන ටිකක් මම තමුන්නාන්සෙලට ලියාගෙන ආවා. සිංහරාජෙ කැපෙනවා, ගල්වල යාය කැපෙනවා, විල්පත්තුව කැපෙනවා, මුතුරාජවෙල කැපෙනවා, සීගිරි රක්ෂිතය සම්පූර්ණ කැපෙනවා, දහයියාගල කැපෙනවා, ගල්ගමුව කැපෙනවා. තමුන්නාන්සෙල කතරගම දෙවියන් වදින්න යන කතරගමත් හෙලිකොප්ටර් බහින්න කපල ඉවරයි. බෙල්ලන්විල කැපෙනවා, අත්තිඩිය කැපෙනවා. මේ සියල්ලම කැපෙනවා. තව ටික දවසකින් කන්නෙලියත් කැපේවි. අපේ මලාමුරෙත් කැපේවි. තමුන්නාන්සෙල මෙතනට ඇවිල්ලා බොරු කියාවි. අනාගතය භාරගන්න ඉන්න පොඩි දරුවන්ට හුස්ම ගන්න තැනක් නැති වේවි.

පොල්තෙල් සම්බන්ධයෙන් කතා කරනවනම්, මේක මෙතනට අදාල නැහැ කියලා කියාවි. මම අභියෝග කරනවා නාගොඩ ප්‍රාදේශීය සභාවට විතරක් නෙවෙයි. මුලු රටටම මේක අදාලයි. අද පොල්තෙල් ගෙන්නලා සියලුම දිස්ත්‍රික්ක වලින් සාම්පල් අරගෙන තියෙනවා. මේ සාම්පල් වලින් අටයි ෆේල්වෙලා තියෙන්නෙ. ගනිපු සාම්පල් සියලුම ඒවයි පිළිකා කාරක විශබීජ තියෙනවා. බලන්න හොරකම අල්ලනවා. අපේ විජිත් සහබන්දු සහෝදරයා මට මොකක්හරි හොරකමක් කරනවා. අපි හිතමු මගේ පොල්ටික කඩාගත්තයි කියලා. මම කියනවා මල්ලි මගේ ගෙදර ඉඩ නැහැ උබ හොරකම් කරපු එක ඇත්ත. ඔය ටික ගෙදර ගෙනිහින් කුස්සියෙ දාපන් කියලා. ඒ වගේ මේ පොල්තෙල් කන්ටේනර් ටික දෙනවා. පිළිකා කාරක ගෙන්නපු අලිබ්‍රදර්ස්ලටම. අලිබ්‍රදර්ස්ලා නුවර. එකේ ඒජන්ට්ල කොළඹත් ඉන්නවා. එයාලට ගෙන්නල තියෙන්නෙ. ඊලගට මෙන්න මේක තමයි තත්වය. අද මම ගරු සභාපතිතුමනි පුංචි පාඩමකුත් කියන්නම්. මේ සීනි ගෙන්වනවයි කිව්වහම මම කාලයක් අපේ නෙලී මන්ත්‍රීතුමියලගෙ පූර්ණ සහයෝගයෙන් යුතුව නාගොඩ විවිධ සේවා සමූපකාර සමිතියෙ සභාපති වෙලා හිටියා. මේ කාලෙ මට මතක් වුනා මම උදේට ගිහිල්ලා කතා කරන කොට අපේ සැපයුම් මහත්තය කියනව සීනි නැහැ මහත්තයො කියලා. සීනි හැහැ කියන කොට අපේ රටට ගිය කළ මේ කියන්නෙ. දේශපාලනය නෙවෙයි. මේ රටට වෙච්ච විනාසෙ මේ කියන්නෙ මම පක්ෂපාටකින් නෙවෙයි මේ කියන්නෙ. ඇත්තටම මට ඒ වෙලාවෙ වේදනාවක් ඇති වුනා. අද උදේ 10 ට ලොරිය පිටත් කරනවා. හිගුරානෙ යවන්නෙ. අපේ සීනි කර්මාන්ත ශාලාවට. එහෙම නැත්නම් සෙවනගල තිබුනා ඔය වගේ දෙක තුනක් තිබුනා. සීනි ටොන් 10 ක් ගේනවා. නෙලී මන්ත්‍රීතුමිය සාක්ෂි. අපි එදා එකට වැඩ කළා. දේශපාලනය තිබුනෙ නැහැ. මේ අපේ නිෂ්පාදන. අපේ දේවල් අපි මේක බදා හැරලා, මේ ප්‍රදේශයේම අපේ තොග කඩ තිබුනා. මම මේ කිව්වෙ සමූපකාරය පිළිබඳව

නෙවෙයි. එදා සීනි අපේ දේශීය නිෂ්පාදන ගෙනැල්ලා වසත් නැහැ විසත් නැහැ. අද මොකද වුනේ කියලා.

ඒ විතරක් නෙවෙයි මට මතක් වුනා. අපේ රෙදි කඩ තිබුනා. ඒ දවස්වල අපි පිටකොටුවෙ යනවද හරස් වීදියෙ යනවද? තුල්ටෙක්ස්, වේ ටෙක්ස්, පූ ගොඩ මේ කියන්නෙ දේශීය නිෂ්පාදන. අවුරුද්දට එතනට වාහනේ යනවා. අපේ රෙදි කඩ 5,6 ක් ප්‍රදේශයේ තිබුණා. මේව ගෙනාවට පස්සෙ මිනිස්සු පොරකාල ගන්නෙ. එහෙනම් අපට මොකද වුනේ කියල තමයි මම කල්පනා කරන්නෙ. 77 න් පස්සෙ විනාශ වුනයි කියලා කියන්න බැහැ. මම සභාපතිවෙල හිටියෙ 77 න් පස්සෙ 89,90,91 ඔය වර්ෂවල. මේ සියල්ලම රෙදි සීනි ගෙන්නුවෙ මේ වර්ෂවල. මම සුදු හුනු ගාන්නෙ නැහැ. වැරදි තැන් තියෙනවා. යකඩ කැල්ල අපි ලග තිබුනා අපි නැගිටින්න ඕන. එහෙමනම් ඔන්න ඕකදිහා බලල. මේක දේශපාලනේ ගාව ගන්න එක නෙවෙයි තියෙන්නෙ. අනාගත පරම්පරාව තමුන්නාන්සෙලට මතක් කළේ මම. අද අනුන්ට කට ඇරල ඉන්නවයින් තමයි මේ සිද්දිය සිදු වුනේ. අද දවසකට 68 දෙනෙක් මහරගම පිළිකා රෝහලට ඇතුලත් වෙනවලු 37 ක්ද 34ක් ද දිනකට මරණ එළියට යනවා. එතකොට මේ මොකක්ද කොරෝන එක. මේක ප්‍රශ්නයක් නෙවෙයි. එහෙමනම් අද රටේ ව්‍යාප්ත වෙල ඉවරයි. ඉතිහාසය තමුන්නාන්සෙලට කියා දෙන්නම්. එස් එල් එස් සහතිකය දෙන්නෙ ප්‍රමිති ආයතනය කියල එකක් තියෙනවා. ප්‍රමිති ආයතනයෙන් එස් එල් එස් සහතිකය දුන්නට පස්සෙ තමයි බඩු එළියට එන්නෙ. ඒක නිසා මේ සහතිකය දීල තමයි මේව එළියට දාල තියෙන්නෙ. මේකෙ ඉන්නෙ මුස්ලිම් සභාපතිවරයෙක් සභාපතිවරයා මේක එළියට දාල කියනවා. මේකෙ වසවිෂ නැහැ කියලා. අපේ රටේ අහිංසක දරුවො මේ රටේ පුරවැසියො. මේ සෑම දරුවෙකුටම මේ පොල් තෙල් සහිතව කෑම දෙන කොට මොන කරුමයක්ද අපට එන්නෙ, කියන එකයි අපි කියන්නෙ. ඒක නිසා මේ ආණ්ඩුව මම හිතන්නෙ නිලධාරි ආරක්ෂා කරන්න යනවා. ගරු සභාපතිතුමනි. ඇත්තටම අපි හිතුවා ගෝඨාභය මහත්තය එනකොට ආපහු ආණ්ඩුව ගන්නනම් හම්බ වෙන්නෙ නැහැ කියලා. හෙට ඡන්දෙ තිබ්බත් දැන් ගෙදර. අපි හිතුවෙ අති දක්ෂයෙක් කියලා. දැන්නම් මේක දීපු එක හොඳයි. ගෝඨාභය මහත්තයට සර්ට දෙයියන්ගෙම පිහිටයි. ඒක නිසා මම නාගොඩ ප්‍රාදේශීය සභාවට නෙවෙයි අපේ අනාගත පරම්පරාව වෙනුවෙන් මේ කතා කරන්නෙ. මේක රැකගන්න ඕන. ගහක් කොලක් ඉතිරිවෙන්න ඕන. එහෙම නැතුව අද සියල්ලම විනාශ වෙන තත්වයට පත් වෙයි. තමුන්නාන්සෙලට මේක මතක් කළේ නැත්නම් බොහොම සැහැල්ලුවට හිතයි. අවුරුදු කාලෙ කොකිස් අතිරස කන්න එපා. මුංගුලි හදන්න මුංඇටත් නැහැ. කොකිස් හදන්න කහත් නැහැ. ගරු සභාපතිතුමනි, කහ ටික එන කොට කහ ටික විනාශ කරන්න පුලුවන්නම්, ඇයි මේතරම් පිළිකා කාරකයක් ගෙනාපු පොල් තෙල් ටික එතන තියාගෙන විනාශ කළේ නැත්තෙ. ඇයි කියන එකයි ප්‍රශ්නෙ අපට. ගම්මිරිස් විකුන ගන්න රබර් විකුන ගන්න තේ කොල විකුන ගන්න කුරුදු ටිකවිකුන ගන්න ජීවත් වෙන්න ඕන. අහිංසක දරුවො මෙතන ඉන්නෙ. මේ වගේ මේ සාමාන්‍ය දෙයක් නෙවෙයි. ගරු සභාපතිතුමනි අහිංක දරුවොන්ට හුස්ම ගන්න ඕන. අහිංක දරුවොන්ට කොකිස් පෙත්තක් කන්න ඕන. අහිංක දරුවොන්ට අතිරස පෙත්තක් කන්න ඕන. මේ ඉලව් එකක්වත් බැරිනම් හැලපයක් හරි කන්න ඕන. නමුත් හැලපෙ හරි කන්න සීනි ටික ගන්න බැහැ. මේ සත්‍ය සිද්දියක් අහන්න එපා ලග හිටියද කියලා. ඒකටත් උත්තර දෙන්නම්. පසුගිය දවසක එනවා බවුසරයක්. මම කරාපිටියෙ ඉන්නවා. බවුසරේ පුඩ්සිටියට මෙහා අයින් කරල නවත්වනවා. මම දන්නෙත් නැහැ මොකක්ද මේකෙ එන්නෙ කියලා. පොල් තෙල් ඇවිල්ලා. අඩගහල ලඟ හිටිය සිකුරිටි එක්කෙනාගෙන් බටගන්විල මෝලකට යන පාර අහනවා. අද කියනවා දකුණටලු වැඩියෙන්ම ඇවිල්ල තියෙන්නෙ. ඊලගට ඇවිල්ල තියෙන්නෙ නුවර ප්‍රදේශයට. මම මේ මාතෘකාව මීට වැඩිය එහාට ගෙනියන්නෙ නැහැ. මේ ජනතාව වෙනුවෙන් මාසෙකට දවසක් හරි අපි මෙතනට එවලා තියෙනවා. ඒක නිසා ජනතාව වෙනුවෙන් මේ හඩ ප්‍රකාශ කළේ. ඒක නිසා තමුන්නාන්සෙලවත් බේරිලා ඉන්න. ඔය පොල් තෙල් පාවිච්චි කරන්න යන්න එපා. පොල් ගෙදර හිද ගන්න. ඒක නිසා මීට එහා තමුන්නාන්සෙලට මම මේ පිළිබඳව කතා කරන්න යන්නෙ නැහැ.

සභාවෙ, තමුන්නාන්සෙ, අපි මොනව කතා කළත් තමුන්නාන්සෙල අපිට කතා කරන්න දෙයක් ඇත්තෙ නැහැ. දැන් හෙට අනිද්ද වෙන කොට අපි කතා කරන්නෙ නැහැ. හේතුව තමුන්නාන්සෙලා යුතුකම කරනවා. ඒක නිසා අපි කතා නොකර ඉන්නම්. මම අද මේ ටිකත් කියන්න ආවෙ. ඊලගට තමුන්නාන්සෙල පස් සම්බන්ධව කතා කළා. කරුණාකරලා ගරු සභාපතිතුමනි තමුන්නාන්සෙගෙ බලතල පාවිච්චි කරන්න. එහෙම ගොඩ කරන්න බැහැ. ආයතනෙට කතා කරන්න. ඒ නිසා එහෙම ගොඩ කරන්න බැහැ. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිසරය තුල සභාපතිට කළ නොහැකි දෙයක් නැත. ආරක්‍ෂා කිරීම ඔබ සතු වගකීමකි. කියවලා බලන්න. අද ඒකයි තත්වය. අන්න ඒක නිසා තමුන්නාන්සෙගෙ බලතල සියල්ල පාවිච්චි කරන හැටියට ඉල්ලා සිටිමින්, තමුන්නාන්සෙල සියලු දෙනාට ලබන්නා වූ තව සතියකින් දෙකකින් විතර අලුත් අවුරුද්ද එනවා. ආවට පස්සෙ කැවුම් කන්න යන්න එපා. අතිරස කන්න යන්නෙ නැතුව, කෙහෙල් ගෙඩියක් විතරක් කාලා, අවුරුද්ද සමරන්න කියල ඉල්ලා සිටිමින්, තමුන්නාන්සෙලට සුබ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනය කරමින්, මා නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ගරු මන්ත්‍රීතුමා, මම ඒ තාක්ෂණ නිලධාරීන්ට කිව්වා. ජේසීබී වැඩකරන කොට හරියට තොරතුරු ගන්න කියලා. නිලධාරීන් ආරම්භයෙදි හා අවසානයෙදි අවශ්‍ය තොරතුරු ගත්තයි කිව්වා. මේක තාක්ෂණ නිලධාරී වාර්තාවට අනුව මම ගෙවන්න ඕන. නමුත් නිලධාරියා හරියට වැඩේ කළාද කියලා මම දන්නෙ නැහැ.

ඒවගේම ගරු මන්ත්‍රීතුමා මේ පිළිකාකාරක ද්‍රව්‍ය ගෙන්වීම හා පරිභෝජනය කිරීම මේ අවුරුදු දෙක තුනටද සිදු වුනේ? මේ අවුරුදු දෙක තුන ඇතුලතද මේ පිළිකා කාරක ඇති වුනේ. ගරු මන්ත්‍රීතුමා අපේ රජය විසින් පරික්ෂා කරන නිසා තමයි මේ සේරම අහු වුනේ.

**ගරු මන්ත්‍රී වසන්ත පතිනායක මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි මේ පවතින නියගයත් සමග ඌරල කොතේගොඩ කන්ද ප්‍රදේශයේ ජල හිගයක් පවතිනවා. එහා පැත්තෙ වැලිවලක් හාරනවා. ඒ වැලි වල නිසා මේ වන විට තියෙන උල්පත් ටිකත් සිඳීගෙන ගිහින් තියෙනවා. ආබාධිත අය ඉන්න නිවාස තුනක් තියෙනවා. ඒ මිනිස්සුන්ට විශාල ජල ප්‍රශ්නයක් ඇති වෙලා තියෙනවා. ඒ නිසා මම ඔබතුමාට කියනවා. වැලිවල නිසා උල්පත් සිදී ගොස් තියෙන්නෙ. ඒ නිසා ඒ ජනතාවට ජලය බලා දෙන්න කියලා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වගේම ඔබතුමා කිව්වා ඌරල අබේසේකර ආයතනය මගින් ඉදිවෙන ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභාවෙ අවසරය ගෙන නැතෙයි කියලා. නමුත් ගොඩනැගිල්ල ඉදිවෙනවා. ලිද වල් බිහි වෙනවා. ලිද කඩල තියෙන්නෙ. මම අද ඉල්ලීමක් කරනවා. මේ සභාවෙදි ලේකම්තුමිය නිලධාරි යවලා. පොලිස්ථානයේ පැමිණිල්ලක් දාලා මේකට විසඳුමක් ලබා දෙන්න. මොකද තව එක අවුරුද්දයි මේ මන්ත්‍රීවරු ඉන්නෙ. සභාපතිතුමත් එක අවුරුද්ද වෙන්න පුලුවන්. මේ කාරණය මෙතනින් නවතින්න බැහැ. නැත්නම් ප්‍රාදේශීය සභාවට විරුද්දව දැඩි උද්ගෝශනයක් කරනවා. ඒ නිසා ඔබතුමියලා ක්‍රියාත්මක වෙන්න. මම දැන් වසර දෙකක් කතා කළා මේක මොකක්ද වෙන්නෙ. ඒ මිනිස්සු ගොඩනැගිල්ල ඉදිකරගෙන යනවා. ඒ මිනිස්සුන්ගෙ මම හිතන්නෙ හිතවත් කමක් තියෙනවා මොකක් හරි ඩීල් එකක් තමයි මෙතනත් තියෙන්නෙ. මොකද ගොඩනැගිල්ල ඉදිකරනවා. පොලීසියට යන්නෙත් නැහැ. ලිද හදන්නෙත් නැහැ. මෙහෙන් වාර්තා දුනනෙ නැහැයිලු. වාර්තා නොදුන්නට ගොඩනැගිල්ල ඉදිකරනවා. ලිද හදල ඉවරවෙනකම් එහෙනම් ගොඩනැගිල්ල ඉදිකිරීම නතර කරන්න. මට මතකයි යටලමත්ත ප්‍රදේශයේ ඔය වගේ සිදුවීමක් වෙලා. ඒ ව්‍යාපාරිකය විසින්

ලිද හදලා ඉවර වෙලා තමයි ඒ මනුස්සයගෙ ගොඩනැගිල්ල ඉදි කළේ. නමුත් මේකෙ වෙන්නෙ ඒකෙ අනිත් පැත්ත. මොකද මේක දේශපාලන භයියක් නිසාද? මම දන්න විදිහට එතුමගෙ සහෝදරයෙක් සභාපතිවරයෙක් වශයෙන් ඉන්නවා. රජයේ ආයතනයක. මම දන්නෙ නැහැ ඒ බලපෑම් ඇවිල්ලද කියලා. මේ ස්ථානයට. සභාපතිතුමා ගොඩනැගිල්ල හැදීම නතර කරන්නකො. එතකොට ලිද හදයි. නැත්නම් සභාවෙන් දාන්න පැමිණිල්ලක්. සභාව සතු පොදු දේපොළක්. අපිට දැන් වසර තුනක් ඉවරයි. මම මේ සභාවෙ වසර දෙකහමාරක් කතා කළා. මොකක්ද අපි මේකට එන තේරුම. මොනම තේරුමක්වත් නැහැ. මේ නිලධාරි ඉන්නවා මොකුත් නැහැ. අර පූට්ටු පාලමේ යකඩ ටික ඒකත් පටවගෙන යාවි ඔය කියන විදිහට. එක ඇන්දක් මම හංගල තිබිලා, කොහොම හරි සභාවට ගෙන්නුවා. දැන් අනිත් ඇන්දත් කඩා වැටිලා තියෙනවා. තව ටික දවසකින් යකඩ කාරය අරගෙන යාවි. නිලධාරි හිටියට කිසිම දෙයක් කරන්නෙ නැහැ. මේ සභාවෙ අපි ඇවිල්ල බොරුවට කතා කරල යනවා. අපිට ගමේ මිනිස්සු බනිනවා. මොනවද වෙන්නෙ. මොනම දෙයක්වත් සිදු වෙන්නෙ නැහැ. සභාපතිතුමනි මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමාගෙන් මේ ගැන දැඩි අවදානය යොමු කරලා. පොලීසියෙ පැමිණිල්ලක් හරි දාලා මේ දේ කරන්න. නැත්නම් ගොඩනැගිල්ල ඉදිකිරීමට තවම අවසර දීල නැහැ. ආයතනය අවසර ගන්නෙ නැහැ. රජයේ පොදු දේපොළ විනාශයට පත්කරලා. මේක දැන් කොයි කාලෙ ඉඳලා කතා කරනවද? ඔබතුමා අපහසුතාවයට ලක් වෙනවා. මට කරන්න දෙයක් නැහැ. මම මෙතනට ඇවිල්ලා ගමේ ගම් වැසියො වෙනුවෙන් කතා කරන්නෙ. ඒ ගැන ඔබතුමා දැඩි අවධානය යොමු කරන්න. මට තව කතා කරන්න දේවල් තිබුනත් ඔබතුමාටත් පරක්කු වෙන නිසා මගේ කතාව මින් අවසන් කරනවා. ලබන්නාවූ සිංහල හිංදු අලුත් අවුරුද්ද සියලු දෙනාට සුබ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්,**

ගරු මන්ත්‍රීතුමා මේ වෙන කොටත් ජල බවුසරේට වතුර එකක් ගෙනැල්ල තියෙනවා. වැලිවල ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉතිං අපට කරන්න දෙයක් නැහැ.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, සභාපතිතුමා ඇතුලු සියලු දෙනාටම සුබ අලුත් අවුරුද්දක් වේවා කියල ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි ඔබතුමා දන්නවා. අර අපේ යටලමත්ත ප්‍රදේශයේ 209 ග්‍රාම සේවක වසමෙ පේෂකර්ම ගොඩනැගිල්ලක් පාලුවට ගහිල්ලා කැලේට ගිහිපු ගොඩනැගිල්ලක්. මේක වසර ගානක් තිස්සෙ කැලේට තිබුනෙ. අපි අපේ සේවා ගැන කතා කරනවා. අපේ සහබන්දු මන්ත්‍රීතුමා රෙදිපිළි ගැන දැන් කතා කළා. ඒ නිසා අපි තීරණය කළා. ඒ ගොඩනැගිල්ල කුඩා කර්මාන්ත හරි සම්බන්ධ කරගෙන බතික් කර්මාන්ත ආයතනයක් පටන් ගන්න. ඒ සඳහා බතික් ඇමතිතුමා කිව්වා. අපට සහයෝගය ලබා දෙන්නම් කියලා. ඒ නිසා අපි එතන බතික් කර්මාන්ත සඳහා ස්ථානයක් පටන් ගන්නම්. සේවකයො ගණනක් බඳව ගන්නත් පුලුවන්. ඒ නිසා සභාවෙ සහයෝගය ලබා දෙන්න කියලා ඔබතුමාට මතක් කර සිටිනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු අපි කරමු.

ඒ වගේම අපේ පාර්ලිමේන්තුවට යන්න ඕන මන්ත්‍රීතුමන්ලා සභාවට එවලා. පාර්ලිමේන්තුවෙ කතා කරන්න ඕන දේවල් තමයි අපේ සභාවෙ කතා කරන්නෙ. ඇත්තටම අපේ සහබන්දු මන්ත්‍රීතුමාගෙ කතාව අහන් ඉන්න ආසයි අපට. ඒ වුනත් ඉතිං බොහොම සංතෝශයි. අපි පොල් තෙල් පාවිච්චි කරනවා. මන්ත්‍රීතුමා අපි මෙච්චර කල් පොල් තෙල් කෑවා. හැබැයි ප්‍රමිතිය බැලුවෙ නැහැ. ඒක නිසා අපි කෑවා අපි දන්නෙ නැහැ. බැලුව නිසා තමයි මේක අහු වුනේ. ඒ නිසා මෙච්චර කල් ඒ වැරද්ද වුන නිසා තමයි අපි කියන්නෙ. මෙච්චර කල් කවුරුත් බැලුවෙ නැහැ. දැන් බලන නිසා තමයි කතා

කරන්නෙ. මෙච්චර කල් හෙව්වෙ නැහැ. පොල් තෙල් කෑවා. කහ ගැන කතා කරනවා. කහ ඇත්තටම අපි මෙච්චර කල් වස විස කහ කෑවෙ. වස විස කහ මූනෙ ගෑවෙ. රූපලාවන්‍ය කටයුතු සඳහා ගෑවා. අපි රූපලාවන්‍ය ප්‍රධාන උපකරණයක් තමයි කහ. තමුන්නාන්සෙල දන්නවා. අපි කහ පඳුරක් තිටෙව්වමම ඕන තරම් අල බහිනවා. දැන් අපේ දේශීය දේවල් අපි වස විස නැතුව කනවා. තමුන්නාන්සෙ ඉතිං අර පාර්ල්මේන්තුවෙයි කියල හිතාගෙන කතා කරනවා. ඔබතුමා යවන්න ඕන පාර්ලිමේනතුවට. ඒ නිසා අපි ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් කතා කරන්න යන්නෙ නැහැ. සියලුම දෙනාට සුබ නව වසරක් ප්‍රාර්ථනා කරමින්, අපේ සභාපතිතුමාට හා සියලුම මන්ත්‍රීවරුන්ට සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි ප්‍රථමයෙන්ම ගරු සභාපතිතුමාට විශේෂ ස්තූතියක් කරන්න ඕන. වසර 20 ට අධික කාලයක් සංවර්ධනය නොවුනු ගම්මැද්දේ ගොඩ පඤ්ඤාලෝක මාවත සභාවට ආපු කාපට් කිලෝ මීටර් 10 යෙන් නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රථම වතාවට වැඩ අවසන් වුන කාපට් මාර්ගය වශයෙන් දැන් වැඩ අවසන් වෙලා තියෙනවා. ඒ පිළිබඳව මාර්ගය ආරම්භ කළ ප්‍රාදේශීය සභාවෙ මන්ත්‍රීවරයෙක් වශයෙන් සිටි ගරු අපේ පඤ්ඤාලෝක ලොකු හාමුදුරුවන්ට කරපු ලොකු ගෞරවයක් වශයෙන් ගම්මැද්දේගොඩ ජනතාව වෙනුවෙන් මම ඔබතුමාට විශේෂ ස්තූතිය පළ කරනවා.

ඒ වගේම මේ වන විට ගම්මැද්දේගොඩ ප්‍රදේශයේ කොට්ඨාසයේ සියලු වීදි පහන් නැවත වතාවක් අලුත් වැඩියා කරල දීපු ඔබතුමන්ට ඒ පිළිබඳවත් විශේෂ ස්තූතිය ප්‍රකාශ කරන ගමන්, තව බොහෝ කාරණා කියන්න තියෙනවා. මම හිතන්නෙ සභාපතිතුමාටත් පරක්කු වෙච්ච නිසා සියලු මන්ත්‍රී මණ්ඩලයට ලබන්නා වූ අලුත් අවුරුද්ද සුබ අලුත් අවුරුද්දක් වේවා කියල ප්‍රාර්ථනා කරමින්, මම නිහඩ වෙනවා. ස්තූතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මම පළමුවෙන්ම ඔබ සියළු දෙනාටම එළඹෙන අලුත් අවුරුද්ද වාසනාවන්ත සුභම සුභ අවුරුද්දක් වේවායි පතමින්, ගරු චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීමේදී ප්‍රකාශ වූ අදහස්වලට උත්තරයක් දෙන්නම්.

ගරු මන්ත්‍රීතුමනි, මේ රට ගැන හිතලා හොඳම ප්‍රතිපත්ති මාලාවක් ගෙනත් රට ගොඩනගන්න හැදුවේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක  අගමැතිණිය යටතේ 1970 දශකයේ බිහි වූ සමගි පෙරමුණ ආණ්ඩුව. මේ රට ඒ දර්ශනය යටතේ දිගටම පැවතුනා නම්, අද මේ අපි දකින රට නෙවෙයි අපේ දරුවන්ට දකින්න වෙන්නෙ. අප රටේ තිබුන සම්පත්වලින් රට දියුණු කොට ස්වයංපෝෂිත රටක්. අපේ රටේ නිශ්පාදන පිටරටට අපනයනය කරන රටක් හැටියට ලෝකයේ උතුම් රටක් දියුණු රටක් හැටියටයි දකින්න තිබුනේ. නමුත් එදා අපේ මිනිසුන් බඩ ගැන සිතා ගත් මෝඩ තීරණ නිසා තිස් අවුරුදු යුද්ධයකටත්, 1988,89 භීෂණයටත් යට වෙලා රට දශක ගණනකට ආපස්සට ගියා. එහෙම නොවුනනම් අද අපේ රට කොතනද කියලා හිතාගන්න බැහැ. සහබන්දු මන්ත්‍රීතුමනි, 1977 විවෘත ආර්ථිකය හඳුන්වා දුන් නිසා  පූගොඩ තුල්හිරිය වැනි එදා අපේ රටේ තිබුන ප්‍රධාන ඇගළුම් ආයතන වැසී ගිහින් එහි සේවය කල දහස් ගණනක් පාරට ඇද දැම්මේ එදා 1977 පත්වුන ආණ්ඩුව බව අමතකද?

1970-1977 රජය යටතේ සිටි අධ්‍යාපන ඇමති  බදියුදීන් මහමුද් මැතිතුමා  තමයි මේ රටට ගැලපෙන අධ්‍යාපන ක්‍රමයක් ගෙන ආවෙ. රටට අවශ්‍ය ශ්‍රම දායකත්වය මූලික කරගෙන සකස්කල අධ්‍යාපන ක්‍රමයක්. ඒ අනුව වර්ථමානය වන විට අපට දැනිලා තියෙනවා. එදා මිනිස්සුන්ගෙ මනසට දැම්මා. වඩුවගෙ දරුවා වඩුවා. මේසන් බාස්ගෙ දරුවා මේසන් බාස් කියලා. එවැනි මතයක් සමාජයට

වපුරලා මිනිස්සුන්ගෙ සිත පැරුවා. එහි පල විපාක තමයි අද පේන්නෙ. රජයේ සම්පත් පෞද්ගලීකරණය කරලා, සමහර ආයතන විනාශ කර දැම්මා. මේ අතීත සිදුවීම් දිහා බලලා තමයි වර්ථමාන අතිගරු ජනාධිපතිතුමා සෞභාග්‍යයේ දැක්ම යටතේ නිසි වැඩපිළිවෙලක් සකස් කොට රට භාරගත්තෙ. නමුත් නොසිතූ විදියට ලෝකයම වෙලා ගත් කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ අපේ බලාපොරොත්තු තරමක් දුරට පසුබෑවා. නමුත් මොන බලපෑම් ආවත් පටන්ගත් සෑම දෙයක්ම 2015 නවත්වපු සංවර්ධන කටයුතුත් මේ වන විට ඉතා සාර්ථකව සඳු කරන බව කියන්න ඕන. විශේෂයෙන් කිලෝමීටර් ලක්ෂයක් මාර්ග කාපට් කිරීම සෑම ගමකම මිලියන දෙක බැගින් මාර්ග සංවර්ධනය සෑම ගමකම නිවාස නොමැති එහෙම නැත්නම් මැටි ගහපු ගෙවල් ඇති අයට නව නිවාස ඉදිකිරීම (ලක්ෂ 6 ක් වැය කර) රැකියා නොමැති ලක්ෂයකට රැකියා ලබා දීම, උපාධිධාරී 61000 කට රැකියා පත්වීම් ලබා දීම, කොවිඩ් වසංගතය තුල ඇති වූ පීඩාවන් නිසා විපතට පත්වූ සියළු දෙනාට රු. 10000.00 ක සහනාධාරයක් දීම, වරාය නගරය සෑදීම, අධිවේග මාර්ග සෑදීම, වැසිකිළි නොමැති පවුල්වලට වැසිකිළි තැනීම, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම තරුණ දරුවන්ට දිවා රාත්‍රී ක්‍රිඩා කල හැකි වොලිබෝල් ක්‍රීඩා පිටි සෑදීමආදී මෙකී නොකී දේවල් මේ වන විට සිදුවන බව සතුටින් කියන්න ඕන. මේ සියළුම දේ පිළිබඳව මතක් කලේ ජනතාව නොමග යවන කතා අද සමාජයෙන් ඇසෙන නිසා. මේ පිළිබඳව ඔබතුමාලා හොඳින් දැනුවත්වීමට මම අද ආයුබෝවේවා කියලා නැකත් පත්‍රයක් සහිත පත්‍රිකාවක් දෙනවා. ඒ පත්‍රය කියවලා අලුත් අවුරුද්දට වැඩ පටන් ගෙන සිතේ තියෙන කහට ඉවත් කරගෙන සහයෝගයෙන් වැඩ කරන්න සිතට ගන්න කියලා ඉල්ලනවා.

ගරු මන්ත්‍රීවරුනි, අපි සභාවක් හැටියට අපේ බල ප්‍රදේශයේ මේ වන විට මිලියන ගණනින් සංවර්ධන වැඩ වෙනවා. ඔබතුමාලා දන්නවා ඇති. අපේ ග්‍රාමසේවා වසම් 53 ට මිලියන 2 බැගින් මාර්ග සංවර්ධනයට ලැබිලා තියෙනවා. සභාවේ යෝජනා අනුව කිලෝමීටර් 10 ක් කාපට් කිරීමට මිලියන 300 ක් වැය කරනවා. තවද අප සභා බල ප්‍රදේශයේ තවත් කිලෝමීටර් 15 ක් කාපට් කොට සංවර්ධනය කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා මාර්ගයෙන් 65.8 ක් සහ පළාත් සභා හිටපු මන්ත්‍රීතුමන්ලාගේ යෝජනාවලට මිලියන 450 ක් වැය කරනවා. ඒ වගේම ප්‍රාථමික පාසල් සංවර්ධනයට මිලියන 20 ක්, කුඩා නගර සංවර්ධනය හා නගර සංවර්ධනයට මිලියන 76 ක් ප්‍රාථමික සෞඛ්‍ය සේවය සඳහා මිලියන 54 ක් ( මාපලගම නගරයට මිලියන 25 ක් සහ නාගොඩ නගරයට මිලියන 20 ක්) මේ සියළු යෝජනා මේ වසරේ ක්‍රියාත්මක වන යෝජනා බව ප්‍රකාශ කරන්නේ ඉතා සතුටින් බව කියන්න කැමතියි. මේ සෑම දේම සිදුවෙද්දී තමයි ඔබතුමාලා අපිව විවේචනය කරන්නෙ. අද දින විලේගේ මන්ත්‍රීතුමා විසින් මාවද විවේචනය කළා. මම කියන්න කැමතියි මම විවේචනයට කැමති මිනිහෙක් වගේම, නමුත් අනිසි විදියට විවේචනය වෙනවට අකමැති මිනිසෙක්. එතුමා කිව්වා මම මෙම සභාපති පුටුවේ ඉන්නෙ බලෙන් කියලා. ගරු මන්ත්‍රීවරුනි, මම මේ පුටුවට හෝ තනතුරුවලට කෑදර මිනිහෙක් නෙවේ. ඕනෑම වෙලාවක සාධාරනව මේක අතහරින්න කැමති මිනිහෙක්.

ඒවගේම තරංග මන්ත්‍රීතුමා කිව්වා සභාවට එන කොට කට්ටිය නොයෙක් නොයෙක් ඒව කියල ආවයි කියලා. ඡන්දෙ ඉල්ලලා මේ නිමල් වික්ටර් නාගොඩ විතානත් ආවෙ 2002 වර්ෂයේ. මම දේශපාලනයට එන්න හිටිය කෙනෙක් නෙවෙයි. මම හරි අකමැතියි. මම සමූපකාර සභාපති වෙන්නත් ග්‍රාම සංවර්ධන සභාපති වෙන්නත් තමයි කැමැත්ත තිබුනෙ. නැතුව මම දේශපාලනයට එන්න හිටපු කෙනෙක් නෙවෙයි. 1991 මම ඡන්දෙ ඉල්ලුවනම් මගේ වල්ගෙවත් අල්ලන්නෙ නැහැ ඔය එක්කෙනෙක්වත්. මම එච්චරට ජනප්‍රිය පුද්ගලයෙක් වෙලා හිටියෙ. අපේ දෙමව්පියන්ගේ නමත් එක්ක මම මුලු බල ප්‍රදේශයම දන්නවා. මම අහම්බෙන් තමයි දේශපාලනයට ආවෙ. මම දේශපාලනයට යොමුකලෙත් අපේ නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා. ආණ්ඩුව පරාජය වෙච්ච වෙලාවෙ, එතකොට ප්‍රාදේශීය සභාව තියෙනවා. දවසක් මම උඩුගමට ගිහිල්ල එන ගමන් නිශාන්ත

මහත්තය හමු වෙන්න ගියා. ඒ හමුවෙල කතා කරන කොට ඡන්දෙ කරමු කිව්වා. මම කිව්වා ඡන්දෙ කරනවා කියලා. ඡන්දෙ ඉල්ලමු කිව්වා. මම කිව්වා මගේ බල්ලවත් ඉල්ලන්නෙ නැහැ කියලා. මම එහෙම කියලා කාර් එකෙන් බැස්සා. නමුත් මගේ නම ගෙනිහිල්ලා පියසේන ගමගේ ඇමතිතුමා ලගට එක්ක ගිහිල්ලා, මාව ඡන්දෙට යොමු කළා. අකමැත්තෙන් වුනත් එදා සිට මම දේශපාලනය කලා. මම පුඩ් බෝඩ් එකේ හරි එල්ලෙනවයි කියලා තමයි මම ආවෙ. මම එදා දිනුවා 2002 හිනිදුම ආසනේ පළවෙනියට ආවා. 2006 ඡන්දෙ ඉල්ලුවා ඒකෙත් හිනිදුම ආසනෙන් පළවෙනියට ආවා. තැපැල් ඡන්දවලින් මම එක. මම තැපැල් ඡන්ද තියෙන කාටවත් ලියුමක්වත් දාල නෙවෙයි. එහෙම දේශපාලනයට අවතීර්ණ වූ මම අද වෙනකම් මේ දේශපාලන ගමන ආවා. මම මේ අසාධාරණ විදිහට මේ පුටුවෙ වාඩිවෙලා නැහැ. මට සුසන්ත මහත්තයත් එක්ක කිසි අමනාපයක් නැහැ. මම කැමතියි එතුමත් මේ තත්වෙට එනවට. මම මේ බලලෝභීත්වයෙන් ඉන්නෙ නැහැ. මට මේක අවශ්‍යතාවයක් නැහැ. ඕනනම් හොරකම් කරන්න, වංචා කරන්න මට පුළුවන්. නමුත් මට ඒක අදාල නැහැ. මම සභාවට එනකොට හිතාගෙන ආවෙ. මගේ දීමනාවවත් මම ගන්නෙ නැහැ කියලා. මම ඒ වගේ මන්ත්‍රීවාර තුනකදී ශිෂ්‍යත්ව දුන්නා. අද දොස්තරවරු ඉන්නවා. ඒ ශිෂ්‍යත්ව ගත්තු අය. දැන්නම් දෙන්නෙ නැහැ. දැන් දීගන්න විදිහක් නැහැ. ශිෂ්‍යත්වෙ දීපු ළමයි මම සුදුද කලුද කියලවත් දන්නෙ නැහැ. ඒ වගේ මම ආවෙ. මම හොරකම් කරනවනම් මම කියල කරන්නෙ. ප්‍රසිද්දියෙම මම කිව්වෙ අර මට සාක්කුවෙ දාගන්න තිබුන එකක් සභා අරමුදලට දැම්මයි කියලා. මම මුදලට කෑදර මිනිහෙක් නොවෙයි. කෝටි ගණන් හොයල තියෙනවා. නමුත් කාත් එක්කවත් මගේ තරහක් නැහැ. නමුත් මම මධ්‍යස්ථව කටයුතු කරන නිසා තමයි මට මෙහෙම වෙලා තියෙන්නෙ. දැන් අනතුරු දායක ගහක් කපන්න කිව්වහම. තව කට්ටියක් එනවා අනේ ඕක කපන්න එපා කියලා. මම හැම තැනටම උත්තර බදින්න ඕන. වැඩිය ඕන නැහැ දැන් අනවසර වෙළදාම් කරනවා. එක පැත්තක් කියනවා. මේක අයින් කරන්න ඕන කියලා. එක පැත්තක් කියනවා. මේක තියෙන්න ඕන කියලා. ඇත්ත සාධාරණේ බලන කොට තරංග මන්ත්‍රීතුමා කියන එක හරි වෙන්න පුලුවන්. නමුත් මටයි පස්සෙ ප්‍රශ්න එන්නෙ. මෙතනදි මානුෂික හැඟීම් නෙවෙයි සභාවෙ නීතිය ක්‍රියාත්මක කරන්න ඕන.

මේ වෙන කොට ආදාහනාගාරය සම්බන්ධව ප්‍රියන්තා මන්ත්‍රීතුමිය කිව්වා. ක්ෂණිකව ඒ කටයුතු වුනේ. මෙන්න මේකයි හේතුව වුනේ. ආදාහනාගාරය ඉදිකිරීම ප්‍රගති සමාලෝචන රැස්වීම 2021.03.18 දින ගනු ලැබූ තීන්දු තීරණ දැනුම් දීම. ඒ අනුව එහිදී ලබාදුන් උපදෙස් හා නිර්ණායකයන් අනුව ලිපි ලේඛන හා ඇස්තමේන්තු නිවැරදිව සකස්කර අදාල නිර්දේශයන් සහිතව අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා කඩිනමින් මා වෙත යොමු කරන මෙන් ලිපියක් කොමසාරිස්තුමා එවලා තිබුණා. ඊට පස්සෙ රැස්වීමේ ගනු ලැබූ තීරණ ආදාහනාගාර ගොඩනැගිල්ල දහන කුටීරය විමිනිය ඇස්තමේන්තු සකස් කිරීම පළාත්පාලන දෙපාර්තමේන්තුව. ඒ ඒ ප්‍රාදේශීය සභාවේ යෝජිත භූමියේ, ආදාහනාගාර ඉදිකිරීමේදී, රැදවුම් බැම්,පැති බැම්,කානු පද්ධති,අභ්‍යන්තර මාර්ග වාහන නැවතුම් ස්ථාන, මුර කුටිය, ගේට්ටුව, මායිම් තාප්ප ආදිය ඉදිකිරීම ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරී විසින් ඇස්තමේන්තු හදන්න ඕන. ඒක ඉක්මනට ඕන. ඒ නිසා ඉක්මනට පාර හදන්න ඕන. ක්ෂණිකව කතා කරලා. මම ප්‍රියන්ති මන්ත්‍රීතුමියට කිව්වා. ඒක හොඳ දෙයක් නිසා පොඩ්ඩක් නැකතකුත් බලමු කියලා. ක්ෂණිකව කළා. කවුරුවත් දන්නෙ නැහැ. නැත්නම් ඔබතුමාල වරදවා හිතයි. ඒකයි මම පැහැදිලි කළේ.

ඊලගට ලක්ෂ 100 ක් ආවා. ඒ මුදලින් තල්ගස්වල ගොඩනැගිල්ලක් හදනවා. තවත් නොයෙක් නොයෙක් ඒවා වැඩ වෙනවා. නමුත් මම ඒක ෆේස් බුක් දාල එහෙම කරල නැහැ. ඇප්පොජ්වත්ත අයිතිය අපි ගන්නවා. මැණුම් කටයුතු සඳහා රුපියල් පනස් හතරදාහක් බැදල තියෙන්නෙ. අපි අපේ නැති අයිතීන් අපි අයිතිකරගෙන යනවා. මේවා කවුරුවත් හිටපු අය කළේ නැහැ. මේවා අපි ෆේස් බුක් දාල කරන්නෙ නැති නිසාද දන්නෙ නැහැ. මේ කට්ටිය අපි බාලයි කියන්නෙ. නමුත් මතක තියා ගන්න. මේ පුටුවෙන් බැහැල යන කොට මම යමක් කරපු සභාපති කෙනෙක් හැටියටයි යන්නෙ.

නැතුව මට මේකෙන් හම්බ කරන්නවත්, මේ පුටුවට මම කැමැත්තෙන්වත් නෙවෙයි. මම බයිසිකලේට කැමති පුද්ගලයෙක්. මම කැබ් එකේ යන්න එච්චර කැමති නැහැ. මට ප්‍රශ්නයක් නැහැ. මමත් මනුස්සයෙක් නිසා මටත් හැඟීම් තියෙනවා. අයුක්තිය අසාධාරණයට මම යටවෙන මිනිහෙක් නෙවෙයි. ඒක මේ නාගොඩවිතානලගෙ හැටි. ඒක නිසා මතක තියාගන්න. අර කවුද කියනව වගේ, කිව්වොත් අර ගස් බැදලා දෙන මිනිහෙක් මම. මොකද මේ භූමිය අපේ ලේවලින් හැදිල තියෙන්නෙ. අපේ බාප්පා, ලොකු තාත්තා, මාමණ්ඩි හිටියා. මම උඩින් පහත් වෙච්ච මිනිහෙක් නෙවෙයි. මේවයි සභාපතිකම් කළා. ඒ දවස්වල එයාල කරපුවා අපට දශමයක්වත් කරන්න බැහැ. මගේ පියාණන් කරපුවා මට දශමයක්වත් කරන්න බැහැ. එයාල ඉස්කෝල පන්සල් හදල දුන්නා. ඉගෙන ගන්න දරුවන්ට උදවු කළා. අපිත් ඒ වගේ තමයි. නමුත් මතක තියා ගන්න. මම මේ පුටුවට අගෞරවයක් කරන්නෙ නැහැ. මේ පුටුවට මම අගෞරවයක් කළොත්, මම වෙඩිතියාගෙන මැරෙනවා. මොකද මම හොඳ ලේ වලින් හැදිච්ච මිනිහෙක්. අපේ දෙමව්පියො හොඳ වැදගත් දෙමව්පියො. ඒ නිසා කිසි කෙනෙක් වරදවා හිතන්න එන්න එපා. මම අවංකව මේ කියන්නෙ. ඒ නිසා ආදරණීය ගරු මන්ත්‍රීතුමනි මගේ වේගවත් කතාවට සමාවෙන්න. මම එහෙම බාල ජාතියෙ වැඩ කරන මිනිහෙක් නෙවෙයි කියල මතක තියාගන්න. මේ පුටුවට ගරුත්වයක් කරනවා. මේ සභාවට ගරුත්වයක් හැටියට අපි ජීවත් වෙනවා. ඒ විදිහටයි අපි වැඩකටයුතු කරන්නෙ. මට සරමක් ඇඳගෙන යන්න පුලුවන්. සෙරෙප්පු දෙක නැතුව යන්න පුලුවන්. ඕන තැනක ගිහිල්ල මට කතා කරන්න පුලුවන්. බයට දුවන මිනිහෙක් නෙවෙයි මම. අපේ ජාතියවත් එහෙම නැහැ. ඒ නිසා මතක තියා ගන්න. ඒ කටයුත්තෙදි කවුරුවත් මට අසාධාරණ විදිහට කතා කරන්න එන්න එපා. මගේ වරදක් තියෙනවනම් කියන්න ඒ කියල මාව හදන්න එච්චරයි.

ගරු සමන් මන්ත්‍රීතුමා මගේ කිසිම අකමැත්තක් නැහැ. මම කැමතියි මොන්ටිසෝරි 100 ක් හරි මේ සභාව සතුව තියෙනවනම්. අපේ මොන්ටිසොරියක් කියලා අපට කියන්න පුලුවන්. අපිට තමයි වටිනාකම තියෙන්නෙ. ගරු මන්ත්‍රීතුමා, නමුත් මේකෙ අනාගතේ අපි අවශ්‍යතාවයන් දෙන්නෙ කරන්නෙ කොහොමද? ගරු මන්ත්‍රීතුමාලා දැන් වලකුඹුරෙ පෙරපාසලක් තියෙනවා. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාලගෙ ගමේ තියෙනවා. ඊලගට ගයාන් මන්ත්‍රීතුමාගෙ ගමේ එකක් තියෙනවා. මේ තියෙන ඒවත් සභාවට ගන්න කිව්වොත්? ප්‍රශ්න. මම මේ කියන්නෙ. මෙහෙමයි සමන් මන්ත්‍රීතුමා මට ඒක භාරගන්න බැරුව නෙවෙයි. ඊලගට අපට එන ප්‍රශ්න තමයි. දැන් අවශ්‍ය දේවල් එපයි කිව්වට අනිත් මොන්ටිසෝරි වලට දෙනවනම් ඇයි ඕකට නැත්තෙ? ඒකයි මම කියන්නෙ. අපට දැනට මේකෙ අපේ ඉන්න අයටත් දීගන්න බැරුව, අනිත් පෙරපාසල්වලට දෙන්නෙ කොහොමද? සමන් මන්ත්‍රීතුමා මම අවංකවම ප්‍රකාශ කරනවා මේක අපි සාධාරණව මේ කටයුත්ත කරමු. ඔය ප්‍රශ්නෙ වගේ තමයි ඊලගට අනිත් ප්‍රශ්නත් එනවා. ඒවටත් උත්තර දෙන්න ඕන. වැඩිය ඕන නැහැ. අර වෙරංග මන්ත්‍රීතුමාගෙ නඩුවෙ කතන්දරේ පූර්වාදර්ශ කියලා, ලක්රුවන් මන්ත්‍රීතුමාගෙ නඩුව තමයි එතුමා පෙන්වන්නෙ. දැන් ප්‍රාදේශීය සභාවෙ මොන්ටිසෝරිවල අර දරුවට ඇඳුම් දෙනවනම්, ඇයි අපේ දරුවට ඇඳුම් නැත්තෙ කියලා අහවි. දෙනවනම්, හැමෝටම දෙන්න ඕන නැත්නම් හොඳ නැහැ. අපට ඒක කරගන්න පොඩ්ඩක් අපහසුයි. නමුත් අපි කැමතියි. සමන් මන්ත්‍රීතුමා ඔයා මූලිකත්වය ගන්න. අපි කරන්න පුලුවන් උපරිමය කරන්නම්. අපේ අධීක්ෂණය යටතේ කරගෙන යමු. යථා කාලෙදි පවරා ගැනීමටත් කටයුතු කරන්නම්. සභාවේ යෝජනාවක් හැටියට ඉදිරිපත් වුනු මේ යෝජනාව අපි සාකච්ඡා කරලා යහපත් ප්‍රතිචාරයක් දක්වමු. සභාවට එන්නෙ අපිට මොනවත් ඕන නැහැ කියලා. මාසයක් වැඩකරන කොට දීමනාවක් ඉල්ලනවා. ඊට පස්සෙ ඔහොම ඔහොම තමයි යන්නෙ. සභාවට නැති අනිත් ඒවත් යොමු කරන්න. අපේ අධීක්ෂණය යටතේ පවත්වගෙන යමු. මට ප්‍රශ්නයක් නැහැ. මගේ අතින් වියදම් වෙන්නෙ නැහැ. නමුත් දෙයක් කරගන්න බැරි වුනොත් අපට බැනුම් අහන්න වෙන්නෙ. ගරු මන්ත්‍රීතුමා ඉදිරියෙදි කොට්ඨාසෙකට එක මොන්ටිසෝරියක් කියලා වැඩසටහනකුත් තියෙනවා.නමුත් ඕකෙ අපේ අධීක්ෂණය යටතේ කියල දාල ලියුම දෙන්නම්. ඒක

ප්‍රශ්නයක් නැහැ. බැරුව නෙවෙයි. මම ඉදිරිය දැකල මම මේ කතා කරන්නෙ. නැතුව වෙන එකකට නෙවෙයි.

ගරු මන්ත්‍රීවරුනි, අනතුරුදායක ගස් ඉවත් කිරීමේ කටයුත්තෙදි අපි බොහොම අසරණ වෙනවා. මම බලන්නෙ දෙපැත්තටම සාධාරනව කටයුතු කරන්න. නමුත් අපි අසරණ වෙනවා. එහෙමනම් මීට වඩා මම යමක් කියන්න යන්නෙ නැහැ. මම ගිය සැරේ කිව්ව වගේ කොරෝනා වසංගතය මේ වෙන කොට කෙමෙන් කෙමෙන් අප බල ප්‍රදේශයෙන් ඈත්වේගෙන යනවා. නමුත් ඒක අපි නිදහසට කරුණු කියල හිතන්න එපා. අපේ සියලු දෙනාම ඒ වසංගත තත්වයෙන් මිදිලා එලඹෙන අවුරුද්ද සෞඛ්‍ය නීති රීතිවලට ගැලපෙන ආකාරයට චාරිත්‍ර වාරිත්‍ර ඉටු කරලා. අපි අවුරුද්දෙන් පස්සෙ මේ වගේ සුහදව සාකච්ඡාමය හමු වීමකට බලාපොරොත්තු වෙමින්, සියලු දෙනාටම 2021 අප්‍රේල් අලුත් අවුරුද්ද වාසනාවන්ත, සුබම සුබ අලුත් අවුරුද්දක් වේවා. සියලු දෙනාටම යහපත් සෞඛ්‍ය තත්වයක් උඩ ඉදිරි අනාගතයට ගමන් කිරීමට වාසනාව ධෛර්යය ලැබේවා කියල ප්‍රාර්ථනා කරමින්, අද දින පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමන්ලාට ගරුත්වය පුද කරමින්, සභාවේ කටයුතු නිමා කරනවා.

සභාපති,<br>
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                    දිනය:-